රස කතා

රුසියන්
ගත්කරුවන් ගේ
ළමා කතා
එකතුවකි

රස කතා

රුසියන්
ගත්කරුවන් ගේ
ළමා කතා
එකතුවක්

සී/ස, ප්‍රගති ප්‍රකාශන නිවස

ISBN 978-955-1319-16-8

අනුවාදය : දූදිගම වි. රුද්රිගු

පරිගණක අක්ෂර සංයෝජනය : නිරූපමා සෙනරත්

නව සැකසුම : මාලක ලලනජීව

ප්‍රකාශනය

සී/ස, ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය අන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

මුද්‍රණය

Kanol PRINT

ප්‍රථම මුද්‍රණය 2009
දෙවන මුද්‍රණය 2016

19 වැනි ශතවර්ෂයේ සම්භාවනීය ගත්කතුවරුන්ගේ ළමා කතා මෙම සංග්‍රහයට අයත් වේ. රුසියානු මහා කවි ඇලෙක්සාන්ද්‍ර් පුෂ්කින්, රුසියන් වාග් විශේෂඥයෙක්, නාවිකයෙක්, යුද හමුදාවේ දොස්තර කෙනෙක්, දේශාටකයෙක් වන ව්ලදීමිර් දාල්, දාර්ශනිකයෙක් සහ සංගීතඥයෙක් වන ව්ලදීමිර් ඔදොයෙව්ස්කි, සම්භාවනීය ශික්ෂණ විද්‍යා විශේෂඥ කොන්ස්තන්තීන් උෂීන්ස්කි සහ තවත් අයගේ කෘති මේ පොතට ඇතුළු වේ. මිහයිල් ලෙර්මන්තව්, කොකේසියානු ජනකතා වටා ළමා කතා නිර්මාණය කළේ ය. ලේඛක - දේශාටක ඉන්ජිනේරු නිකොලායි ගාරින් කොරියන් ජනකතා තම කෘතිවලට පදනම් කරගත්තේ ය. නැගෙනහිර විචාර බුද්ධිය පිටිවහල් කරගෙන ලෙව් තෝල්ස්තෝයි සහ අලේක්සාන්ද්‍ර කුප්රින් කතා ලියුවෝ ය. මෙලෙස මේ කතා විවිධ වුව ද, ඒවා එක් හේතුවක් විසින් සමගි වෙයි. එනම් සත්‍යය, දයාව, ශ්‍රමයට ගරු කිරීම සහ සිය මව්බිමට ආදරය කිරීම විසිනි.

අලෙක්සාන්දර් පුෂ්කින්

ගසකි ඕක්, හරිත වර්ණ

හුදු වෙරළේ මහ විශාල
ගසකි ඕක්, හරිත වර්ණ
පණ්ඩිත තඩි බළල් රාළ
බැඳ ඇත යදමින් ස්වර්ණ
ගීත ගයයි ගස වටේට
යමින් වමෙන්,
කතා කියයි දකුණු දෙසට
යමින් සෙමෙන්.
වනේ ඉන්න වන යකා
කියයි පුදුම රස කතා
කිඳුරෝ ගස් උඩ නැගලා
පාර තොටක් නැත දකලා

කුකුළු පාද උඩ ගෙයක් ඇතේ
දොර ජනේල ගෙදර නැතේ.
වනයේ රුක් බොහොම ඇතේ.
අරුණෝදයේ රැල්ල සිප ගති වැල්ල
පාලු වෙලා ඇත රන් මුතු වෙරළ
රුසියන් වීරයෝ තිස් දෙන
මුහුදු සටන් කැරැ ජය ගෙන
එතැනය නැව් සෙන්පති තැන
කරලේවිච් කුජ දෙවියා
රජු පරදා ජය ගත්තා
මිනිසුන් වෙතට අහසින්
වනය හරහා මුහුද උඩින්
මායාකරුවා සැණෙකින්
ගෙනෙති යෝධයා විගසින්
බිම් ගෙයි ළතැවෙයි කුමරිය
වෘකයා දෙයි ඇයට දිරිය
බාබායිගා මහ යකින්න
වංගෙඩියට මෝලෙන් ඇන
වකුටු පයෙන් උඩ පැන පැන
ගුවනෙ පියාඹයි සතොසින
කෂෙයි යකා රන් ගොඩ උඩ
රුසියනුන්ට දීලා ඉඩ
කතාව අහලා මී පැණි බීලා
වෙරළේ ඕක් රුක දැකලා
ගස යට සිටි බළල් රාළ
දිග හැරියා කතා මල්ල.

සෙර්ගේයි අක්සාකව්

රතු මල හෙවත් පුංචි අලෝනාගේ කුසුම

ඒ කෝමත් එක රටක බොහොම පොහොසත් බොහොම ප්‍රසිද්ධ වෙළෙන්දෙක් වාසය කළා.

ඔහුගේ ධනය අති විශාලයි. ඔහු ළඟ ලෝකයේ නොයෙක් රටවලින් ගෙනා ඉතා වටිනා මැණික් සහ මුතු වර්ග තිබුණා. ඔහුගේ භාණ්ඩාගාරයේ ගොඩ ගසා තිබුණු රත්රන් සහ රිදී වල ප්‍රමාණය අති විශාලයි. මේ වෙළෙන්දාට දූවරුන් තුන් දෙනෙක් සිටියා. තුන් දෙනාම බොහොම ලස්සනයි. ඒ වුණාට වැඩියෙන්ම ලස්සන බාල දුව ය. මේ වෙළෙන්දා ඔහුට අයත් සියලු ධනයට වඩා වැඩියෙන් ආදරය කළේ දූවරුන් තුන්

දෙනාට ය. ඔහුගේ බිරිඳ මිය ගිය පසු ඔහු කණවැන්දුම් පුරුෂයෙකු බවට පත් වුණා. ඔහුගේ දූවරුනට ආදරය කිරීමට මෙය හේතුවක් විය. ඔහු වඩාත් වැඩියෙන් ආදරය කළේ බාල දුවට ය. මොකද දන්නවා ද, ඒ ළමයා තාත්තාට බොහොම ලොකු කරුණාවක් දැක්වූ නිසා.

දවසක් දා මේ වෙළෙන්දා පිට රටකට යන්ට ලැහැස්ති වුණා. ඒ රට පිහිටා තියෙන්නේ සාගරවලට, මූදුවලට ඈතින්. ගමනට සූදානම් වෙලා දූවරුනට කතා කරලා ඔහු මෙහෙම කිව්වා.

"මගේ ආදර දූවරුනි, මගේ කරුණාබර දූවරුනි, මගේ ලස්සන දූවරුනි, මම ඈත, බොහොම ඈත පිහිටි, සාගර සහ මුහුදුවලට එහා පිහිටි රටකට යන්නේ වෙළඳ කටයුතු සඳහා ය. මේ ගමන ගිහින් එන්ට බොහෝ කාලයක් ගත වීමට පිළිවනි. ඔයු ළමයින් තුන්දෙනාම බොහොම සමාදානයෙන් සහ සාමයෙන් සමගිව ඉන්ට ඕන. මා කියන ආකාරයට ජීවත් වුණොත් මම ඔය ළමයින්ට බොහොම වටිනා තෑගි බෝග ගෙනැවිත් දෙන්නම්. තම තමාට වුවමනා කරන තෑගි ගැන කල්පනා කරන්ට මම ඔබට දවස් තුනක් කල් දෙනවා. ඉන් පසුව ඔබට අවැසි තෑගි ගැන මට දන්වන්න."

තුන් දෙනාම දවස් තුනක් තිස්සේ කල්පනා කරන්නට පටන් ගත්තා. තුන්වැනි දවසෙදි තාත්තා දූවරුන්ට කතා කළා. "නුඹලාට වුවමනා තෑගි මොනවා ද?" කියලා ඇසුවා. වැඩිමහල් දුව තාත්තා ඉදිරියේ දණ ගසා මෙහෙම කිව්වා.

"තාත්තේ, මගේ රත්රන් තාත්තේ! රජකු වැනි පියාණනි! රිදී රත්තරන් වැඩ දමාපු ඉතා වටිනා රෙදි, කළු පැහැති සේබල් සතාගේ වටිනා ලොම්, ඉතාම වටිනා රතු මැණික් ආදිය මට එපා. දියමන්ති අල්ලාපු ඔටුන්නක් ගෙනෙන්න. පුන් සඳ වගේ දිලිසෙන, සූරියා වගේ කාන්තිමත්, රාත්‍රී කළුවර නැතිවෙලා රැය දහවල් මෙන් ආලෝකමත් වන දියමන්ති සහිත ඔටුන්නක් ගේන්න!"

අවංක වෙළෙන්දා කල්පනා කරලා මෙහෙම පිළිතුරු දුන්නා.

"මගේ ආදර, දයාබර දුවේ, මම ඔබේ ඉල්ලීම ඉටු කරන්නම්. එවැනි ඔටුන්නක් ගෙනෙන්නට පුළුවන් මිනිහෙකු ගැන මා දන්නවා. ඈත එක රජයක ඒ ඔටුන්න තියෙනවා, ගල් ගුහාවක. ඒ ගල් ගුහාව ලොකු ගල් පර්වතයක තමා තියෙන්නේ. රියන් තුනක් යට, යකඩ දොරවල් තුනක් සහ ජර්මන් යතුරු ඉබ්බො තුනක් දමාපු ගුහාවක් ඇතුළේ තමා ඔය අපූරු ඔටුන්න තබා ඇත්තෙ. එය ලබා ගැනීම ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. ඒ වුණත් මා සතු මහා ධනයට කළ නොහැකි වැඩක් නැහැ."

මද්දුම දුව පියාගේ දෙපා වැඳ මෙහෙම කිව්වා.

"තාත්තේ, මගේ රත්තරන් තාත්තේ! රජෙකු වැනි පියාණනි! රිදී රත්තරන් වැඩ දමාපු වටිනා රෙදි වර්ග, සයිබීරියාවේ සේබල් සතාගේ වටිනා ලොම්, දියමන්ති අල්ලපු ඔටුන්න ආදිය මට එපා. මට තෑගි වශයෙන් ගෙනෙන්න, නැගෙනහිර පළිඟුවලින් සාදපු ඉතා පිරිසිදු කැඩපතක්. එය දිහා බලන විට මගේ කන්‍යා භාවය සහිත රූ සපුව වැඩි විය යුතුයි. අන්න එම කැඩපත මට ගෙනැවිත් දෙන්න."

වෙළෙන්දා කල්පනා කරන්ට පටන් ගත්තා. ඔහු බොහෝ වේලාවක් කල්පනා කරලා මෙහෙම කිව්වා.

"මගේ දයාබර, ලස්සන, යහපත් දුවේ, මම ඔබට පළිඟු කැඩපතක් ගෙනැවිත් දෙන්නම්. එය පර්සියාවේ රාජ කුමාරිකාවකගේ මාලිගාවේ තියෙනවා. ඒ රජ කුමරිය තරුණයි. බොහෙම ලස්සනයි. එයාගෙ ලස්සන කටින් කියල, අතින් ලියලා, මේ තරම් යැයි වනලා විස්තර කරන්නට බැහැ. ඒ කැඩපත තියෙන්නේ ගලින් තැනූ මාලිගාවක. ඒ මාලිගාව ලොකු ගල් කන්දක් උඩ. රියන් තුන්සියක් විතර උසයි ඒ කන්ද. මාලිගාවේ යකඩ දොරවල් හතකි. මාලිගාවට යන මගෙහි පඩි තුන්සියක් විතර තියෙනවා. එක් එක් පඩියක් මුර කිරීමට පර්සියානු සෙබලු තුන්සිය දෙනෙක් ඉන්නවා. උන් වානේවලින් හදාපු අසිපත් අතින් ගෙන සිටිනවා. මෙම පළිඟු කැඩපත ලබා දිය හැකි මිනිහෙකු ගැන මම දන්නවා. ඔබේ ඉල්ලීම අක්කාගේ ඉල්ලීමට වඩා අමාරු අසීරු බව කියන්ට ඕන. ඒ වුණත් මගේ ධනය හා සම්පත්වලට කළ නොහැකි වැඩක් නැහැ."

බාල දුව තාත්තා ඉදිරියේ දණ ගසා මෙහෙම පැවසුවා.

"තාත්තේ, මගේ රත්තරන් තාත්තේ, මගේ ආදර පියතුමනි, රජතුමනි! ඔබතුමා මට ගෙනෙන්ට එපා, රිදී රත්තරන් වැඩ දමාපු වටිනා රෙදි පිළි, මට ඕන නැහැ. මැණික් සහ මුතු මාල, දියමන්ති ඔටුනු, පළිඟු කැඩපත්, ඔබතුමා මට ගෙනෙන්න මේ ලෝකයේ ඇති සියලු මල්වලට වඩා ලස්සන මල. රතු මල."

වෙළෙන්දා බොහොම බැරෑරුම් ලෙස කල්පනා කරන්ට වුණා. එයා බොහෝ වේලාවක් කල්පනා කළා ද, නැත්නම් අල්ප වේලාවක් කල්පනා කළාද කියලා කියන්ට බැහැ. ඔහු බාල දුව අමතා ආදරයෙන් මෙහෙම කිව්වා.

"පොඩි දුව අක්කලාගේ තෑගි වලටත් වඩා ගෙනෙන්ට අමාරු, බොහොම

අසීරු තෑග්ගක් ඉල්ලා තියෙනවා. මා නොදන්නා දෙයක් මම කොහොම ගෙනෙන්නට ද, කොහොම හොයන්නට ද? රතු මල ගෙනෙන්ට නම් ලෙහෙසියි. නමුත් එම කුසුම ලෝකයේ ඇති අනික් කුසුම් වලට වඩා ලස්සනයි කියල මා දැන ගන්නේ කොහොමද? මම උත්සාහ ගන්නම්. නමුත් තෑග්ග ගැන ස්ථිර බලාපොරොත්තු තබා ගන්ට එපා."

දූවරු තුන්දෙනා ඒ ගොල්ලන්ට අයත් මාලිගාවේ කාමරවලට ගියා. වෙළෙන්දා ඈත, ඈත රටවලට යාමට සූදානම් වුණා. ඔහු කොපමණ වේලා සූදානම් වුණාද කියා කියන්ට බැහැ. කටින් කතාව කීම නම් ලෙහෙසියි. වැඩ කිරීම නම් එහෙම ලෙහෙසි නැහැ. ඔහු සූදානම් වෙලා ගමන ආරම්භ කළා.

පිට රටවලත්, අපූරු රට රාජ්‍ය වලත් වෙළෙන්දා ගමන් කළා. ඔහු ඔහුගේ බඩු බාහිරාදිය තුන් ගුණයක් වැඩි මිලට විකුණලා, ඒ ඒ රටවල බඩු බාහිරාදිය තුන් ගුණයක් ලාබෙට මිලදී ගත්තා. ඔහු බඩු වර්ග වලට බඩු වර්ග මාරු කරලා රිදී සහ රත්තරන් මහ ගොඩක් සොයා ගත්තා. රන් පොලු නැව්වලට පටවලා ගෙදරට යැව්වා. ලොකු දුව ඉල්ලූ තෑග්ග - දියමන්ති ඔබාපු ඔටුන්න සොයා ගත්තා. එම දියමන්තිවල ආලෝකය නිසා රැය පවා දහවල් බවට පත් වෙනවා. ඊළඟට මද්දුම දුව ඉල්ලූ තෑග්ග. එනම් පළිඟු කැඩපත සොයා ගත්තා. එයින් අහස සහ වලාකුළු පෙනෙනවා. එය දෙස බලන කන්‍යාවකගේ රූපාලංකාරය වැඩි වෙනවා මිස අඩු වන්නේ නැහැ. පොඩි දුව ඉල්ලූ තෑග්ග, එනම් රතු කුසුම පමණක් සොයා ගන්නට බැහැ. මුළු ලෝකයේම ඇති සියලු මල්වලට වඩා ඉතාම ලස්සන මල එය විය යුතුයි.

වෙළෙන්දා රජවරුන්ගේ, මහරජවරුන්ගේ, සුල්තාන්වරුන්ගේ මාලිගාවලටයි, රාජකීය මල්වතුවලටයි ගිහිල්ලා ලෝකයේ ඉතාම ලස්සන රතු මල හොයන්ට පටන් ගත්තා. නමුත් හොයාගන්ට බැරි වුණා. ඒ මල්වතුවල ඇති මල්වල ලස්සන ගැන කටින් කියලා, අතින් ලියලා නිම කරන්ට බැහැ. ඒවා එතරම් මැ ලස්සනයි. එයාගේ බාල දූ ඉල්ලපු ලෝකයේ ඇති ඉතාම ලස්සන මල ඒවා අතර නැති බව ඔහුට සිතුණා. වෙළෙන්දා ඔහුගේ අවංක සේවකයින් සමග එකතු වී වැලි කතර හරහා, මහා මූකළන් කැලෑ හරහා යනවා. ඔහොම යන විට, ඔහු වෙත කඩා පැන්නා මහ භයානක පල් හොරු කණ්ඩායමක්. උන් අතර තුර්කියේ පල් හොරු සහ ඉන්දියාවේ පල් හොරු ආදිය සිටියා. ඇති වීමට යන මහා විනාශය වලක්වන්නට බැහැයි කියලා සිතූ වෙළෙන්දා තමාගේ ගැල් සහ බඩුත්, අවංක සේවකයිනුත් අත හැර දමලා පණ බේරා ගැනීමට මහ මූකලන් කැලෑවට වැදුණා. "වනයේ ඉන්න නපුරු වන සත්තු මාව කෑලි, කෑලිවලට

ඉරා දැමුවාවේ. කමෙක් නෑ! ඉතාම නපුරු භයනාක පල් හොරුන්ට යටත් වෙලා, ජීවිත කාලය පුරාම වහල් සිරකරුවෙකු වීම වඩාත් නරකයි." කියලා වෙළෙන්දා කල්පනා කළා.

ඉතින් වෙළෙන්දා කිසිම දවසක මිනිහෙක් පය නොතැබූ මහා මූකළන් කැලෑව ඇතුළට තනියම ගමන් කළා. කැළෑව මැදට යත්, යත්ම ගමන් මාර්ගය වඩාත් පැහැදිලියි. ගස් සහ පඳුරු ඔහුට ඉඩ දීලා මග පහදා දෙනවා වාගෙයි. පසුපස හැරිලා බැලුවා. ආපහු යන්ට බැහැ. වම් පැත්තේ ගොඩැලි සහ වලවල්. හාවෙකුට පවා යන්ට බැහැ. දකුණු පැත්තෙනුත් ඒ තරම්මැ අමාරු මාර්ග. ඉදිරියට යත්, යත්ම මාර්ගය ඉතාම හොඳයි. ඉතාම අපූරු යි. ලොකුම ලොකු හාස්කමක්. මග පැහැදිලියි, පිරිසිදුයි, ගමනට පහසුයි. කොටි වලසුන්ගේ බියකරු හඬත්, නයින්ගේ 'ෂූ' ශබ්දයත්, බස්සන්ගේ නාදයත්, කුරුලු හඬත් ආදිය ඇසෙන්නට නැත. ඔහු වටා හැම දෙයක්ම මිය ගිය හැඩකි. හිරු බැස ගියා. වනය අඳුරු වෙලා රෑ බෝ වුණා. ඇහැට ඇන්නත් නොපෙනෙන තරම් කලුවරක් තිබුණත්, ඔහුගේ දෙපා ළඟ ආලෝකයකි. ඔහු ඉදිරියට ගමන් කළා. දැන් මැදියම් රැයයි. ඔහුට ගිනිරත් ආලෝකයක් පෙනුණා. "මට පෙනෙන හැටිය කැලෑව ගිනි ගන්නා හැඩයි. එහෙනම් මා කුමට ද එම මරණය කරා යන්නේ, එය වැලැක්විය නොහැකි දෙයක් නොවේ ද?" ඔහු එසේ කල්පනා කළා.

ඔහු ආපස්සට යාමට උත්සාහ කළා. එහෙත් යා නොහැකියි. ඒ වගේම වමටත්, දකුණටත් යාමට නොහැකියි. ඉදිරියෙන් පමණක් පැහැදිලි පවිත්‍ර මාර්ගයක් තිබෙනවා. "මම එක තැනට වෙලා හිට ගෙන ඉන්නම්. එවිට ගිනි ආලෝකය එක්කෝ මා ළඟට නැවිත් අහකට යාවි, නැති නම් නිවී යාවි." කියලා වෙළෙන්දා කල්පනා කළා.

ඔන්න ඉතින් ඔහු නැවතී බලා ඉන්නවා. එහෙත් වෙළෙන්දා සිතූ දෙය නොවෙයි සිදු වුණේ. ගිනි ආලෝකය ඔහු පිළිගැනීමට මෙන් ඉදිරියට පැමිණියා. එවිට වෙළන්දාත් ඉදිරියට ගමන් කිරීමට ඉටා ගත්තා. දෙවරක් මිය යන්නේත් නැහැ. එක වරක් මරණය වලක්වන්නටත් බැහැ කියලා ඔහුට හිතුණා. ඔහු කුරුසියේ ලකුණ ඇඳගෙන ඉදිරියට ගමන් කළා. හරිම පුදුමයක්. හැබෑ හාස්කමක්. ඉදිරියට යන්ට, යන්ට ආලෝකය වැඩියි, ඒ වුණාට ගිනි දැල් පෙනෙන්නට නැහැ. ගින්නට හසු වී දර කෝටු ආදිය පුපුරන හඬක් නැහැ. වනය මැද පුංචි පිටියක්. එම පිටියෙහි ගෙයක් වත් මන්දිරයක්වත් නොවෙයි, ලස්සන රාජ මාලිගයක් තියෙනවා. ඒ මාලිග ාව හදලා තියෙන්නෙ රන් රිදී සහ මුතු මැණික් වලින්, දියමන්ති වලින්. ඒ මාලිගාවෙන් පිට වන රැස් තමා ගිනි ආලෝකයක් වගේ වෙළෙන්දාට

පෙනුණේ. හිරු බලන විට දෙනෙත් රිදෙනවා වගේම මේ රාජ මාලිගය දෙස බලන විටත් දෙනෙත් රිදෙනවා. මාලිගාවේ කවුළු සියල්ල ඇර ඇති අතර එයින් පිට වෙන සංගීතය ඉතාම මිහිරියි. ඉතාම ලස්සන යි.

රාජ මාලිගාවේ තැන්න විශාල යි. කඩොල්ල පුළුල්. මාලිගාව අවට සුදු පැහැති කිරි ගරුඬ. වටේටම ලොකු සහ කුඩා වතුර මල්. රතු පාපිසි සහිත පඩි පෙළක් දිගේ නැගලා තමා මාලිගාවට ඇතුළු විය යුත්තේ. පඩිපෙළ දිගට රනින් නිමවූ වැටකි. වෙළෙන්දා රාජ මාලිගාවේ ශාලාවට ඇතුළු වුණා. කිසිවෙක් නැහැ. දෙවැනි, තුන්වැනි ශාලාවලටත්, ඒ වගේම පස් වැනි, දස වැනි ශාලාවලටත් ගියා. කිසිවෙක් හිටියේ නැත. හැම තැනම බොහොම පිරිසිදුයි, පවිත්‍රයි. රාජ මාලිගය රන්, රිදී, මුතු මැණික්, ඇත් දළවලින් සරසා තියෙනවා.

සිතින් සිතාගන්ට වත් නොහැකි මේ මහා ධන සම්පත්තිය දුටු වෙළෙන්දා මවිතයෙන් මවිතයට පත් වුණා. රාජ මාලිගාවේ අයිතිකරුවා පමණක් නොවෙයි, මෙහෙකාර පිරිසවත් හිටියේ නැහැ. එ නමුත් සංගීතයට දිගට ම නොනවත්වාම ඇසෙනවා. "හැම දෙයක්ම හොඳට ඒ වුණාට කෑමට යමක් නැත. මට බඩගිනියි." කියලා වෙළෙන්දා සිතූ හැටියේම, ඔහු ඉදිරිපිට රස බොජුන්වලින් පිරුණු කෑම මේසයක් පහළ වුණා. රන් රිදී පිඟන් කෝප්ප, හැඳි ගෑරුප්පු, ඉතාම හොඳ වයින් වර්ග, මී පැණිවලින් හදාපු බීම වර්ග, පලතුරු ආදිය මේසය පුරා තියෙනවා. බියක් සැකක් නැතිව වෙළෙන්දා මේසයට වාඩි වෙලා හොඳට බඩ කට පුරා කාලා බීලා සතුටු වුණා. ඔහු පැය විසි හතරක් තිස්සේම බඩගින්නේ සිටි නිසාත්, කෑම වර්ග ඉතාම රසැති ප්‍රණීත ඒවා නිසාත්, ඔහු බොහොම කෑවා, බීවා. ආහාර දුන්නට ස්තුතිය පුද කරන්ට කිසිවෙක් හිටියේ නැහැ. ඔහු නැගිට හිටි විගසම කෑම මේසය එක වරම අතුරුදහන් වෙලා ආයෙමත් සංගීතය වාදනය කරන්නට පටන් ගත්තා.

මවිතයෙන් මවිතයටත්, පුදුමයෙන් පුදුමයටත් පත් වෙච්ච වෙළෙන්දා රාජ මාලිගාවේ ශාලාවෙන් ශාලාවට යමින් ඒවායේ ලස්සන බලමින් සතුටු වුණා. "දැන් ඉතින් හොඳට ගොරව ගොරවා නිදාගන්නට ඇත්නම්." කියලා සිතුවා විතරයි, ඔන්න ඔහු ඉදිරියේ අපූරු ලස්සන ඇඳක් පහල වුණා. රත්රන් කැටයම්වලින් නිමවූ ඒ ඇඳේ කකුල් පළිඟු කැටවලින් හදා තිබුණා. ඇඳට දාලා තිබුණේ, රිදී දැලක්. කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි බොහොම සිනිඳුයි. ඒවා හංසයින්ගේ පිහාටුවලින් පුරවා තිබුණා.

වෙළෙන්දා බොහොම සතුටින් ඇඳට නැගලා වැතිර ගත්තා. රිදී දැල සේද දැලක් වගේ මුදුයි, සිනිඳුයි. ඔන්න ඇඟිරි වැටෙන්නට පටන් ගත්තා.

නිදා ගැනීමට පහසු වන සංගීත වාදනයක් ඇසෙන්නට වුණා. "අනේ, දෙවියනේ මගේ දූලා තුන්දෙනාව මට හීනෙන්වත් දැකගන්ට ඇත්නම්." කියලා වෙළෙන්දා කල්පනා කරලා එක වරම සැප නින්දට වැටුණා.

හිරු වනයේ ගස්වලට ඉහළින් පෑව්වාටත් පසුව තමා වෙළෙන්දා අවදි වුණේ. නැගිටලා ඊයේ රෑ දුටු සිහිනය ගැන කල්පනා කරන්ට පටන් ගත්තා. මුළු රැය තිස්සේ ම වෙළෙන්දා තම දූ වරුන් සිහිනෙන් දකින්නට වුණා. එයා ගේ වැඩිමල් දුවයි, මද්දුම දුවයි බොහොම සතුටින් ප්‍රීතියෙන් ඉන්න සැටි දුටුවා. වෙළෙන්දා වැඩියෙන්ම ආදරය කරන බාල දුවට විතරක් බොහොම කණගාටුවෙන් හිටියා. ලොකු දුව සහ මද්දුම දුව සරණ පාවා ගැනීමට බොහොම පොහොසත් තරුණයෝ දෙදෙනෙක් ඇවිත්. ඒ දූලා දෙන්නා පියාගේ ආශිර්වාදය පවා ලබා ගන්නේ නැතිව විවාහ වීමට යන සැටි ඔහුට හීනෙන් පෙනුණා. පොඩි දුව විතරක් මනමාලයින් ගැන ඇසීමට පවා කැමති වුණේ නැහැ. තාත්තා එනතුරු ඒ වාගේ දේවල් ගැන සිතීමට පවා බාල දුව අකමැති වුණා. මෙම හීනය නිසා ඔහු බාල දුව ගැන කනගාටු වුණා.

ඇඳෙන් නැගිට්ට විගසම වෙළෙන්දාට පිරිසිදු ඇඳුම් සූදානම් වෙලා තිබුණා. පළිගු වීදුරු බේසමකට උල්පතකින් ජලය පිරුණා. ඔහු මුහුණ කට සොදාගෙන පිරිසිදු ඇඳුම් ඇඳගෙන කේක් කාලා කෝපි බිව්වා. ඊට පෙර දෙවියන් වැන්දා. ආයෙමත් වරක් මාලිගාවේ අලංකාර ශාලා බැලීමට ඔහු පටන් ගත්තා. හිරු රැස් තියෙද්දී මාලිගාවේ ලස්සන බැලීමට ඔහු ආශා කළා. දැන් ඔහුට පෙනෙන්නේ මාලිගාව ඊයේ තිබුණාටත් වැඩිය ලස්සනටයි. මාලිගා කවුළුවලින් පිටත බැලුවම රාජකීය මල්වතු, රාජකීය පලතුරු වතු ආදිය පෙනෙනවා. ඒවායේ ලස්සන කියලා නිම කළ නොහැකියි. මල්වල ලස්සන කටින් කියලා නිම කරන්ට බැහැ. මල්වතුවල ඇවිදින්නට ඔහුට ආශාවක් ඇති වුණා.

ලස්සන පාටවලින් යුත් කිරි ගරුඬ ගලින් හදාපු පඩිපෙළ ඔස්සේ පහළට බැස ගත් වෙළෙන්දා මල්වතුවලට ඇතුළු වුණා. මල්වර්ග, පලතුරු වර්ග දැකලා ඔහු කට අයාගෙන පුදුමයට පත් වුණා. සුවඳ විහිදෙනවා, බලන්නට බලන්නට ලස්සන වැඩි වෙන පාට වර්ග, මින් පෙර නොදුටු පක්ෂීන් ඉගිලෙනවා. උන් බොහොම ලස්සනයි. ඉතාම මිහිරි ගී සින්දු ගයන කුරුල්ලෝ හිටියා. ඉතාම උස මුදුන්වලින් උල්පත් ජලය විහිදෙනවා. ජල උල්පත් පිරිසිදු ලිං සහ ජලාශ වත්ත පුරා තියෙනවා.

වෙළෙන්දා පුදුමයෙන් පුදුමයට පත් වෙමින්, බොහොම මවිත වෙමින් පලතුරු වතු, මල් වතු බලමින් ඇවිදිනවා. ලස්සන ගී සින්දු අහනවා.

ඔහොම යනකොට, යනකොට ඔහුට පෙනුණා එක කොළ පාට මල් බඳුනක්. එහි තියෙනවා රතු පාට මලක්. ඒ රතු මල කොතරම් ලස්සනද කියනවා නම්, එතරම් ලස්සන මලක් මීට ඉස්සෙල්ලා තිබිලත් නැහැ. ඒ රතු මලෙහි ලස්සන කටින් කියන්නටත් බැහැ. වචනයෙන් විස්තර කරන්නටත් බැහැ. වෙළෙන්දාගේ සිත කය ප්‍රීතියෙන් පිනා ගියා. ඒ මලෙහි සුවඳ දසත පැතිරී යනවා. ඉතා අධික ප්‍රීතිය සහ සතුට නිසා ඔහුගේ අත් පා වෙවුලන්නට වුණා. ඔහු සොම්නසින් කෑ ගසුවා.

"මෙන්න මේ තමා ලෝකයේ ඇති ඉතාම ලස්සන රතු මල. මගේ ඉතාම ආදර බාල දුව ඉල්ලපු රතු මල."

මෙහෙම කියලා වෙළෙන්දා ඒ රතු මල කැඩුවා. ඒ මොහොතේ දී ඇඳිරි වලාකුළු නැතිව ම විදුලි කොටලා හෙණ හඬ ඇති වුණා. දෙපා ළඟ ඇති පොළව දෙබෑ වෙලා ඔහු ඉදිරිපිට රකුසකු වැනි මහා දූවැන්තයෙක් මැවී හිටියා. ඒ දූවැන්තයා වනයේ සතකුටවත්, මිනිහෙකුටවත් සමානයි කියලා කියන්නට බැහැ. ලොම් සහිත ඒ දූවැන්තයා ගොරෝසු හඬින් තර්ජනය කළා.

"නුඹ කළේ මොනවා ද? මගේ මල් වත්තේ මගේ අභය භූමියේ මගේ ඉතාම ආදර මල කැඩීමට නුඹ ඉදිරිපත් වුණේ මන් ද? මම මේ රතු මල මගේ දෙනෙත් වගේ ඉතා ආදරයෙන් ආරක්සා කළා. මම මේ රතු මල දෙස බල බලා හැමදාම සතුටු වුණා. නුඹ මගේ ජීවිතයේ ඇති එකම සතුට නැති කැරැ දැම්මා. මම නුඹව පිළිගත්තේ සුහද ආගන්තුකයෙකු හැටියට යි. මම නුඹට ඉතා රසැති ආහාර පාන දුන්නා. නුඹට නිදා ගැනීමට ඉතා ඉස්තරම් කොට්ට මෙට්ට, ඇඳ ඇතිරිලි ආදිය සපයා දුන්නා. මම නුඹට කළ උදව් උපකාරවලට නුඹ ප්‍රතිඋපකාර කළ සැටි යසයි නේද ? මම නුඹට ශාප කරනවා: නුඹ අකාලයේ මිය යනු ඇති....!"

හැම තැනම හිටිය වන සත්තු නපුරු ලෙස මෙසේ ම කියන සැටි වෙළෙන්දාට ඇසුණා.

"නුඹ අකාලයේ මිය යනු ඇති....!"

වෙළෙන්දා කොතරම් බය වුණාදයි කිව්වොත් ඔහුගේ දත් ඇඳි දෙක එකට ගැටෙන්නට පටන් ගත්තා. ඔහු වටපිට බැලුවා. හතරවටින්, ගස් පඳුරුවලින්, ජලයෙන් මහ පොළෙවෙන් නපුරු කුරිරු සත්තු පැනලා ඔහු වෙත එන සැටි තමා ඔහුට දකින්නට ලැබුණේ. එවිට වෙළෙන්දා අර දූවැන්තයාගේ දෙපා මුල දණින් වැටිලා මෙසේ කන්නලව් කළා:

"අනේ උත්තමයාණෙනි, වනයේ රජාණෙනි, සතුන්ගේ ප්‍රධානියාණෙනි,

ජලයට අරක් ගත් නායකයාණෙනි, මම ඔබතුමාට කෙසේ නම් ආමන්ත්‍රණය කරම් ද? ඔබතුමා මගේ ජීවිතය විනාශ නොකරනු මැනවි. මට ජීවිත දානය දෙන ලෙස අණ කරනු මැනවි. මට ඉතාම හොඳ ඉතාම ලස්සන දූලා තුන් දෙනෙක් ඉන්නවා. මා ඔවුනට තෑගි තුනක් ගෙනෙන බවට පොරොන්දු වුණා. ලොකු දුවට දියමන්ති අල්ලාපු ඔටුන්නක් හොයා ගත්තා. මද්දුම දුවට පළිඟු කැඩපතක් සොයා ගත්තා. මගේ ආදර පොඩි දුවට මේ ලෝකයේ ඇති ඉතාම ලස්සන රතු මල සොයන්ට පටන් ගත්තා නමුත් හොයාගන්ට නොහැකි වුණා. එතකොට තමා මේ මල් වත්තට ආවේ. මෙහිදී මා දුටුවා මේ ලෝකයේ ඇති ඉතාම ලස්සන රතු මල. මේ ලෝකයේ ඉන්නා වූ ඉතාම බලගතු, ඉතාම පොහොසත්, ඉතාම කීර්තිමත් ඔබතුමාගේ මේ මල්වත්තේ ඇති රතු මල කඩාගෙනැ එය මගේ ආදර බාල දුවට තෑගි කිරීමෙන් ඔබ තුමාට පාඩුවක්, හානියක් වෙතියි කියලා මා සිතුවේ නැත. මා කළ වරද නිසා මා ඔබතුමාගෙන් සමාව ඉල්ලා හිටිනවා. මෝඩයෙකු වන මට සමා වෙලා මට ගෙදර යාමට ඉඩ දෙන්න. මම ඉතාම ආදරය කරන පොඩි දුවට මේ රතු මල තෑගි කිරීමට මට අවසර දෙන්න. ඔබතුමා ඉල්ලන තරම් රන් මිල ගෙවීමට මම සූදානම්."

වෙළෙන්දාගේ මේ කතාව අසාගෙන හිටිය මුළු මහත් කැලෑවම මහ හඬින් සිනාසුණා. රකුසකු වැනි දූවැන්තයා මෙසේ කිව්වා:

"මට ඕන නැහැ නුඹේ රන් මිල. මා ළඟ තිබෙන මහා ධනස්කන්ධය වියදම් කරන හැටි දන්නේ නැතිවයි මා ඉන්නේ. මම නුඹට පොඩ්ඩක්වත් අනුකම්පා කරන්නේ නැහැ. මගේ සේවකයෝ නුඹව කැලිවලට තු, තු කොටැ ඉරා දමාවි. නුඹට ගැලවීමට එකම මාර්ගයක් තියෙනවා. මම නුඹට ගෙදර යාමට ඉඩ දෙන්නම්. නුඹට රන් මිලත් දෙන්නම්. රතු කුසුමත් නුඹටම තෑගි දෙන්නම්. හැබැයි එක පොරොන්දුවක් දිය යුතුයි. ඒ පොරොන්දුව නම් මෙයයි: නුඹගේ ලස්සන සුහද දූවරුන්ගෙන් එක් කෙනෙකුව මා වෙත එවිය යුතුයි. මම ඇයට කිසිම හිරිහැරයක් හෝ කරදරයක් හෝ කරන්නේ නැති බවට පොරොන්දු වෙන්නම්. නුඹ මගේ මේ මාලිගාවේ හිටියා වගේම ඇයටත් ඉතා සැප පහසු ලෙස ජීවත් විය හැකියි. මට තනිවම ඉඳල දූන් එපා වෙලයි තියෙන්නෙ. නුඹගේ දුව මගේ සගයා විය යුතුයි."

ඔන්න එවිට වෙළෙන්දා බිම වැතිර දුක් කඳුළු වගුරවමින් අඬා වැලපෙන්නට පටන් ගත්තා. ඔහු මහා දූවැන්තයා දෙස බලා ඔහුගේ දූවරුන් තුන්දෙනා ගැන කල්පනා කරන්ට පටන් ගත්තා. මේ ඉතා භයානක දූවැන්තයා බොහොමත්ම අවලස්සනයි. ඔහොම බොහෝ වේලාවක් කඳුළු වගුරවමින් අඬා වැලපිලා වෙළෙන්දා අන්තිමේ දී මෙසේ කියුවා:

"අනේ උත්තමයාණෙනි, වනයේ රජාණෙනි, සතුන්ගේ ප්‍රධානියාණෙනි, මගේ ඉතා හොඳ, ඉතා ලස්සන දූවරුන්ගෙන් එක් කෙනෙක්වත් ඔබතුමා ළඟට පැමිණීමට අකමැති වුවොත් මා කුමක් කරම් ද? ඔවුන්ගේ අත් පා බැඳ ඔවුන් ඔබතුමා ඉදිරියට ගෙනෙන්නට බැහැ නොවේ ද? ඇරත් මම ඔබතුමා වෙත නැවතත් එන්නේ කිනම් මාර්ගයක් ඔස්සේ ද? මම ඔබතුමා වෙත පැමිණීමට අවුරුදු දෙකක්ම ගත කළා. මම ගමන් ගත් රට රටවල් සහ මාර්ග මං මාවත් ගැන මට මතක නැත."

එවිට මහා දූවැන්තයා වෙළෙන්දාට මෙසේ පැවසුවා.

"මම කැමති නැහැ, බලාත්කාරයෙන් දූවරුන්ව මෙහෙට ගෙන්වා ගැනීමට. ඔවුන්ගෙන් එකියක් හෝ නුඹට ඇති ආදරය නිසා, ඇගේ කැමැත්ත සහ ආශාව අනුව මෙහෙ පැමිණියා දෙන්. නුඹේ දූවරුන්ගෙන් එකියක් හෝ මෙහෙ ආවේ නැතිනම් නුඹ මෙහාට පැමිණිය යුතුයි. මම එවිට නුඹට ඉතාම භයානක දඬුවම් දීලා නුඹව මරණයට පත් කරනවා. මම නුඹට මගේ පේරුස් මුද්ද දෙන්නම්. එය සුළැඟිල්ලේ දමා ගන්නා ඕනෑම කෙනෙක් ඉන් පසු තමාට යා යුතු තැන ගැන කල්පනා කළ විගස ඇසිපිය හෙලන්නටත් පෙර එයා එහි යනු ඇති. නුඹේ දූවරුන් දැක ගැනීමට මම නුඹට දහවල් තුනක සහ රාත්‍රී තුනක කාලයක් දෙනවා."

වෙළෙන්දා බොහොම කල්පනා කරලා, කල්පනා කරලා මෙලෙස තීරණය කළා: "මට වැඩියත් හොඳයි මගේ දූවරුන් තිදෙනා දැකලා ඔවුනට මගේ පිතෘ ආශිර්වාදය කිරීමට ඉඩ තිබේ නම්. ඔවුන් අකමැති නම් මාව මරණයෙන් බේරා ගැනීමට, මගේ යුතුකම අනුව මම මේ භයනාක දූවැන්ත රකුසා හමු වෙලා මරණයට කැප වෙමි." ඔහු බොරු කීමට කල්පනා කළේ නැහැ. ඔහු අදහස් කළ දේ ඔහු එළිපිට කියුවා. මහා දූවැන්තයා ඒ ගැන ගුප්ත බලයෙන් දැන සිටියා. වෙළෙන්දාගේ අවංක හැඟීම් පසක් කැර ගත් මහා දූවැන්තයා ඔහුගෙන් පොරොන්දු ගිවිසුමක් නැතුවම ඔහු නිදහස් කැර හැරියා. දූවැන්ත රකුසා තමාගේ පේරුස් මුද්ද ගලවාලා එය වෙළෙන්දාට දුන්නා.

වෙළෙන්දා ඒ පේරුස් මුද්ද පුංචි ඇඟිල්ලට දැමූ විගසම ඔහු ඔහුගේ රටේ, ඔහුගේ මන්දිරයේ ගේට්ටුව ළඟට ම ආවා. එවිටම ඔහුට අයත් ගැල්, රත්රන් සහ අනිකුත් බඩු බාහිරාදිය ඉස්සරටත් වැඩිය, තුන් ගුණයකින් වැඩිය පුරවාගෙන ඔහුගේ මන්දිරය ළඟට ම එමින් සිටියා. මන්දිරයේ සිටි අය කලබල වුණා. දූ වරු තුන් දෙනා රනින්, රිදියෙන් සහ සේදවලින් කළ තුවා ආදිය රැගෙන පියතුමා පිළිගැනීමට ඉදිරියට ආවා. පියතුමාව සිපගෙන

ඔහුට ආදරයෙන් කතා කිරීමට පටන් ගත්තා. ලොකු දුවයි, මද්දුම දුවයි, බාල දුවට වැඩිය බොරු දයාවක් මවා පාගෙන කතා කළා. තාත්තා ලොකු දුකකින් පසුවන බවත්, ඔහු සිතෙහි ඇති කිසියම් රහසක් හෙළි නොකරන බවත් පෙනෙන්ට තිබුණා. ලොකු දුවයි, මද්දුමයයි තාත්තා දුක් වෙන්නේ වස්තුව නැතිවුණු නිසාද කියලා ඇසුවා. පොඩි දුව වස්තුව ගැන ඇසුවේ නැහැ. ඕ තාත්තාට මෙසේ තෙපලා.

"මට තාත්තාගේ වස්තුවෙන් පලක් නැත. වස්තුව හරි හම්බ කරගන්ට පුළුවනි. තාත්තාගේ සිතට දුක් දෙන රහස මට හෙළි කරන්ට."

තාත්තා දූවරුන්ට කතා කරලා මෙසේ පැවසුවා.

"මා සතු අති විශාල ධන සම්පත් මා නැති කැරැ ගත්තේ නැහැ. මගේ ධනය තුන් හතර ගුණයකින් වැඩි වෙලා. මගේ සිතට තද දුකක් ඇති කරුණක් තියෙනවා. ඒ ගැන මම නුඹලාට හෙට කියන්නම්. අද අපි ප්‍රීති වෙමු."

යකඩ යතුරු ඉබ්බා දමූ පෙට්ටිය ගෙනෙන ලෙස වෙළෙන්දා අණ කළා. ලොකු දුව ඉල්ලපු තෑග්ග, එනම් දියමන්ති අල්ලාපු ඔටුන්න එළියට ගත්තා. එය රනින් සාදපු එකක්. ඒ රන් ගින්නට පිළිස්සෙන්නේ නැහැ. දියමන්ති දිලිසෙනවා. මද්දුම දුව ඉල්ලූ තෑග්ග, එනම් පළිගු කැටපතත් එළියට ගත්තා. පොඩි දුවගේ තෑග්ග රත්රන් බඳුනක ඇති රතු මල සහිත පැලයත් ගත්තා. ලොකු දුවයි, මද්දුම දුවයි බොහොම ප්‍රීති වෙලා තාත්තා දුන් තෑගි අරගෙන මන්දිරයේ තමන්ගේ කාමරවලට වැදිලා සිත පුරා සතුටු වෙමින් කෙළි සෙල්ලම් කළා. එනමුදු පුංචි දුව පමණක් බොහොම දුකෙන් සහ කණගාටුවෙන් වැලපෙන්නට වුණා.

එවිට තාත්තා දුවට ආදරයෙන් කතා කළාඃ

"මගේ ආදර පුංචි දුවේ, ඔබ ඉල්ලූ තෑග්ග මම ගෙනාවා. ඇයි ඔබ ලෝකයේ ඉතාම ලස්සන මේ රතු මල නොගන්නේ ?"

පුංචි දුව එම තෑග්ග බාර ගත්තෙ ලොකුම අසතුටකිනි. ඈ තාත්තාගේ අත සිප ගත්තා. කඳුළු වගුරවමින් අඬන්ට වුණා. ලොකු දුවයි, මද්දුම දුවයි ආවා තාත්තා ළඟට. ඒ දෙන්නා තෑගි නිසා බොහොම සතුටු වෙලා. හතර දෙනාම කෑම මේසයට වාඩි වෙලා ඉතාම රස බොජුන් වැළඳුවා. මී පැණි බිව්වා. ප්‍රීති කතා කියාලා සතුටු වුණා.

හවස් වුණ හැටියේ ම වෙළෙඳ මන්දිරයට සතර වටින් අනික් වෙළෙන්දෝ, නෑ මිතුරෝ එන්ට පටන් ගත්තා. පිනට කන බොන අයත් ඔවුන් අතර හිටිය බව කිව යුතුයි. භෝජන සංග්‍රහය රෑ බෝ වන තුරුම

පැවතුණා. නමුත් මහා ධනවත් වෙළෙන්දා තමාට මූණ පෑමට ඇති ඉමහත් අවාසනාව ගැන කාටවත් කිව්වේ නැහැ. රන් රිදී වටිනා බඩු වර්ග, ඉතා වටිනා දුර්ලභ දේවල්, රසැති ආහාර පාන ආදී බොහෝ දේ වෙළෙන්දාගේ ගෙදර රැස් කර තිබුණා.

පසු දා වෙළෙන්දා ලොකු දුව ගෙන්වා සිදු වුණ දේ ඇයට ඉතා හොඳින් විස්තර කළා. පියාගේ මරණය පතනවා ද, නැතිනම් මහ වනයේ බියජනක රකුසු දෑවැන්තයා සමග ජීවත් වීමට එහි යන්ට කැමතිද කියලා ඔහු ඇගෙන් ඇසුවා.

ලොකු දුව පියා මරණයෙන් බේරා ගැනීමට කොහෙත්ම කැමති වුණේ නැහැ. ඈ ඔහුට මෙහෙම කියුවා.

"තාත්තා රතු මල ගෙනාවේ කොයි දුවට ද, ඒ දුව තමා දෑවැන්තයා ළඟට යන්ට ඕන."

ඊළඟට මද්දුම දුව ගෙන්වලා සිදු වුණ දේ ඇයට ඉතා හොඳින් විස්තර කළා. පියාගේ මරණය පතනවා ද, නැතිනම් මහ වනයේ බියජනක දෑවැන්තයා සමග ජීවත් වීමට කැමතිද කියලා ඔහු ඇගෙන් ප්‍රශ්න කළා.

මද්දුම දුවත් පියා මරණයෙන් බේරා ගැනීමට කොහෙත්ම කැමති වුණේ නැහැ. ඇයත් තාත්තාට කියුවේ අක්කා කී ආකාරයට මයි.

"තාත්තා රතු මල ගෙනාවේ කොයි දුවට ද අන්න ඒ දුව තමා දෑවැන්ත රකුසා ළඟට යන්ට ඕන."

ඊළඟට තාත්තා පොඩි දුවට කතා කරලා මහ වනයේ දී සිදු වූ දේ ඉතා හොඳින් විස්තර කළා. තාත්තා විස්තරය අවසන් කරන්ටත් ඉස්සර වෙලා ඔහුගේ ආදරය දිනා ගත් පුංචි දුව මෙහෙම කියුවා:

"මට ආශිර්වාද කරන්න, මගේ ආදරණීය පියතුමෙනි. මම මහා වනයට ගිහිල්ලා ඒ මහා භයානක දෑවැන්තයා සමග වාසය කරන්නම්. ඔබතුමා රතු මල කඩන්ට ගිහිල්ලා තමා මේ සියල්ල සිදු වුණේ. මම ඔබතුමාව බේරා ගන්නම්."

තාත්තාගේ දෑසට කඳුළු උනන්ට වුණා. ඔහු කුඩා දුව බදාගෙන සිපගෙන මෙහෙම පැවසුවා:

"මගේ ඉතාම ආදර පුංචි දුවේ, මගේ රත්තරන් පුංචි දුවේ, නුඹට දෙමාපියන්ගේ ආශිර්වාදය මම ප්‍රදානය කරනවා. පුංචි දුවේ, නුඹ පියාව ඉතා බියජනක මරණයෙන් බේරාගෙන, මහා වනයේ භයානක දෑවැන්තයා ළඟට තනි කැමැත්තෙන් ගිහිල්ලා එහි වාසය කිරීමට තීරණය කිරීමට නිසා නුඹට දේවාශිර්වාදය පතනවා. පොඩි දුවට ඔහුගේ මාලිගාවේ ඉතා

පොහොසත් ලෙස විශාල නිදහසක් භුක්ති විඳීමට පුළුවන්. කිසිවෙක් දන්නේ නැහැ එම මාලිගය තියෙන්නේ කොහේද කියලා: එම මාලිගයට යන පාර මිනිසුන්වත් වන මෘගයින්වත් පියාඹන පක්ෂීන්වත් දන්නේ නැත. පොඩි දුව ගැන අපට කිසිම තොරතුරක් නොලැබෙන අතර ඔබටත් අපේ ආරංචි කිසිවක් නොලැබෙනු ඇති. පොඩි දුවගේ ආදර සංග්‍රහ නැතිව මා මගේ අවසාන දවස් කෙසේ නම් ගෙවන්ට ද? මම මගේ ඉතා ආදර පුංචි දුවගෙන් සදහටම වෙන් වෙනවා. හරියටම මගේ පුංචි දුවව පණ පිටින් වළලා දමනවා වගෙයි."

එවිට පොඩි දුව තාත්තාට මෙසේ තෙපළා:

"මගේ දයාබර රත්තරන් තාත්තේ, අඬන්ට එපා. මම මහා වනයේ භයානක රකුසු දූවැන්තයාගේ මාලිගාවේ ඉතා සැපෙන් නිදහස් ලෙස වාසය කරන්නම්. ඔහුට මම අවංකව සහ විශ්වාසවත් ලෙස සේවය කරන්නම්. සමහර විට අපට මේ ප්‍රශ්නය නිසි ලෙස බේරා ගන්ට පුළුවන් වේවි. මා මළැයි කියලා මාව දූන්ම වළලා දමන්ට එපා. දෙවියන්ගේ පිහිටෙන් මට ඔබ තුමා වෙතට පැමිණීමට ඉඩ ලැබේවි!"

වෙළෙන්දා අඬනවා. වැලපෙනවා. පොඩි දුවගේ කතාව නිසා ඔහුට සැනසෙන්නට බැහැ.

ලොකු අක්කයි මද්දුම අක්කයි ඇවිත් පොඩි නංගිව බදා අඬන්ට පටන් ගත්තා. මුළු ගෙදරම අඬන්නට පටන් ගත්තා. පොඩි නංගී විතරක් අඬන්නේ නැතිව, වැලපෙන්නේ නැතිව ගමනට අවැසි දේ පිළියෙල කරන්ට පටන් ගත්තා. රත්රන් මල් බඳුනේ සිටුවා තිබෙන රතු මල් පැලයත් ගෙන යාමට පොඩි දුව තීරණය කළා.

දවස් තුනක් සහ රෑ තුනක් මෙහෙම ගත කරලා වෙළෙන්දාට තමාගේ ඉතාම ආදර පොඩි දුවගෙන් වෙන් වීමට කාල වේලාව පැමිණියා. තාත්තා පොඩි දුවව බදා වැළඳගෙන, කඳුළු වගුරුවා අඬලා ඇයට ආශිර්වාද කළා. මහා වනයේ භයානක රකුසු දූවැන්තයාගේ පේරුස් මුද්ද ඇගේ පුංචි ඇඟිල්ලට පැළඳුවා. එවිටම වාගේ පොඩි දුවයි, එයාට අයිති බඩු මූට්ටු සියල්ලමයි එකවර අතුරුදහන් වුණා.

මහා වනයට සහ සාගරයට අධිපති දූවැන්තයා ගේ මහා මාලිගයේ නිදන කාමරයට එක වරම පොඩි දුව ආවේ එයාගේ බඩු බාහිරාදියත් සමග ය. රන් කැටයම් සහ පළිඟු වීදුරු කකුල් සහිත ඇඳක් ඒ කාමරයේ විය. හංසයින් ගේ පිහාටු පුරවා සාදන ලද කොට්ට සහ සේද ඇඳ ඇතිරිලි එහි තිබුණා. පොඩි දුව මේ නිදන කාමරයේ හැමදාම ජීවත් වුණු සැටියක් ඇයට

දැනිණි. ඇයට කිසිම දාක ඇසීමට නොලැබුණු සංගීත වාදනය ඉබේටම පටන් ගත්තා. එය ඉතාම මිහිරියි.

පොඩි දුව රාත්‍රී නින්දෙන් පසු අවදි වුණා. ඇය ගෙනා සියලු බඩු බාහිරාදිය එහිම තියෙනවා. රත්රන් මල් බඳුන සහ රතු මලත් එතැනම තිබුණා. ඒ ශාලාවේ සියලු බඩු බාහිරාදිය හොඳට තබා ඇත. එහි ඇඳීමට අවශ්‍ය ඇඳුම් වර්ග ආදියත් නිසි ලෙස තබා තිබෙන සැටි ඈ දුටුවා. එහි එක බිත්තියක් මූණ බලන කැඩපතක් වගේ ය. අනික් බිත්තිය රත්රන්වලින් සාදලා ය. තෙවැනි බිත්තිය රිදීවලින් සහ සතරවැනි බිත්තිය ඇත්දළවලින් නිම වී ඇත. මේ බිත්තිවලට ඉතා ලස්සන මැණික් සහ මුතු වර්ග ඔබා තිබෙන සැටිත් ඇයට පෙනිණි. "එහෙනම් මේ මාලිගා කාමරය මගේ යහන් ගැබ විය යුතුයි." කියලා ඕ සිතුවා.

ඇයට මාලිගාවේ සියලු ශාලා බැලීමට ආශාවක් ඇති වුණ නිසා ඈ ශාලාවක් පාසා යමින් ඒවා හොඳට බලන්නට වූවා ය. එක් ශාලාවක් අනිකට වඩා ලස්සනයි. ඇගේ ආදරණීය පියා විස්තර කළ ආකාරයට ම එම මාලිගාව ඉතා ලස්සන එකක් විය. ඈ රන් බඳුන සහ රතු මලත් ඇරගෙන මල් වත්තට ගියා. එවිට ඉතා ලස්සන, මිහිරි ගීතයන් ගායනා කළේ කුරුල්ලන් ය. සියලු ගස් සහ පඳුරු ඇයට නමස්කාර කරන්නාක් මෙන් අතු අග මුදුන්වල ඉති වැනූ සැටි ඇය දුටුවා. ජල උල්පත්වලින් ඉතා උසට ජලය විහිදී යමින් තිබුණා. ලෝකයේ ඉතාම, ඉතාමත්ම ලස්සන රතු මල කඩාපු ස්ථානයට ගොස් ඈ තාත්තා ගෙනා ඒ මල එතැනම තැබීමට සැරසෙත්ම, එය ඉබේටම ඉගිලී ගොස් එම පැලය බද්ධ වී වඩාත් ලස්සන වුණා.

ඉතාම ලස්සන, ඉතාම අරුම පුදුම රතු මල නිසා බොහොම සතුටට පත් වුණු පොඩි දුව ඇය නැවතී සිටින මාලිගාවට ගියා. "මහා වනයට අධිපති දැවැන්තයා මා කෙරෙහි කෝප නොවී, මට අනුකම්පා කරන ස්වාමියෙක් වෙනවා ඇතැ" යි කල්පනා කළ විගසම කිරි ගරුඬ බිත්තිය විනිවිද ගිනි සිළුවලින් ලියැවුණු මෙවැනි වචන ඇයට කියවීමට ඉඩ ලැබුණා:

"මම ඔබේ ස්වාමියා නොවෙයි, කීකරු වහලා. තී මගේ ස්වාමි දුව, තිට සිතෙන ඕනෑම දෙයක් මට අණ කරව. මම එම අණ ඉටු කරන්නම්."

ඒ ගිනි සිළු වැනි වචන කියැවූ විගස, ඒවා එම කිරි ගරුඬ බිත්තියෙන් අතුරුදහන් වුණා. තාත්තාට තමා ගැන දන්වන්ට ඕනැයි කියලා ඇය කල්පනා කළා විතරයි, ඇය ඉදිරියේ කඩදාසි, රත්රන් පෑනක් සහ තීන්ත කුඩුවක් මැවුණා. ඈ තාත්තාටත් අක්කලා දෙදෙනාටත් ලියුමක් ලියුවා.

"ඔබ හැම දෙනාම කණගාටු නොවන්න. දුක් නොවන්න. මහා වනයට

අධිපති මහා දෑවැන්තයාගේ මාලිගාවේ මා වාසය කරන්නේ රජ කුමරියක් වගේ ය. මම ඔහු දැක නැත්තෙමි. නමුත් ඔහු ගිනි රත් පැහැයෙන් කිරි ගරුඬ බිත්තියේ ඔහුගේ අදහස් ලියා මට දන්වයි. මා සිතන, පතන හැම දෙයක්ම ඔහු මට ඉටු කර දෙනවා. ඔහු මගේ ස්වාමියා වීමට කැමති නැහැ. මා ඔහුගේ ස්වාමි දුව බව ඔහු කිව්වා."

ඈ එම ලියුම ලියලා එයට තමාගේ අත්සන තැබූ විගසම, ඒ ලියුම අතුරු දහන් වුණා. පෙරටත් වඩා ලස්සන සංගීතයක් වාදනය වුණා. ඉතා රසැති කෑම බීම මේසයට වැඩියා. රත්රන් වැඩ දමාපු පිඟන් කෝප්ප ආදිය මේසය මත තිබුණා. ඇය මීට පෙර තනිවම කෑමට වාඩිවෙලා නැහැ. ඈ කෑම කාලා බීම බීලා සංගීත වාදනයට සවන් දුන්නා. දවල් ආහාරයෙන් පසුව ඈ පොඩ්ඩක් නිදා ගැනීමට සෝපාවේ වැතිර ගත් සැටියේ ම නිදිමත හැදෙන ඉතා මිහිරි සංගීතයක් වාදනය වුණා.

දහවල් නින්දෙන් පසුව වෙළෙන්දාගේ පොඩි දුව මල්වතුවලට ඇවිදින්නට ගියේ ඇයට එයින් අඩක් වත් බලා ගැනීමට බැරිවුණු නිසා ය. ඇය ඉදිරියේ සියලු ගස්වැල් නමස්කාර කළා. හොඳට ඉදුණු පලතුරු වර්ග ඇයට කඩා ගෙන කෑමට ඉඩ දෙන්නාක් වගේ ඉදිරියට නැමිලා සිටියා. හොඳට ඇවිදලා, හවස ඇඳිරිය වැටෙන විට ඈ යළිත් මාලිගයට ආවා. එවිට රෑ කෑමට ආහාර පිළියෙල කැරූ මේසය සූදානම්, ඉතාම රසැති ආහාර වර්ග එහි තිබුණා.

රාත්‍රී ආහාරයෙන් පසු ඈ ගියා කිරි ගරුඬ බිත්තිය ළඟට, එහි ලියා තිබුණා. මෙවැනි වැකියක් :

"මගේ මල්වතු සහ මාලිගා කාමර නිසාත්, ආහාර පානාදිය නිසාත් ස්වාමිදුව සතුටින් ඉන්නවා ද?"

වෙළෙන්දාගේ පොඩි දුව මිහිරි ලෙස කියුවා:

"ඔබ මට ඔබේ ස්වාමිදුව කියා නොකියනු මැනවි. ඔබ හැමදාම මගේ ගුණවත් ස්වාමියා ය. ඔබ යහපත් ය. ගුණවත් ය. මම ඔබේ තීරණවලට අකීකරු නොවෙමි. ඔබේ ආදර සංග්‍රහයට මම කෘතඥ වෙමි. ඔබේ මාලිගා ශාලා සහ මල් වතු තරම් ලස්සසන දේ තවත් මේ ලෝකයේ නැති තරම් ය. මා ඔබ නිසාත් සතුටු නොවී ඉන්නේ කෙසේ ද? මගේ උපන් තේකට මම ඔවැනි ඉතා පුදුම දේ දැක නැත. මේ නිසා මම තවමත් යථා තත්වයට ඇවිත් නැත්තෙමි. මට තනිවම නම් මේ මහා මාලිගයේ ජීවත් විය නොහැකි ය. මෙහි එකද මිනිස් පුලුටක්වත් නැතැ" යි කියලා ඈ ඔහුට ඇසෙන ලෙස පැවසුවා.

"මගේ සුන්දර ස්වාමිදුවනි, බිය නොවනු මැනවි. ඔබ තනිවම යහනට නොයනු ඇති. ඔබේ යහන් ගබඩාවේ ඔබට පුරුදු මෙහෙකාරිය මෙහි එනු ඇති. මගේ මාලිගාශාලාවට මෙහෙකරු පිරිස් බොහෝ ය. ඔවුන් ඔබට නොපෙනේ. ඔවුන්ගේ හඬ ඔබට නොඇසේ. ඔවුහු මාත් සමග එකතු වී දිවා රෑ දෙක්හි ඔබ රැක බලා ගනිති. ඔබ සුළං පහරින් සහ දූලිවලින් පවා අපි ආරක්ෂා කරමු." යන වැකිය යළිත් කිරි ගරුඬ බිත්තියෙහි ගිනි අකුරින් ලියැවිණි.

වෙළෙන්දාගේ පොඩි දුව රාත්‍රී නින්ද සඳහා යහනට යත්ම, එහි තමාට ඉතා කීකරු විශ්වාසවත් මෙහෙකාරිය සිටින සැටි ඈ දුටුවා ය. ඈ තරමක් බියපත් වෙලා ය. මෙහෙකාරිය ස්වාමිදුව දැක ඇගේ දෑත් සිප දෙපා බදා ගත්තා ය. ස්වාමි දුව ඉතා සතුටු වී, තාත්තාගේ සහ අක්කලාගේ තොරතුරුත්, වෙළෙඳ මන්දිරයේ අනික් තොරතුරුත් අසන්නට වූවා. ඉතින් ඔය විදිහට මෙහෙකාරිය සියලු විස්තර කී අතර වෙළෙන්දාගේ පොඩි දුවත් තමා දුටු දේ ගැනත් ඇසූ දේ ගැනත් විස්තර කරමින් පසුදා එළිය වැටෙන තුරුම අල්ලාප සල්ලාපයෙහි යෙදුණා.

වෙළෙන්දාගේ පොඩි දුව ඔය ආකාරයට සිය තරුණ විය මේ මහා මාලිගාවේ ගත කිරීමට පටන් ගත්තා. හැමදාම ඉතා ඉස්තරම් අලුත් ඇඳුම්, මිලක් කළ නොහැකි, කටින් විස්තර කියන්ට නොහැකි, අතින් විස්තර ලිවිය නොහැකි වටිනා දේ ඇයට ලැබුණා. හැමදාම ඉතා ප්‍රීතියෙන් ගත කළා. හැමදාම සෙල්ලම් ගමන් ගියා. විනෝද වුණා. සතුන් නැති සංගීත රියෙක නැගිලා විනෝද ගමන් ගියා. මූකලන් කැලෑව මේ රියට යාමට ඉඩ දෙනවා. පුළුල් හොඳ මාර්ග ඇති වෙනවා, ඉබේටම.

ඔහොම ඉඳලා පොඩි දුව රිදී සහ රන් නූලෙන් වැල්වට් රෙදි මහන්ටයි. මුතු මැණික් අල්ලන්ටයි පටන් ගත්තා. තාත්තාට අත් වැඩ තෑගි යැවුවා. ඉතා ලස්සන වැල්වට් රෙද්දක් රන් නූලෙන් මහලා මුතු මැණික් එයට අල්ලා මහා වනයට අධිපති මහා දැවැන්තයාට තෑගි කළා. තමාගේ ගුණ යහපත් ස්වාමියා සමග කතා කිරීමට පොඩි දුව හැමදාම කිරි ගරුඬ බිත්තිය ළඟට ගියා. ඇගේ කතාවලට පිළිතුරු කතා කිරි ගරුඬ බිත්තියේ ලියැවෙනවා.

මෙලෙස සැහෙන කාලයක් ගත වුණා. වෙළෙන්දාගේ ලස්සන පොඩි දුව ඔය ජීවිතයට පුරුදු වුණා. දැන් ඉතින් ඈ පුදුම වෙන්නේ වත්, බිය වන්නේ වත් නැහැ. නොපෙනෙන අදිසි මෙහෙකරුවන් ඇයට සේවය කරනවා. ඇයට ආහාර පාන දෙනවා. අශ්වයින් නැති ගැලකින් ඇයව හැම තැනම ගෙනියනවා. සංගීතය වයනවා. ඇගේ ඉල්ලීම් සියල්ල ඉටු කරනවා. පොඩි දුව දැනගත්තා එයා මහා මාලිගයේ අධිපති මහා දැවැන්තයාට ආලය කරන

බව. ඔහුත් ඇයට බොහොම ආදරය කරන නිසා ඔහු ස්වාමි දුව යන නමින් අමතන බව ඈ තේරුම් ගත්තා. ඈ ආශා කළා ඔහුත් සමග කතා කිරීමට, කිරි ගරුඬ බිත්තියේ අකුරු ලියනවා වෙනුවට ඔහුගේ කටහඬ ඇසීමට.

ඈ කොතරම් බැගෑපත් ලෙස ඉල්ලා සිටියත් මහ වනයට අධිපති, මහා දූවැන්තයා ඇගේ ඉල්ලීමට ලෙහෙසියෙන් ඉඩ දුන්නේ නැහැ. ඔහුගේ කටහඬ අසා ඇය බිය වෙතියි කියලා ඔහු සිතුවා. එහෙත් පොඩි දුව කොතරම් දයාන්විත ලෙස ඉල්ලා සිටියා ද යත්, ඔහුට ඇගේ ඉල්ලීම ඉවත දැමීමට නොහැකි වුණා. ඔහු ඇයට කිරි ගරුඬ බිත්තියේ අවසාන වරට මෙසේ ලියුවා:

"අද මල් වත්තට එන්න. ඔබේ ආදරණීය බංකුව මත වාඩි වෙන්න. එය මල්දම්වලින් ගොතා ඇත. වාඩි වී මෙසේ පවසන්න: 'මා සමඟ කතා කරන්න, මගේ සැබෑ වහලා."

පොඩි දුව ඉක්මණට මල් වත්තට දුවලා ගිහිල්ලා මල් දමින් ගොතන ලද ඇගේ ඉතා ප්‍රිය බංකුව මත වාඩි වී, හදවතේ ගැස්ම ඇතිව මෙසේ පැවසුවා. ඒ වේලාවේ දී ඇගේ හදවත මිනිහෙකු අතට හසු වූ කුරුලු පැටවකුගේ හදවත වගේ ගැහෙන්නට පටන් ගත්තා.

"මගේ දයාබර, හුරතල් ස්වාමියාණෙනි, ඔබ බිය නොවන්න. ඔබේ කටහඬ නිසා මම බිය නොවෙමි. ඔබ කළ මේ සියලු හොඳ දේ නිසා ඔබේ වන මෘග රකුසු කටහඬට මම බිය නොවෙමි. ඔබද බිය සැක නැතිව මා සමග කතා කරන්න."

යම් කිසිවෙක් බංකුව අසලට වී දුක්බර සුසුමක් හෙලන සැටි ඇයට ඇසුණා. ඉන් පසුව ඉතා බියජනක, වන මෘග, ගොරෝසු කට හඬක් ඇසෙන්නට විය. ඔහු කතා කළේ පහත් හඬකින්. ලස්සන පොඩි දුව මුලදී ඒ භයානක කටහඬ අසා තිගැස්සුණා. එහෙත් ඈ බිය වූ ගතියක් නොපෙන්වා ආත්ම දහිරිය ඇති කැර ගත්තා. ඉක්මණින් ඈ ඔහුගේ සුරතල් සහ දයාන්විත වචනත්, බුද්ධිමත් හා ප්‍රබුද්ධ අදහසුත් ඇසීමට පුරුදු වුණා. ඒවා නිසා ඇගේ හදවත ප්‍රීතියට පත් වන්නට පටන් ගත්තා.

එවේලාවේ සිට සම්පූර්ණ දවසක්ම මේ දෙදෙනා කතා කළා. මල් වත්තේදීත් මහ වනයේදීත් සහ බෝට්ටු පදින විටත් මාලිගාවේ අලංකාර ශාලාවල ඇවිදින විටත් දෙදෙනාම කතා බහ කළා. වෙළෙන්දාගේ ලස්සන පොඩි දුව නිතර මේ ලෙස ප්‍රශ්න කළා:

"මගේ ගුණවත්, සුහද ස්වාමියාණෙනි, ඔබ මෙතැන ද?"

එවිට මහා වනයේ අධිපති, මහා දූවැන්තයා මෙලෙස පිළිතුරු දුන්නා:

"මගේ රුමත් ස්වාමිදුවනි, මම මෙතැන. මා ඔබේ වහලා. අවංක මිතුරා."

එතැන් සිට ඇ ඔහුගේ බියජනක කටහඬ නිසා බියට පත් වුණේ නැත. දෙදෙනාම අවසානයක් නැතිව ආදර බස් දෙඩුවා.

ඔන්න ඉතින් ඔහොම බොහෝ කාලයක් ගෙවුණාද, නැතිනම් කෙටි කාලයක් ගෙවුණාද කියල කියන්ට බැහැ. වෙළෙන්දාගේ ලස්සන පොඩි දුවට මහා වනයට අධිපති මහා දැවැන්ත බියකරු සතාව දැක බලා ගැනීමට ආශාවක් උපන්නා. ඇ ඔහුගෙන් ඉල්ලා සිටියා ඇය ඉදිරියේ පෙනී සිටින ලෙස. ඔහු කොතරම් බියජනක දැයි කියුවොත් ඒ ගැන කටින් කියන්ට බැහැ. පෑනෙන් ලියන්ට බැහැ. මිනිස්සු පමණක් නොවෙයි, සත්තු පවා ඔහු දුටු විගස බොහෝම බය වෙලා උන්ගේ ගුහාවලට දුව ගිහින් සැඟවෙනවා. මහා වනයට අධිපති මහා රකුසු දැවැන්තයා මෙහෙම කියනවා:

"මා ඔබ ඉදිරියේ පෙනී සිටිය යුතු යැයි මගෙන් ඉල්ලා නොසිටින්න. මගේ මුහුණ එතරම් මැ භයානකයි, මගේ ශරීරය එතරම්මැ අවලස්සනයි. ඔබ මගේ කටහඬට පුරුදු වෙලා තියෙනවා. දැන් අප දෙදෙනා සමගියෙන් සහ මිතුරු ලීලාවෙන් වාසය කරනවා. අපි වෙන් නොවී මෙහෙම වාසය කරමු. ඔබ දැන් මට ඉතා හොඳින් ආලය කරනවා. නමුත් මගේ ඉතාම භයානක ඉතාම අවලස්නන මුහුණ දුටුවොත් ඔබ මාව පන්නා දමාවි. එවිට මම වියෝ දුක වාවා ගැනීමට බැරිව මිය යනු ඇති."

පොඩි දුව ඔහුගේ අදහස පිළිගත්තේ නැහැ. කොතරම් බියජනක වුණත්, කොතරම් අවලස්සන වුණත් තමා බිය නොවන බවත්, තමාගේ දයාබර ස්වාමියාට ආදරය කරන බවත් කී පොඩි දුව මෙසේ තෙපළා:

"ඔබ මහල්ලෙක් නම් මගේ සීයා වන්න. ඔබ මැදි වියෙහි නම් මගේ මාමා වන්න. ඔබ තරුණයෙක් නම් මගේ අයියා වන්න. ජීවත්ව ඉන්නා තුරු මගේ අවංක මිතුරා වනු මැනවි."

ඇගේ ඉල්ලීමට මහ වනයේ මහා දැවැන්තයා මුලදී කොහෙත්ම යටත් වුණේ නැහැ. එහෙත් ලස්සන පොඩි දුව කඳුළු වගුරුවා අඬ අඬා කී නිසා ඔහුට දිගින් දිගටම විරුද්ධ වීමට බැරි වුණා. ඔහු ඇයට මෙහෙම කියුවා:

"මට ඔබේ ඉල්ලීමට විරුද්ධ වීමට බැරි, මා ඔබට මගේ ජීවිතයටත් වැඩිය ආදරය කරන නිසයි. මම ඔබේ ඉල්ලීම ඉටු කරන්නම්. එසේ කිරීම නිසා මගේ වාසනාව විනාශ කැර ගැනීමටත්, අකාලයේ මරණයට ගොදුරු වීමටත් මට ඉඩ තිබෙන බව මා හොඳින්ම දන්නවා. ඉර බැස ගියාට පසු හවස ඇඳිරි වැටෙන විට මල් වත්තට එන්න. 'මගේ අවංක මිතුරා මා ඉදිරියේ පෙනී සිටින්න.' යැයි කියන්න. එවිට මගේ ඉතා බියජනක මුහුණයි. අවලස්සන

රකුසු සිරුරයි පෙන්වන්නම්. ඔබ මා දැකීමෙන් පසුව ඔබට මාගේ මාලිගාවේ නැවතී සිටීමට නොහැකි නම් ඔබ යහන් ගබඩාවට ගොස් කොට්ටය යට ඇති මගේ පේරුස් මුද්ද පුංචි ඇඟිල්ලේ දමා ගන්න." ඔබට වුවමනා තැනකට යන්නට පුළුවනි. සිරකාරියක් ලෙස ඔබ තබා ගැනීමට මා කැමති නැහැ. ඔබට ඔබේ පියා වෙතට යා හැකියි. මා ගැන කිසිවක් ඔබට ඇසීමට ඉඩක් ලැබෙන්නේ නැහැ.

වෙළෙන්දාගේ බාල දුව බය වුණේවත්, අදහිරිය වුණේවත් නැහැ. එයාගේ ආත්ම දහිරිය ගැන එයාට ලොකු විශ්වාසයක් ඇති වුණා. ඈ වහාම මල් වත්තට ගිහිල්ලා නියමිත වේලාව එනතුරු බලාගෙන සිටියේ නොඉවසිල්ලෙනි. හවස හිරු අවරදිගින් බැස යත්ම, මල් වත්තේ ඇඳිරිය ඇති වුණා. එවිට පොඩි දුව මෙසේ තෙපලා: "මගේ අවංක මිතුර, මා ඉදිරියේ පෙනී සිටින්න!" ඔන්න සැනෙකින් මහා වනයේ මහා අධිපති ඉතාම බියජනක මහා දැවැන්තයා ඇය ඉදිරියේ පෙනී සිටියා. ඔහු එක තැනක නවතින්නේ නැතිව ඇය අසලින් ගොස් ළඟ තිබුණු පඳුරකට ගිහිල්ලා එහි සැඟවුණා. පොඩි දුව ඔහු දුටුවා විතරයි දෑත් වනලා යටි උගුරෙන් කෑ ගසා සිහි නැතිව ඇද වැටුණා. මහා දැවැන්තයා එතරම්මැ අවලස්සනයි. ඔහුගේ දෑත් වන සතකුගේ පාදවලට සමානයි. ඔහුගේ කකුල් අශ්ව පාදවලට සමානයි. ඔටුවාගේ මොල්ලිය වැනි මොල්ලි ඔහුගේ පිටේ සහ පපුවේ ඇත. ඇඟ පුරා දුගඳ හමන මයිල් ය. කටේ වල් ඌරෙකුගේ දත් වැනි දත් දෙකක් ඉදිරියට නෙරා ඇත. නහය රාජාලියෙකුගේ මෙන් නැමිලා ය. දෙනෙත් බස්සෙකුගේ මෙන් වටකුරු ය. විශාල ය, බියජනක ය.

බොහෝ වේලාවකට හෝ ටික වේලාවකට හෝ පසුව ලස්සන පොඩි දුවට සිහිය ලැබිණි. එවිට ඇයට ඇසුණා කවුදෝ සතෙක් සුසුම්ලමින් අඬන සැටි:

"අනේ මගේ සුන්දරිය, මගේ ලස්සන කුමරිය, ඔබ මා විනාශ කළා. මින් පසු ඔබේ සුන්දර රූපය දැකීමට මට ලැබෙන්නේ නැහැ. මගේ කට හඬ ඇසීමට පවා ඔබ කැමති වන්නේ නැහැ. මට අකාලයේ මිය යාමට සිදු වී තිබෙනවා."

ඇයට කණගාටුවක් සහ ලජ්ජාවක් ඇති වුණා. ඇගේ බිය යටපත් කැරගෙන ඇයට ඇගේ ආත්ම දහිරිය එක් කැර ගැනීමට හැකි විය. එවිට ඈ ඉතා ස්ථිර ලෙස කථා කළා:

"මගේ දයාබර සුහද ස්වාමියාණෙනි, ඔබ කණගාටු නොවනු මැනවි. ඔබේ රූපය නිසා මින් පසු මම බිය නොවෙමි. ඔබ අතහැර නොයමි.

ඔබේ කරුණාව මම අමතක නොකරමි. දැන් ඔබ මා ඉදිරියේ යළිත් වරක් පෙනී සිටින්න. මා බිය වුණේ පළමුවැනි වරට බලාපොරොත්තු රහිතව ඔබ දුටු නිසා ය."

එවිට මහා වනයට අධිපති, ඉතා බියජනක මහා දැවැන්තයා ඇය ඉදිරියේ පෙනී සිටියා. එහෙත් ඔහු ඇය ළඟට ආවේ නැහැ. ඕ, ඇය ළඟට එන ලෙස ඔහුට කීවා. නමුදු ඔහු නොවෙයි ආවේ. දෙදෙනාම දුරින් යමින් මල් වත්තේ සක්මන් කළා. ලස්සන පොඩි දුව ඔහුගේ බියජනක මුහුණ නිසාවත්, ඉතා අවලස්සන සිරුර නිසාවත් බිය වුණේ නැත. දහවල් කාලයේදීත් ඔහුගේ බියජනක මුහුණ සහ අවලස්සන සිරුර දුටු පොඩි දුව මුලදී තරමක් බිය වී තිගැස්සුණ නමුදු බිය මැඩ ගෙන සිතට දහිරිය ගෙන කතා කළා. එතැන් සිට මේ දෙදෙනා අතර වඩාත් කුළුපග කතා බහ ඇති විය. ඉන්පසු දෙදෙනාම එකට එක් වී ඇවිදින්නටත්, රසැති ආහාර පාන ආදිය ගැනීමටත් පුරුදු වුණා. මල් වත්තේ ඇවිද්දා. සතුන් රහිත ගැලක නැගිලා මහා වනයේ ලස්සන බැලුවා.

ඔන්න ඔහොම කාලය ගෙවුණා. දවසක් දා පොඩි දුව හීනෙන් දුටුවා, ඇගේ තාත්තා අසනීපයෙන් සිටින බව. ඇයට තාත්තා බැලීමට උපන් ඉතා විශාල ආශාව නිසා ඇගේ සිත කණගාටුවෙන් පිරී ගියා. ඈ අඬන්නට පටන් ගත්තා. මහා වනයට අධිපති, මහා දැවන්තයා ඇය අඬන සැටි අසා දැක හේතුව කුමක්දැයි කියලා ඇසුවා. ඇයට පියා සහ අක්කලා දෙදෙනා බැලීමේ ආශාවක් ඇති වී තිබෙන බව ඕ දැවැන්තයාට කියා සිටියා. එවිට මහා වනයට අධිපති මහා දැවැන්තයා මෙසේ පැවසුවා :

"ඔබ මගේ අවසරය ඉල්ලා සිටින්නේ මන්ද! මගේ රත්රන් පේරැස් මුද්ද ඔබේ කොට්ටය යට තිබේ. එය පුංචි ඇඟිල්ලට පැළැන්දුව විගසම ඔබට ඔබේ තාත්තා ළඟට යන්ට පිළිවනි. ඔබ වුවමනා තරම් කල් ඔබේ පියා ළඟ සිටින්නට පිළිවනි. එහෙත් ඔබ රෑ තුනකුයි දහවල් තුනකුයි ගෙවී යන්නට පෙර මා ළඟට ආවේ නැතිනම්, ඔබ නැති ශෝකය නිසා මම මරණයට පත් වෙමි. මා මගේ ජීවිතයට වඩා ඔබට ආදරය කරන නිසා මා මිය යනවා සත්තකින්ම, සත්තකයි."

රෑ තුනකුයි, දහවල් තුනකුයි ඉකුත් වීමට පැයකට පෙර මා ඔබ වෙතට එන්නෙමැයි පොඩි දුව මහා දැවැන්තයාට කියා, පොරොන්දු වුණා පමණක් නොව, දිවුරුම් පවා දුන්නා.

ඈ ඇගේ දැවැන්තයාගෙන් අවසර ඇරගෙන ඔහුගේ පේරැස් මුද්ද පුංචි ඇඟිල්ලේ දමා ගත් විගසම තාත්තාගේ නිවස ඉදිරිපිට ඇති වත්තට

පැමිණියා. ඈ තාත්තාගේ නිවසේ එළිපත්ත දෙසට ගමන් කළා. අක්කලා දෙදෙනා දුවගෙනැවිත් ඈගේ අති මහත් රූපාලංකාරය සහ කුමාරිකාවකගේ වැනි තේජස දැකලා බොහොම පුදුම වුණා. ඔවුහු දෙදෙනාම ඈගේ අතින් අල්ලාගෙන තාත්තා ළඟට ගෙන ගියා. තාත්තා රෝගාතුර වී රෑ දවල් තිස්සේ පොඩි දුව ගැනම කල්පනා කරමින් අඬ අඬා සිටියා. ඔහු තමාගේ ඉතාම ආදර, ඉතාම දයාන්විත පොඩි දුව දුටු විගස බොහොම සතුටු වෙලා, ප්‍රීති වුණා. ඈගේ සුන්දර රූපයත්, රාජකීය තේජසත් දැකලා බොහොම ප්‍රීති වුණා.

තාත්තායි දුවයි සිප වැළඳගෙන ඉතා ආදරයෙන් තොරතුරු විමස විමසා කතා කළා. පොඩි දුව තාත්තාටත් අක්කලා දෙදෙනාටත් විස්තර කළා මහ වනයට අධිපති මහා දූවැන්තයාගේ මාලිගාව, මල්වතු, පලතුරු වතු ආදී දේ ගැන. පොඩියක්වත් සැඟවූයේ නැහැ. පොඩි දුව ලබා තිබෙන රාජකීය යස ඉසුරු දැකලා තාත්තා බොහොම සතුටු වුණාට මොකද එතරම් බියජනක, අවලස්සන සතකු වැනි ඒ දූවැන්තයා දෙස බැලීමට ඇය පුරුදු වුණේ කෙසේද යන්න සිතා ගැනීමටවත් ඔහුට නොහැකියි. එදා වෙළෙන්දා ඒ දූවැන්ත රකුසාව දුටු වේලේ ඔහු බියෙන් වෙවුලූ සැටි ඔහුට තවමත් මතකයි. පොඩි නංගීට ලැබුණු අතිමහත් යස ඉසුරු නිසා අක්කලා දෙදෙනා තුළ ඉතා විශාල ඉරිසියාවක් ඇති වුණා.

පළමුවැනි දවස ගෙවුණා. දෙවැනි දවසත් විනාඩියක් මෙන් ඉක්මණින් ගෙවුණා. තුන්වැනි දවසේ දී අක්කලා දෙදෙනා නංගීට කියනවා මහා දූවැන්තයා ළඟට යන්ට එපයි කියලා. "ඒ අවලස්සන යකාට හෙණ වැදුණදෙන්. නංගී යන්ට එපා!" එවිට පුංචි නංගී අක්කලාගේ කතාවට අමනාප වෙලා මෙහෙම කියුවා:

"මට මෙතරම් කරුණාව, දයාව සහ ආදරය පෙන්වූ මගේ ස්වාමියාව මරණයට පත් කොට මම නොගිහින් සිටියොත්, මගේ වටිනාකම පොට්ට කාසියකටත් වඩා අඩුයි. එහෙනම් මාව මේ ලෝකයේ තියන්ට පවා වටින්නේ නැහැ. මගේ මස් වන සතුන්ට දාන්නට ඕන."

ඈගේ තාත්තා, අවංක වෙළෙන්දා ඈගේ කතාව නිසා ඇයට බොහොම ප්‍රශංසා කළා. පොඩි දුව හතළිස්වැනි පැයේ දී මහා වනයට අධිපති මහා දූවැන්තයා ළඟට යා යුතු බව තීරණය කළා. ඉරිසියාවෙන් මුළා වුණු අක්කලා දෙදෙනා ඇයට බාධා කිරීමට කපටි උපායක් යෙදුවා. ඒ උපාය මොකක්ද දන්නවා ද, වෙළෙන්දාගේ නිවසේ ඇති සියලු ඔරලෝසුවල වේලාව පැයකින් ආපස්සට කරකැවීමයි. අක්කලා දෙන්නා කළ මේ වැඩේ තාත්තාවත්, ගෙදර ඉන්න වැඩකාරයන්වත් දැක්කේ නැත.

එහෙත් මහා දූවැන්තයා වෙත යා යුතු සැබෑ වේලාව පැමිණි විට පොඩි

දුවගේ හදවත වේදනාවෙන් කකියන්ට පටන් ගත්තා. ඈ තාත්තාගේ ගෙදර ඔරලෝසු දිහා බැලුවා. එංගලන්තයේ, ජර්මනියේ ආදී නොයෙකුත් රටවල හදාපු බිත්ති ඔරලෝසුවල වෙලාව එකම විදිහකට පැයක් පමා වෙලා. අක්කලා ඇයත් සමග කතා කරනවා. බොරුවට නොයක් දේ ගැන අසමින් ඇයගේ අවධානය වෙනත් අතකට යොමු කරන්ට වෑයම් කරනවා. එසේ වුවත් ඇගේ හදවත මහා වේදනාවකට ගොදුරු වෙලා ඇති බැවින් ඈ තාත්තාගේ ආශිර්වාදය ලබාගෙන අක්කලාගෙන් සමුගෙන, සියලු වැඩකාරයින්ට ආයුබෝවන් කියලා නියමිත වේලාව ගෙවෙන්ට විනාඩියක් ගත වීමට පෙර ජේරුස් මුද්ද පුංචි ඇඟිල්ලට දමා ගත් විගස මහා වනයට අධිපති මහා දූවැන්තයාගේ මාලිගාවට සැණෙකින් ම ආවා. ඈ පුදුමයට පත් වුණේ, ඇය පිළිගැනීමට දූවැන්තයා ඉදිරියට ආවේ නැති නිසයි.

"මගේ දයාබර ස්වාමියනි, මගේ අවංක මිතුරාණෙනි, ඔබ කොහිද? ඔබ මා පිළිගැනීමට නොඑන්නේ මන්ද? ඔබ කී අවසාන වේලාවට විනාඩියකට සහ පැයකට ඉස්සෙල්ලා මා ආවා." කියලා පොඩි දුව මහ හඬින් කතා කළා.

එහෙත් ඔහුගේ පිළිතුරක්වත්, හඬක්වත් ඇසුණේ නැත. මල්වතුවල කුරුල්ලෝ ලස්සන ගීත ගැයුවේ නැහැ. වතුර මල්වලින් වතුර විහිදී ගියේ නැහැ. මාලිගාවේ ශාලාවල සංගීත වාදන නැත. වෙළෙන්දාගේ පොඩි දුවගේ හදවත දුකින් පිරුණා. කිසියම් විපතක් සිදු වී තිබෙන බව ඇයට දැනුණා. ඈ මාලිගාවේ ශාලාවෙන් ශාලාවට යමින්, මල් වත්තේ සෑම තැනම යමින් දූවැන්තයාව සෙවූ නමුත් ඔහු පෙනෙන්ට සිටියේ නැහැ. එවිට ඈ ලෝකයේ ඉතාම ලස්සන රතු මල තිබෙන කුඩා ගොඩැල්ල දෙසට දිව ගියා. මහා වනයට අධිපති මහා දූවැන්තයා ඒ මල ඔහුගේ අතකින් අල්ලාගෙන බිම වැතිර සිටින සැටි දැක්කා. ඇය සිතුවේ ඔහු තද නින්දකට වැටී ඇතැයි කියලා. ඇය එනතුරු බලා සිට නින්දට ගිය බවයි. වෙළෙන්දාගේ ලස්සන පොඩි දුව ඉතා සෙමින් ඔහු අවදි කරවීමට පටන් ගත්තා. එහෙත් ඒ මහා දූවැන්තයා හුස්ම නොගන්නා බවත්, ඔහු මිය ගොස් ඇති බවත් ඇයට තේරුණා.

ඇගේ දෙනෙත් කඳුළින් පිරිණි. දෙපා බෙලහීනව ගොස් ගැහෙන්නට විය. ඈ දණින් වැටී දූවැන්තයාගේ ඉතා බියජනක අවලස්සන හිස් ගෙඩිය තමාගේ සුන්දර දෑතින් අල්ලාගෙන සුසුම්ලමින් මෙසේ පැවසුවා:

"නැගිටින්න, නැගිටින්න, මගේ ආදර මිතුර, ඔබ මගේ සිත ගත් මනාලයා වන්න!"

ඒ වචන කී විගස සතර වටින් විදුලි කොටන්ටත්, හෙණ හඬ වැදෙන්නටත් විය. ගොඩැල්ලට වැදුණු හෙණ පහරක් නිසා පොඩි දුව සිහිසන් නැතිව ඇද වැටුණා.

මෙලෙස සිහි නැතිව ඈ කොතරම් වේලා සිටියාදැයි කීමට අපි නොදනිමු. ඇයට යළිත් සිහිය ලැබූ විට ඈ මාලිගයේ තම බැහැදකින ශාලාවේ සිටින සැටි පමණක් ඇයට දැනිණි. ඇය වාඩි වී සිටියේ රනින් කළ සිහසුනක් මත ය. ඇය බදා වැළඳගත්තේ ඔටුන්නක් හිස පැළඳූ, රන් අබරණවලින් සැරසුණු තරුණ රාජ කුමරෙකු විසිනි. ඇය ඉදිරියේ ඇගේ පියා සහ අක්කලා සිටිති. වටේට රන් සහ රිදී අබරණවලින් සැරසුණු රාජ දූත පිරිස් ය. ඔටුන්න හිස පැළඳ සිටින රූමත් රාජ කුමාරයා ඇය අමතා කතා කරයි:

"ඉතාම රූමත් තරුණිය, ඔබ මට ආලය කළේ මා ඉතාම බියජනක, අවලස්සන සතකුවැ සිටින විටයි. දැන් මම මිනිස් රූපය ගත් කෙනෙකි. මට පෙර මෙන්ම ආලය කරන්න. මගේ ආදර මනාලිය වන්න. මගේ පියරජතුමාට ශාප කළ එක් මායාකාර යකින්නක් මාව කුඩා කලම සොරකම් කැරගෙන ගොස්, ඉතාම බියජනක අවලස්සන රූපයක් බවට මා හරවා එලෙස ජීවත් වන සේ මට අණ කළා. කිසියම් රූමතියක් මා දැක මට ආලය කරන බව කියා, මගේ නීත්‍යානුකූල බිරිඳ වීමට කැමැති බව කියන තුරු මා එලෙස එවැනි රකුසු ජීවිතයක් ගත කළ යුතු බවට ඒ යකින්න මට ශාප කළා. මා ඔවැනි බියජනක රූපයකින් අවුරුදු තිහක් මේ මාලිගාවේ වාසය කළා. ඒ කාලය තුළ දී මට තරුණියන් එකොලොස් දෙනෙකු හමු වුණා. ඔබ තමා දොළොස්වැනි තරුණිය. මගේ කරුණාවට සහ මගේ සුහදතාවයට කිසිම තරුණියක් මට ආලය කළේ නැහැ. ඔබ තමා මට පළමුවෙන්ම ආලය කළේ. මගේ සුහදතාවය සහ මගේ දයාබර ගුණය නිසා ඔබ මගේ ඉතා බියජනක සහ අවලස්සන රූපය නොතකා මට ආලය කළා. ඒ නිසා ඔබ කීර්තිමත් මහා රජකුගේ බිසව බවට පත් වේ."

ලස්සන රජ කුමරකු බවට පත් වූ දැවැන්තයාට රැස්ව සිටි සියලු පිරිස් හිස නමා ආචාර කළා. අවංක වෙළෙන්දා තමාගේ ඉතාම ලස්සන පුංචි දුවට ආශිර්වාද කළේ ඇය රාජ කුමාරයාගේ බිරිඳ සහ රජ බිසව බවට පත් වීමට යන නිසා ය. ඔහු තරුණ රාජ කුමාරයාටත් ආශිර්වාදය පුද කළා. ඉරිසියාවෙන් සිටි අක්කලා දෙන්නත් නංගීට ආශිර්වාද කළා. ඒ ගොල්ලන්ට වෙනත් දෙයක් කිරීමට තිබුණේ නැති නිසයි, ඒ ගොල්ල එහෙම කළේ. සියලු සෙනවිවරු, සිටුවරු, යුද නායකයෝ දෙපළට ආචාර කළා. රාජකීය භෝජන සංග්‍රහයට ආරාධනා ලැබූ අය මේසයට වාඩි වුණා. මාත් එයට සහභාගි වුණා. රජ කෑම කෑවා. රජ බීම බීවා. හැබැයි කටේ වැටුණේ නැහැ. රැවුලේ ගෑවුණා විතරයි.

අන්තෝනි පගරේල්ස්කි

කළු කිකිළිය හෙවත් පාතාල ලෝකයේ මිනිස්සු

මීට අවුරුදු දෙසීයකට පෙර පිතර්බූර්ග් නගරයේ වසීලියෙව්ස්කි දූපතේ පළමුවැනි මහා මාර්ගයේ තිබුණා එක නේවාසික පාසලක්. දැන් එතැන එම නේවාසිකාගාර පාසල වෙනුවට වෙනත් ගොඩනැගිල්ලක් තිබුණත් බොහෝ දෙනෙකුට එම ස්ථානය මතක ඇති. ඔන්න ඒ කාලයේ සිටම අපේ පිතර්බූර්ග් නගරයේ අලංකාරය නිසා අපේ නගරය යුරෝපා රටවල ප්‍රසිද්ධ වී තිබුණා. එනමුත් ඒ නගරය ඉස්සර කාලෙ අද තරම් ලස්සනට තිබුණේ නැහැ.

දැන් අපිට දකින්නට නොලැබෙන ඒ නේවාසික පාසල් ගොඩනැගිල්ලට තට්ටු දෙකක් තිබුණා. එහි පියස්සට දාලා තිබුණේ

ඕලන්ද උළු කැට. එළිපත්ත ලීයෙන් හදලා. එය මහ පාරට මූණලා තිබුණා. එළිපත්තේ කාමරයේ සිට දෙවැනි තට්ටුවට නැගීමට දුනු හැඩයට පඩි පෙළක් තිබුණු බව මතකයි. දෙවැනි තට්ටුවේ කාමර අටක් නැතිනම් නවයක් විය. එක් පැත්තක නේවාසික පාසල් ගුරුවරයා වාසය කළා. අනික් පැත්තේ පංති කාමර තිබුණා. පාසල් ළමයින්ගේ නිදන කාමර පිහිටියේ පහත මාලයේ, දකුණු පැත්තේ. වම් පැත්තේ ජීවත් වුණේ ඕලන්ද ජාතික මහලු ආච්චිලා දෙදෙනෙක්. මේ ගොල්ලෙන්ගෙ වයස එක්කෙනෙකුට අවුරුදු සීයයකටත් වඩා වැඩියි. මහා ජ්යොතර් රජ්ජුරුවන්ව මේ ගොල්ල ඇහින් දැකලා, කටින් කතා කරලා තියෙනවා.

මේ නේවාසික පාසලේ ඉගෙන ගත්තා ළමයින් හතළිහක් විතර. මින් එක් ළමයෙක් තමයි, අලෝෂා. එයාගෙ වයස අවුරුදු දහයක් විතර ඇති. අලෝෂාගේ අම්මයි තාත්තයි අලෝෂාව අගනුවරට ගෙනැවිත්, වසීලියෙව්ස්කි දූපතේ නේවාසික පාසලට ඔහුව බාරදීලා, ගුරුවරයින්ට අවුරුදු කීපයකට සෑහෙන්න පාසල් ගාස්තු ගෙවලා ගෙදර ගියා. අලෝෂා පුංචි වුණාට නුවණක්කාරයා. ප්‍රිය මනාප ළමයා. හොඳට ඉගෙන ගත්තා. අනික් හැම දෙනාම පුංචි අලෝෂාට ආදරය කළා. සමහර දාට ඔහුට නේවාසිකාගාරය නිසා පාලු ගතියක් දැනෙනවා, තවත් සමහර දාට දුකක් සිතෙහි ඇති වෙනවා. අම්මගෙනුයි, තාත්තාගෙනුයි ඔහු වෙන්වුණායි කියල ඔහුට මුලදී කොහොමටවත් සිතාගන්ටත්, එම අදහසට පුරුදු වෙන්ටත් බැරි වුණා. පසුව සෙමින් සෙමින් එම අදහසට පුංචි අලෝෂා පුරුදු වෙලා, සමහර විට සිතාගත්තා නේවාසික පාසලේ ගෙදරටත් වඩා හොඳට සතුටින් ඉන්න පුළුවනියි කිලා, ඔහු ළමයින් සමග සෙල්ලම් කළා.

ඉගෙන ගන්න දවස් වලදී අලෝෂාට සතුටුයි. එහෙත් සෙනසුරාදා දවස්වලදී අනික් ළමයි තම තමන්ගේ ගෙවල් වලට ගියාම, ඔහුට බොහොම ලොකු කනගාටුවක් සිතහි උපදිනවා. ඔහුට තනිකමක් දැනුණා. ඉරිදා දවස්වලත්, උත්සව දවස් වලත් ඔහු තනිවම ගත කළා. ඔහු ලැබූ එකම සැනසිම පාසලේ පුංචි පොත්ගුලෙන් පොත් ඇරගෙන කියැවීමයි. ඒ කාලයේ බොහොම පොත් ලියැවී තිබුණේ වීර-ධීර සෙනවිවරුන් ගැන සහ මායාකාර කතා ගැනයි. ඉතින් අපේ පුංචි අලෝෂා ඔය පොත් ගොඩක් කියැවූවා.

එම පාසල් වත්ත බොහොම ලෙකුයි, පටු මගෙන් එය වෙන් කර තිබුණේ ලීයෙන් හදාපු වැටකිනි. පාසල් වත්තේ ගේට්ටුවට යතුරු ඉබ්බකු දමා තිබුණු නිසා අලෝෂාට පටුමගට යාමට ඉඩක් තිබුණේ නැහැ. නමුත් එයා පටුමග ගැන නොයෙක් දේ සිතා ගත්තා විතරක් නෙවෙයි, එහි යාමටත් ආශා කළා.

පාසල් වත්තේ සෙල්ලම් කිරීමට ඔහුට ඉඩ ලැබුණු විගසම ඔහු කළ පළමුවැනි දෙය තමයි, ඔක්කොටම ඉස්සෙල්ලා වැට ළඟට දුවගෙන යාම. ඔහු ලී වැටේ කුඩා සිදුරු වලින් පටුමග දිහා බලනවා. එම වැටේ සිදුරු බොහොම තිබුණා. මේ සිදුරු උසින් වැඩි නිසා අලෝෂා දෙපයේ ඇඟිලි තුඩුවලින් සිටගෙනැ පටුමග දිහා බලනවා. මේ වැටේ සිදුරු තියෙන්නෙ ඒවාට ලොකු යකඩ ඇණ ගහලා තිබිලා පසුව ඒ ඇණ ගළවා දැමූ නිසාය, කියන එක අලෝෂා දැනගෙන සිටියේ නැහැ. යම්කිසි මායාකාර දෙව්දුවක් අලෝෂාට පටුමග බැලීමට සිදුරු මවා තියෙනවා කියලා තමා එයා කල්පනා කළේ. කවදාහරි ඒ දෙව්දුව එතැනට ඇවිත් ඔහුට සෙල්ලම් බඩුවක් හරි, ඒත් නැතිනම් කවචයක් එම සිදුරෙන් තමාට දෙනු ඇති, එහෙමත් නැත්නම් බොහේ කාලයක් තිස්සේ අම්මාගෙන් තාත්තාගෙන් ලියුමක් නැති නිසා දෙව්දුව ලියුමක් ගෙනත් දෙතියි කියලා අලෝෂා සිතුවා, එනමුත් කිසිම දවසක ඔහු සිතින් මවා ගත්ත ඒ මායාකාර දෙව්දුව ආවේ නැහැ.

අලෝෂා කැමැත්තෙන් කළ තවත් වැඩක් නම් කුකුළන්ට කෑම දීමයි. ලී වැට අසල කුකුළු කූඩු හදලා තිබුණා. එතැන කුකුළෝ කිකිළියෝ දුව ඇවිදිමින් අවුලාගෙන කෑවා. ඉක්මනින්ම ඔහු කුකුළන්ගේ නම්වලින් උන්ව හඳුනාගත්තා. පොරකන කුකුළන් ඈත් කළා. පොරකන චණ්ඩි කුකුළන්ට ඔහු දඬුවම් කළේ දවස් කීපයක්ම උන්ට පාන් පොතු නොදීමෙන්. අලෝෂා සෑමදාම දවල් සහ රාත්‍රී කෑමෙන් පසුව මේසය උඩ තියෙන පාන් පොතු සහ පාන් රොඩු එකතු කැර ගත්තේ කුකුළන්ට දෙන්ටයි. අලෝෂා වැඩියෙන්ම ආදරය කළේ කළු කිකිළියටයි. ඔහු ඇයට නම දැම්මා කළු කිකිළි 'කල්ලි' කියලා. ඒ කිකිළි ඇයව අත ගෑමට පවා ඔහුට ඉඩ දෙනවා. මේ නිසා අලෝෂා හොඳ පාන් කෑලි කළු කිකිළියට දෙනවා. ඈ බොහොම සන්සුන් සතෙක්. වැඩි කලබලයක් නැහැ. ඇයත් අනික් කිකිළියන්ට වඩා කැමති අලෝෂාටයි.

හිම කාලයේ පාසල් නිවාඩු සමයේ එක් දවසක අලෝෂා ගෙවත්තට ආවා සෙල්ලම් කිරීමට. පාසලේ ගුරුතුමයි එයාගේ බිරිඳයි පාසල්වල ලොකු ඉස්පැටර මහත්තයාට කෑමකට ආරාධනා කරලා තිබුණා. ඉතින් මේ දෙදෙනා ලොකු අමුත්තාව පිළිගන්ට ඕන නිසා ගෙදර ඇමදලා, අතුගාලා, බිම සෝදලා, ජනේල දොරවල මකුළු දැල් කඩලා පිරිසිදු කරලා, බුරුත මේස, පුටු ගෙනාවා. ගුරුතුමා වෙළෙඳ පොළට ගියා ගෙදරට ආහාර ගේන්ට. ඉතා හොඳ වහු මස්, ලුණු දාපු ඌරුමස් සහ ජෑම් ගෙනාවා. අලෝෂාත් කෑම මේසයට තැබීමට උදවු වුණා. කෑම මේසය සරසන්නට කඩදාසි මල් කැපීම කළේ අලෝෂා ය.

උදේ පාන්දර ගුරු ගෙදරට ආ කොණ්ඩා සහ රැවුළු කපන කරනැවැමියා ගුරුතුමාගේ කොණ්ඩය කැපුවා. ඉන් පසුව ගුරුතුමාගේ බිරිඳගේ එනම් ගුරුතුමීගේ කොණ්ඩය සරසලා මල් තැබුවා. මූණට පුයර දමාලා සුවඳ විලවුන් ගැල්වූවා. ගුරුතුමාගේ සිසුන්ගේ දෙමාපියන් ඔහුට තෑගි දීපු බෙරලියන්තු ගල් අල්ලපු මුදු දෙකකුත් ඈ අතේ ඇඟිලිවලට පැළඳ සිටියා. හිස සරසා ගත්තාට පසුව ඈ පරණ ගවුමක් ඇඳ ගෙන ගෙදර වැඩ කිරීමට පටන් ගත්තා. නමුත් ඈ කොණ්ඩය අවුල් කැරැ ගැනීමෙන් වැළැකී හිටියා. ඈ කුස්සිය ඇතුළට යන්නේ නැතිව දොර අසලට වී, කුස්සි අම්මාට අණ කළා, කෑම උයන සැටි කියා දුන්නා. ඉතාම ඇවැසි වැඩවලට කුස්සියට යැව්වේ ගුරුතුමාවයි. ඔහුගේ කොණ්ඩය එතරම් ලස්සනට සරසලා තිබුණේ නැහැ.

ඉතින් ඔය මහා කලබලය අස්සේ, ඒගොල්ලන්ට අලෝෂාව අමතක වෙච්චි. අලෝෂාත් එයින් ප්‍රයෝජන අරගෙන ගෙවත්තේ සෙල්ලම් කිරීමට පටන් ගත්තා. එයාට පුරුදු පරිදි ඉස්සෙල්ලාම ඔහු ලී වැටේ සිදුර අස්සෙන් පටුමග දෙස බැලුවා. එදා පාරේ යන එන මිනිසුන් ඔහු දැක්කේ නැත. ඊළඟට ඔහු සුසුම් ලා කුකුළන් ළඟට ගියා. ඔහු බංකුව ළඟට ගිහිල්ලා වාඩි වෙලා කුකුළන්ට අඬ ගහන්ට පටන් ගත්තා විතරයි, ගෙදර කුස්සි අම්මා ලොකු පිහියකුත් අරගෙන එන සැටි දුටුවා. නිතරම කෝපයෙන් බැණ වදින කුස්සි අම්මාට අලෝෂා කැමති නැහැ. කුකුළන්ගේ ගණන අඩුවීමට හේතුව කුස්සි අම්මා බව දැනගත් අලෝෂා ඇයට වඩාත් අකමැති වුණා. අලෝෂා ගොඩාක් කැමතිව හිටපු හොඳ කුකුළු නාම්බෙකුගේ බෙල්ල කපලා උගව කුස්සියේ එල්ලා තිබෙන සැටි ඔහු දවසක් දා දැක්කා. එදා සිට ඔහු ඇය නිසා බොහොම අසතුටු වුණා. අදත් ඇය පිහිය ඇරැගෙන එන විට ඔහු දැනගත්තා කුකුළකුගේ බෙල්ල කපන්ට යන බව. ඔහුගේ කුකුළු යාළුවන්ට උදව් කිරීමට ඔහුට බැරි නිසා ඔහු බොහොම කනගාටු වෙලා ඉවත ගියා.

ඔන්න එවිට අර කුස්සි අම්මා මෙහෙම කියලා කෑගහපිඃ

"අලෝෂා, අලෝෂා ඔය කිකිළිව අල්ලාගන්ට උදව් කරන්න!"

අලෝෂා තව වේගයෙන් දුවලා ගිහිල්ලා කුකුළු කූඩුවලට පසු පසින් සැඟවුණා. ඔහුගේ ඇස්වලින් කඳුළු කැට කඩා වැටෙන සැටි පවා ඔහු දුටුවේ නැත.

ඔහු එලෙස බොහෝ වේලාවක් කුකුළු කූඩුව පිටුපස හැංගිලා හිටියා. කුස්සි අම්මා කුකුළන්ට අඬගසනවා, බණිනවා.

හිටි හැටියේම අලෝෂාගේ හදවත ගැස්සෙන්ට වුණා. එයා ගොඩාක්

ආදරය කරන කළු කිකිළියගේ කට හඬ ඔහුට ඇසුණා වගෙයි. කල්ලී බොහොම බයෙන් කෑගහන්ට වුණා. මෙහෙම කියනවා වගෙයි, ඔහුට ඇසුණේ:

අලෝෂා, මට උදව්වෙන්න!
කළු කිකිළිව බේරගන්න!
කොක් කො, කෝ, කෝ
බේර ගන්නකෝ !

අලෝෂාට තව දුරටත් සැඟවෙලා, බලාගෙන ඉන්ට බැරි වුණා. කල්ලිගෙ පියාපතකින් කුස්සි අම්මා අල්ලා ගත් විගසම අලෝෂා ඉදිරියට පැනලා ඇගේ බෙල්ලේ එල්ලුනා.

"මගේ හොඳ කුස්සි අම්මේ! කරුණාකරලා කළු කිකිළිව අත හැර දමන්න!" කියලා ඔහු කියා හිටියා. ඔහුගේ දෙනෙත් කඳුලෙන් පිරිලා.

ඔහු කුස්සි අම්මාගේ බෙල්ල බදා අල්ලා ගත්තේ බලාපොරොත්තු නැති වෙලාවක නිසා ඈ අල්ලා ගත්තු කිකිළිව අත හරියා. එවිට කල්ලී කුකුලු කූඩුවේ ටකරන් වහළ උඩට නැග ගත්තේ බොහොම බය වුණු නිසයි. කළු කිකිළී කුස්සි අම්මට විහිළු කරන සැටි අලෝෂාට ඇහුණා වගෙයි!

කළු කිකිළිය බේරුණා !
කුස්සි අම්ම පැරදුණා !
කොක් කො, කෝ, කෝ,
අල්ල ගන්නකෝ !

කුස්සි අම්මට බොහොම කේන්ති ගිහිල්ලා එයා ගුරුතුමා ළඟට යන්ට හදන විට, අලෝෂා ඇයට ඉඩ දුන්නේ නැහැ. ඔහු ඇගේ ගවුම අල්ලාගෙන බැගෑපත් ලෙස කන්නලව් කළා :

"අනේ දයාබර කුස්සි අම්මේ! ඔය ඉතාම හොඳ, ඉතාම පිරිසිදු අම්මා කෙනෙක්. මගේ කළු කිකිළිව මරන්ට එපා! ඌට නිදහසේ ඉන්ට ඉඩ දෙන්න. ඔයා ඌව මරන්නේ නැත්නම්, මම මෙන්න මේක ඔයාට තෑගි කරනවා!"

අලෝෂා කුස්සි අම්මාට රන් කාසියක් පෙන්නුවා. එය තමා ඔහුට තිබුණු එකම වස්තුව. ඒ කිසාය ඔහුට තෑගි කළේ ඔහුගේ ආච්චි. කුස්සි අම්මා ගෙදර ජනේලෙට එබිකම් කරලා බැලුවේ, කවුරුවත් එහෙම මේ ගනුදෙනුව දකිනවද කියලා බලාගන්ටයි. කිසිවෙක් නැති බව දැනගත් කුස්සි අම්මා රන් කාසිය ලබා ගැනීමට අත දිගු කළා. රන් කාසියෙන් වෙන්වීම අලෝෂාට

ලොකු දුකක් වුණත්, කළු කිකිළියගෙ පණ බේරාගැනීමට ඉඩ ලැබීම නිසා ඔහු බොහොම සතුටු වුණා.

ඉතින් ඔන්න ඔහොම කළු කිකිළිව මරණයෙන් බේරා ගැනිමට අලෝෂාට හැකි වුණා.

කුස්සි අම්මා රන් කාසිය රැගෙන ගිය හැටියේම කල්ලී වහලෙන් බිමට බැහැලා අලෝෂා ළඟට ඇවිත් බොහොම සතුටෙන් අත්තටු ගහන්ටයි, කෙකර ගාන්ටයි පටන් ගත්තා. ඌ ඔහු වටේම කරකැවෙන්නට වුණා. අලෝෂා එයාව බේරාගත් බව කල්ලී දැනගෙන හිටියා වගෙයි. කල්ලී ඔහු පසු පසින් ගියේ හරියට බල්ලෙක් තමාගේ හාම්පුතා පිටුපසින් යන ආකාරයට ය. කිකිළිය ඔහුට යමක් කීමට උත්සාහ කළද, එයාට එහෙම කියන්ට බැරි බව ඔහු තේරුම් ගත්තා. ඇගේ කෙකර ගෑම ඔහුට තේරුම් ගැනීමට බැරි වුණා.

භෝජන සංග්‍රහයට පැය දෙකකටත් ඉස්සෙල්ලා අමුත්තෝ ගුරු ගෙදරට එන්ට පටන් ගත්තා. අලෝෂාට උඩු මහලට එන්ටයි කියලා, ඔහුට වටකුරු කරපටියක් තියෙන කමිසයක් ඇන්දෙව්වා. ඒ කමිසේ අත් පටි තුනියි, දිලිසෙනවා, පුංචි රැළි සහිතයි. ඔහු නිල් පීත්ත බඳ පටියක් සහිත සුදු කලිසමකුත් ඇඳ ගත්තා. දුඹුරු-රතු පාට ඔහුගේ හිසකේ බඳ පටිය දක්වා දිගට වැඩිලා තිබුණු අතර ඒවා දෙකට බෙදලා පීරලා තිබුණේ බොහොම ලස්සනටයි. ඒ කාලේ රුසියාවේ ළමයි ඇඳපු ඇඳුම්වල සැටි ඔබට තේරුම් ගත හැකියි.

ඉන් පසුව අලෝෂාට ඉගැන්නුවා පාසල්වල පරීක්ෂකතුමා ඉදිරියට එන සැටි, කාමරයට ඇතුළු විය යුතු සැටි, ප්‍රශ්නයක් ඇසුවොත් එයට පිළිතුරු දෙන පිළිවෙළ.

වෙනින් වෙලාවකදී නම් පාසල් පරීක්ෂක තුමා හමුවීමට අලෝෂා බොහොම සතුටු වෙනවා ඇති. ගුරු දෙපොළ පරීක්ෂක තුමා ගැන ඔහුට කියා තිබෙන හැටියට නම්, ඔහු පුරාණ කතාවල වීර සෙනවියකු වගේ කෙනෙකු විය යුතු යැයි අලෝෂා සිතින් මවා ගත්තා. පරීක්ෂක මහතා පිහාටුවක් ගහපු තොප්පියක් හිස ලාගෙන සෙනවි ඇඳුමක් ඇඳගෙන ඉන්නවා විය යුතුයි. ඒ වුණාට අලෝෂාට කළු කිකිළිය ගැන සිතපු විගස සෙනවි තුමාගේ ඇඳුම ඔහුට අමතක වුණා. කුස්සි අම්මා පිහියත් ඇරැගෙන කල්ලී පස්සේ දුවන සැටිත් කල්ලි නොයෙක් ආකාරයට හඬලන සැටිත් ඔහුට ඇසෙනවා වගේ දැනුණා. කිකිළිය ඔහුට කියන්නේ මොනවාද කියලා ඔහුට තෙරුම් ගන්ට නොහැකි වීම නිසා ඔහු දුක් වුණා. කුකුළු කූඩු ළඟට යාමට ඔහුට ඇති වුණේ ඉතා



ලොකු ආසාවක්. නමුත් කරන්ට දෙයක් නැහැ. භෝජන සංග්‍රහය ඉවර වන තුරු ඉන්නට ඕන !

ඔන්න ඉතින් අවසානයේ දී පාසල් පරීක්ෂක මහතා පැමිණියා. ඔහු එන බව ඉස්සෙල්ලාම දනුම් දුන්නේ ගුරුතුමියයි. ඈ ඔහු එන මග ජනේලය ළඟට වෙලා බලා ගෙන සිටියා.

හැම කෙනෙක්ම ක්‍රියාකාරී වුණා. ගුරුතුමා ඉක්මණට එළිපත්තට දුව ගෙන ගියා පරීක්ෂක මහතාව පිළිගන්ට. පැමිණ සිටි අමුත්තෝ නැගිට සිටියා. අලෝෂාට පවා එයාගේ කළු කිකිළිය ගැන අමතක වෙලා. ඔහු ජනේලය ළඟට ආවේ ඔහු සිතින් මවාගෙන සිටිය විදිහට සෙනවියා කඩිසර අස්පයා පිටින් බිමට බසින සැටි බැලීමටයි. එහෙත් ඔහු එය දුටුවේ නැත. පරීක්ෂකවරයා ඒ වන විට ගෙතුළට ඇවිත් සිටියා. කඩිසර අස්පයකු වෙනුවට ගෙය ළඟ නවත්වා තිබුණේ තිකම්ම තිකම් අස්ප කරත්තයක් විතරයි. අලෝෂා බොහොම පුදුමයට පත්වුණා. "මම සෙනවියෙක් නම් කිසිම දාක අස්ප කරත්තයෙන් යන්නේ නැහැ. හැමදාම කඩිසර අස්පයකු පිට නැගලා යනවා." එලෙස සිතුවේ අපේ අලෝෂා.

ඒ අතර ගෙයි දොර ඇරලා ගුරුතුමිය කඳ පහත් කරලා ඉස්කෝල පරීක්ෂක තුමාට ආචර කළා. මුලදී අලෝෂාට අමුත්තාව දකගන්ට බැරි වුණා. ගුරුතුමියගේ මහත බෙල්ලට ඔහු නොපෙනුණු නිසා. අන්තිමේදී ගුරුතුමිය පාසල් පරීක්ෂකයාට සුබ පතලා හිස බොහොම පහත් කරලා ආචාර කරන විට, අලෝෂා ඔහුව දුටුවා... අපෝයි පාසල් පරීක්ෂකවරයාගේ හිස මත පිහාටු ගහපු තොප්පියක් නැත. ඔහුගේ හිස කුඩාය. එහි එකම එක කෙස් රොදක් හැරුණු විට හිසකේ නොමැති විය. එය තට්ට හිසකි. වීර සෙනවියකුගේ ඇඳුමක් වෙනුවට ඔහු ඇඳ සිටියේ අළුපාට කබායකි. හැමදෙනාම ඔහුට බොහොම ගරු කරන සැටි අලෝෂා දුටුවා.

අලෝෂා මේ සියල්ල නිසා මවිත වුණා. වෙනත් වෙලාවට නම් ඔහු මේතරම් හොඳට මේසය ලැහැස්ති කර තිබෙන නිසා සතුටු වෙනවා ඇති. ඒ වුණාට එදින ඔහු ඒ ගැන වැඩි සැලකිලි දක්වූයේ නැත. ඔහු නිතර කල්පනා කළේ එදා උදෑසන කළු කිකිළියට සිදු වූ දේ ගැනයි. භෝජන සංග්‍රහයේ අවසාන ආහාර වටය අමුත්තන්ට බෙදුවා. නොයක් වර්ගවලට අයත් ජෑම්, ඇපල්, පෙයාර් ගෙඩි වර්ග, රට ඉඳි, පළු වර්ග, රට කොට්ටන් ඒවා අතර විය. අලෝෂාට කල්ලී ගැන අමතක කරන්ට බැරි වුණා. අමුත්තෝ කෑම මේසයෙන් නැගිට්ට හැටියේම අලෝෂා ගැහෙන හදවතක් ඇතිව ගුරුතුමා ළඟට ගිහිල්ලා, ගෙවත්තේ සෙල්ලම් කරන්ට පුළුවන්ද කියලා ඇසුවා.

"යනවා, ගිහිං සෙල්ලම් කරන්න. හැබැයි වැඩි වෙලාවක් ඉන්ට එපා. ඉක්මණට කළුවර වැටේවි." ගුරුතුමා කියුවා.

අලෝෂා ඉක්මනට එයාගෙ රතු පාට හිම කබාය ඇඳ ගත්තා. එහි කරපටිය සාවුන්ගේ ලොම් වලින් සදා ඇත. කොළ පාට වෙල්වට් හිම තොප්පිය හිස ලා ගත්තා. ඉක්මනට ගෙවැට ළඟට ඔහු දුවැ ගියා. ඔහු කුකුළු කූඩු ළඟට යන විට කුකුළන් සහ කිකිළියන් රාත්‍රී නින්දට යාම සූදානම් වෙලයි සිටියේ. ඉතින් ඒ නිසා ඒ ගොල්ල අලෝෂා ගෙනාපු පාන් පොතු කෑමට වැඩි ආසාවක් පෙන්වූයේ නැහැ. කළු කිකිළිය විතරක් ඔහු ළඟට ඇවිත් අත්තටු වනලා කෙකර ගෑවා. ඔහු ඌත් සමග සෙල්ලම් කළා. හවස ඇඳිරි වැටීමට පටන් ගත් විගසම ඔහු කළු කිකිළියව කූඩුව ඇතුළට දාලා දොර වැහුවා. ඔන්න ඉතින් දොර වහලා යන විට අලෝෂාට සිතෙනවා කළු කිකිළිය එයාට අඬ ගහනව වගේ :

"අලොෂා, ගෙදර නොයන්න.
මාත් එක්ක සෙල්ලම් කරන්න !"

අලෝෂා ගෙදර ඇවිත් මුළු හවස තිස්සේම එකේ පංති කාමරයෙක වාඩි වෙලා හිටයා. එහා කාමරයේ ඔර්ලෝසුවේ රාත්‍රී එකොළහ වැදුණා. අමුත්තන් යන්නට පෙර අලෝෂා පහත මාලයේ එයාගේ නිදාගන්න කාමරයට ගිහිල්ලා රෑට අඳින ඇඳුම ඇඳගෙන ඉටිපන්දම නිවලා නින්දට ගියා. බොහේ වේලාවක් තිස්සේ ඔහුට නින්ද නොගියත්, ඔහු නින්දට වැටුණු සැටියේම කළු කිකිළියත් එක්ක නින්දෙන් කතා බහ කළා. කනගාටුවට මෙන්, ඔහුගේ නින්දට බාධා කළේ තම තමන්ගේ ගෙවල්වලට විසිර යන අමුත්තන්.

ඊට ටික වේලාවකට පසු පාසල් පරීක්ෂකවරයාගෙන් සමුගත් ගුරුතුමා ඉටපන්දම් ආලෝකයක් රැගෙන විත් අලෝෂා නිදාගන්නවාද යන්න බලා එම කාමරයේ දොර අගුලු ලා යන්ට ගියා.

එදින රාත්‍රියේ හඳ පායලා තිබුණා. දොරේ හිඩැස්ස අතරින් හඳ එළිය කාමරයට වැටිලා. අලෝෂා නිදාගන්නේ නැතිව අහගෙන සිටියා, උඩ තට්ටුවේ අය මේස පුටු අස්පස් කැරමින් නගන ශබ්දය.

ඔන්න ඉතින් අන්තිමට සියලු දෙයම නිහඬ වුණා. යම්තමින් සඳරැස්වලින් එළිය වැටී ඇති ඇඳ දෙස ඔහු බැලුවා. ඇඳේ සිට බිම දක්වා වැටී ඇති සුදු පැහැති ඇඳ රෙද්ද යම්තමින් සෙලවෙන සැටියක් ඔහුට පෙනුණා. එවිට ඔහු බොහොම ඕනෑකමින් ඒ දෙස බලාගෙන හිටියා. ඔහුට දැනුණේ

කවුදෝ ඇඳ පහුරු ගාන සැටියි. ඊට ටික වේලාවකට පසු කවුදෝ කෙනෙක් සිහින් හඬින් කතා කළා :

"අලෝෂා, අලෝෂා !"

ඔහු බියවුණේ ඇඳට හොරෙක් ඇවිත් ඉන්නවා කියා සිතාපු නිසා විය යුතුයි. ඒ වුණාට හොරා තමාගේ නම කියලා අඬ නොගසන බව තෙරුම්ගත් අලෝෂා තරමක් දහිරියට පත් වුණා. එසේ වුණත් තවමත් හදවත හැගෙනවා. ඔහු හිස ඔසවා බැලුවා. ඇඳ රෙද්ද සෙලවෙන සැටි ඔහුට වඩාත් හොඳින් පෙනිණි. කිසියම් කටහඬක් පැහැදිලි ලෙස කතා කරන සැටි ඔහුට යළිත් ඇසිණි:

"අලෝෂා අලෝෂා"

ඔන්න හිටි හැටියේම ඇඳ රෙද්ද ඇතුළේ ඉඳලා කළු කිකිළිය එළියට එන සැටි ඔහු දුටුවා.

"ආ කල්ලී, ඔයා කොහොමද මෙතනට ආවේ ?" නුහුරු ලෙස අලෝෂා ඇසුවා.

ඔන්න එවිට කිකිළිය අත්තටු ගසලා ඔහුගේ ඇඳට ඇවිත් මෙහෙම කියාපි.

"ඔවු. ඒ මම තමයි, අලෝෂා බය වෙන්ට එපා. ඔය ළමයා මට බය නැහැ නේද ?''

"මම මොකද කිකිළියේ ඔයාට බයවෙන්නේ. ඔයාට මම බොහොම කැමතියි. ලොකුම පුදුමය තමයි, ඔයා මිනිස් කට හඬින් කතා කිරීම. ඔයාට හොඳට කතා කරන්ට පුළුවනියි කියන එක මා කලින් දැන සිටියේ නැහැ."
"ඔය ළමයා මාත් සමග යන්ට බය නැතිනම්, වහාම ඇඳුම් අඳ ගන්න!" කිකිළිය කීවා.

"කළු කිකිළියේ ඔයා හරිම විහිළුකාරියක් තමා. කට්ට කළුවරේ මම ඇඳුම් ඇඳගන්නේ කොහොමද ? මට මගේ ඇඳුම් සොයාගන්නටත් බැහැ. ඔයාව හරි හැටි මට පෙනෙන්නෙත් නැහැ!''

''හොඳයි, මම අලෝෂාට උදව් කරන්නම්!'' කිකිළිය කිව්වා.

ඊට පසුව කළු කිකිළිය පුදුම හඬෙකින් කෙකර ගෑවා, ඔන්න එවිට කොහේදෝ ඉඳලා රිදී රිටි උඩ පත්තුවෙන ඉටිපන්දම් කොට අලෝෂාට පෙනිණි. ඒ රිටි බොහෝම පුංචියි. අලෝෂාගේ ඇඟිල්ලක් තරම්ය. ඒවා බිමත්, පුටුවලත්, ජනේල පඩියේත්, මුහුණ සෝදන බේසම අසලත් තිබුණු නිසා මුළු කාමරයම දවල් කාලයේදී මෙන් හොඳට ආලෝක වුණා. අලෝෂා ඇඳුම් ඇඳගැනිමට පටන්ගත් විට, කිකිළිය ඔහුට කබාය දුන්නා.

අලෝෂා ඇඳුම් ඇඳගත්ත හැටියේම කළු කිකිළිය ආයෙමත් කෙකර ගෑවා. එවිට අර ඉටිපන්දම් සියල්ල අතුරුදහන් වුණා.

"මා පසසෙන් එන්න !" කිකිළිය ඔහුට කියුවා.

ඔහු කිකිළිය පසුපස බොහොම නිර්භීත ලෙස ගමන් කළා. කිකිළිය ගේ ඇස් දෙකින් ආලෝකයක් පිටවුණේ හරියට කුඩා ඉටිපන්දම් දෙකකින් ආලෝකය පිටවන විදිහටයි. දෙදෙනාම දොර ළඟට ආවා.

"දොරට යතුරු දාලා" එහෙම කියුවේ අලෝෂා ය.

කිකිළිය එයට පිළිතුරු නොදී අත්තටු ගැසුවා විතරයි යතුරු දමා තිබුණු දොර ඉබේටම ඇරුණා. මේ දෙදෙන මෙහෙම යන ගමන් අවුරුදු සියයක් බැගින් වයස් ගතවුණු ඕලන්ද ජාතික ආච්චිලා දෙදෙනා ඉන්න කාමරවලට ගියා. අලෝෂා මීට ඉස්සෙල්ලා ඒ කාමරවලට ගිහින් නැත. ඒගොල්ලන්ගෙ කාමරයේ අළුපාට ලොකු ගිරවෙකුයි, බොහොම නුවණ තියෙන පූසකුයි ඉන්නවා. ඒ පූසාට වළල්ලක් ඇතුළෙන් පැනලා යන්ට පුළුවනි. පූසා එයාගේ ඉස්සරහ ගාතය මිනිසුන්ට දිගු කරනවා. අලෝෂා බොහාම ආසාවෙන් හිටියා මේ සතුන්ව බලන්ට. කිකිළිය අත්තටු ගසාපු විගසම ඕලන්ද ජාතික ආච්චිලා දෙදෙනා ඉන්න කාමරයේ දොර ඇරුණා.

ඒ ගොල්ලන්ගෙ ඉස්සරහ කාමරයේ ඇති ඉතා පරණ බඩු මුට්ටු අලෝෂා දැක්කා, කැටයම් වැඩ දාපු පුටු, හාන්සි පුටු, මේස, අල්මාරි; නිල් පාට පිඟන් මැටිවලින් හදාපු මැස්සක් එහි තිබුණා. එහි ලස්සන සතුන්ගේ සහ මිනිසුන්ගේ රූප තියෙනවා. ඒ ගෙදර ඇති පුරාණ බඩු මුට්ටු සහ පිඟන් මැටියෙන් හදාපු නිදන මැස්ස බලන්ට ආලෝෂාට කල්ලී ඉඩ තැබුවේ නැහැ.

දෙවැනි කාමරයට මේ දෙදෙනා ඇතුළු වුණා. අලෝෂාට බොහොම ලොකු සතුටකි. ලස්සන රත්රන් කූඩුවක හිටියා අළුපාට ගිරවා. එයාගේ වලිගය රතු පාටයි. අලෝෂා ගිරවා ළඟට යන්ට ඉදිරිපත් වුණා. නමුත් ඒකට කල්ලී ඉඩ තැබුවේ නැහැ.

"මෙහෙ තියන කිසි දෙයක් අතින් අල්ලන්ට එපා. ආච්චිලා අවදි වේවි." කිකිළිය ඔහුට කියාපි.

ගිරවාට පසුපස සිහින් තිරයක එහා මහලු ආච්චි නිදා ඉන්න සැටි අලෝෂා දුටුවා. එයා හරියට ඉටියෙන් හදාපු රූපයක් වගේ සුදුමැලියි. අනික් ආච්චිත් ඒ වගේම ඇඳක් උඩ නිදාගෙන ඉන්නවා. එයා ළඟ හිටිය අළු පාට පූසා ඉස්සරහ ගාත්වලින් එයාගේ මූණ සෝදමින් හිටියා. අලෝෂා පූසා ළඟට ගිහින් "පූසො, පූසො, මට අත දෙන්න" යි කිව්වා. එතකොට එයා හයියෙන් ඈඳාවු

ගෑවා, ගිරවා හඬ නගලා "මෝඩයා! මෝඩයා!" කියලා කෑ ගැහැව්වා. එවිට මහලු ආච්චි නින්දෙන් අවදි වුණ සැටි පෙනුණා. කල්ලී ඉක්මනට යන විට, අලෝෂාත් එය පසු පසින් ඉක්මනට ගියා. ආච්චිලාගේ දොර ඉබේටම වැසුණා. ගිරවා "මෝඩ්ඩයා, මෝඩ්-ඩ්-ඩයා" කියලා කෑ ගසන සැටි තවමත් අලෝෂාට ඇහෙනවා.

"අලෝෂාට ලැජ්ජා නැතිද ! අලෝෂා, නුඹ සමහරවිට වීර සෙනෙවියන්ව අවදි කළා වෙන්ට ඕන..." එහෙම කියුවේ කල්ලී ය.

"මොන වීර සෙනවියන්ද ?" ඔහු ඇසුවා.

"ඔයාට බලන්නට හැකි වේවි. ඒ වුණාට බය වෙන්ට එපා. මාත් එක්ක බය නැතිව එන්ට."

දැන් දෙදෙනාම පාසල් ගොඩනැගිල්ලේ බිම්ගෙයි ඇති යට තට්ටුවට යනවා වගෙයි අලෝෂාට දැනෙන්නේ. ඔහු මීට පෙර දැකලා නැති වංගු සහ වට වංගු දිගේ දෙදෙනාම බොහෝ වේලාවක් ඇවිද්දා. මේ වංගු සහිත මාර්ග දිගයි, පටුයි, උසින් අඩුයි. ඒ නිසා අලෝෂාට වකුටු ගැහිලා, පිට කොන්ද නමාගෙන යන්ට සිදු වුණා. ඔන්න බොලේ හිටි හැටියේම මේ දෙදෙනා ආවේ පළිඟු වීදුරු ලාම්පු තුනකින් ආලෝක කරපු ලොකු ශාලාවකට. මේ ශාලාවේ ජනේල නැති. බිත්තිවල වීර සෙනවියෝ යකඩ ඇඳුම් සහ සපත්තු ඇඳගෙන එල්ලිලා ඉන්නවා. පිහාටු සහිත තොප්පි හිස දමා ගෙනැ, හෙල්ල සහ පළිහ අතින් ගෙනැ, යකඩ අත් වැසුම් පැළඳ ගෙනැ මේ සෙනවි වරු බිත්තියේ එල්ලී සිටියා.

කළු කිකිළිය ඇඟලි තුඩුවලින් ගමන් කරමින්, අලෝෂාටද ඉතාමත්ම ප්‍රවේසමින් නිහඬව යන ලෙස අයැද සිටියයා.

තඹ පාට දොරක් ශාලවේ කෙළවරෙහි විය. මේ දෙදෙනා එම දොර ළඟට ආවා විතරයි, එහි එල්ලී සිටි සෙනවිවරුන් දෙදෙනෙකුට පණ ඇවිත් ඔවුන් දෙදෙනා හෙල්ල සහ පළිහ ඔසවා ගෙන කළු කිකිළියට පහර දීමට ඉදිරිපත් වුණා. එවිට කළු කිකිළිය අත්තටු ගැහුවා විතරයි, ඈ විශාල ලොකු සතකු වෙලා සෙනවිවරුන්ට විරුද්ධව සටන් කරන්ට පටන් ගත්තා. සෙනවිවරු දෙදෙනා හෙල්ලවලින් පහර ගසමින් ඉදිරියට ගියාට කිකිළිය අත්තටුවලින් පහරවල් වළක්වාලා, හොටෙන් ඔවුනට ඇන්නා. අලෝෂා බොහොම බිය වුණු හන්දා ඔහුගේ හදවත ගැහෙන්නට පටන් ගත්තා. ඔහු සිහිසන් නැතිව බිම ඇද වැටුණා.

ඔහුට ආපසු සිහිය ලැබෙන විට, ඉරු එළිය කාමරයට වැටී තිබුණා. ඔහු ඇඳ මත වැතිර ඉන්නවා, කල්ලීත්, සෙනවිවරුනුත් පේන්නට හිටියේ නැහැ.

අලෝෂාට සිහිය ලැබී කල්පනා කරන්ට බොහෝ වේලාවක් ගතවුණා. ඔහුට වී තිබෙන්නේ මොනවාදැයි ඔහුට දැන ගැනීමට නොහැකිය. ඔහු දුටුවේ සිහිනයක්ද, නැතිනම් හැබෑටම එවැනි දෙයක් සිදු වුණාද ? ඔහු ඇඳුම් ඇඳගෙන උඩ තට්ටුවට ගියා. ඔහුට එම සිහිනය ගැන අමතක වුණේ නැහැ. ඔහු ගෙවත්තට ගිහිල්ලා සෙල්ලම් කිරීමට ඉඩක් ලැබෙන තුරු බලාගෙන සිටියේ නොඉවසිල්ලකිනි. එහෙත් එදා මුළු දවස තිස්සේම හිම පතනය තිබුණු හන්දා ඔහුට ගෙවත්තට ගොස් සෙල්ලම් කිරීමට ඉඩ ලැබුණේ නැහැ.

දවල් කෑම ගනිද්දී ගුරුතුමිය ගුරුතුමාට කිව්වා කළු කිකිළිය සැඟවිලා ය. හොයාගන්ට බැරිය කියලා.

"ඒක එතරම් ලොකු පාඩුවක් නොවෙයි. ඒ කිකිළිව මසට ගන්ට තීරණය කරලා ඉවරයි. ඔය කලු කිකිළි, මෙහාට ගෙනාපු දා ඉඳලා එකම බිත්තරයක්වත් දාලා නැහැ" ගුරුතුමිය ගුරුතුමාට කිව්වා.

කුස්සි අම්මාගේ අතට අහු වෙනවාට වැඩිය හොඳයි කල්ලී කොහේ හරි හැංගිලා ඉන්න එක කියලා අලෝෂාට සිතුණා.

දවල් බතෙන් පසු අලෝෂා ආයෙමත් පංති කාමරවල තනි වුණා. ඊයේ රාත්‍රියෙහි දුටු හීනය ගැන ඔහු දිගින් දිගටම කල්පනා කළා. කල්ලීගේ නැති වීම ඔහුට විඳ දරාගෙන සිටිය නොහැකිය. එයාව නැති වුණාට ආයෙමත් අද රැයෙහි දකින සිහිනය තුළින් ඒ කිකිළිව දකිනවා කියන ස්ථිර හැඟීමක් අලෝෂාට ඇති විය. අපොයි, ඒ සිහිනය ආයෙමත් දකින්ට බැරි යැයි සිතූ ඔහු බොහොම කනගාටුවට පත් වුණා.

ඔන්න නිදා ගන්න වේලාව ආ හැටියේම ඔහු ඉක්මනට ඇඳ මත වැතිර ගත්තා. ඔහු ළඟ ඇති අනික් ඇඳට හඳ එළිය වැටිලා. ඊයේ රෑ වගේම ඒ ඇඳේ රෙද්ද සුළඟට වැනෙනවා. ඔන්න ඔහුට ඇහුණා ඔහුගේ නම කියලා කතා කරන සැටි. "අලෝෂා! අලෝෂා!" ටික වේලාවක් ගියා විතරයි ඇඳ යට හැංගිලා හිටිය කළු කිකිළිය ඇඳ උඩට නැංගා.

"ආයුබෝවන් කල්ලියේ, ඔයාව මට දකින්ට ලැබෙන්නේ නැතැයි කියලා මම බයෙන් හිටයා, ඔයාගේ සැප සනීප කොහොමද ?" අලෝෂා ඇසුවේ බොහොම ලොකු සතුටකිනි.

"මම සනීපෙයන්, නමුත් ඔය ළමයාගේ දඟකම් නිසා මට තව පොඩ්ඩෙන් වැඩ වරදින්ටයි ගියේ."

"අනේ කිකිළියේ, ඒ කොහොමද ?" අලෝෂා බයවෙලා ප්‍රශ්න කළා.

"ඔයා හොඳ ළමයා. නමුත් ඔයා කියන දේ එක වරම අහන්නේ නැහැ. ඊයේ මම ඔයා ළමයාට කිව්ව නෙව, මැහැල්ලන්ගේ කාමරවල තියෙන

කිසි දෙයක් අතින් අල්ලන්න එපයි කියල. ඔය ළමයා මහලු ආච්චිලාගේ කාමරයේදී පූසාගේ අතක් අල්ලන්ට ගියා. ඉතින් පූසාට ඇහැරුණාම, ගිරවාටත් ඇහැරුණා. ඔන්න ඒ වර මහලු ආච්චිලා අවදි වුණා. ආච්චිලා වීරයින්ව අවදි කළා. ඉතින් දැක්කා නේද මම ඒගොල්ලන් එක්ක යුද්ද කරපු හැටි !" කිකිළිය කියුවා.

"මම වැරදිකරුවා. මට සමාවෙන්න ! මම මීට පස්සෙ එහෙම දේවල් කරන්නේ නැහැ. ආයෙමත් අපි ඊයේ ගිය තැනට යමු. මම බොහොම කීකරුව ඉන්නම්."

"හොඳයි, අපි බලමුකො, ඔය ළමයගෙ කීකරුකම."

කළු කිකිළිය අත්තටු ගැසුවා විතරයි, ඊයේ වගේම රිදී රිටි වල ඉටිපන්දම් දැල්වුණා. අලෝෂා ආයෙමත් ඇඳුම් ඇඳ ගත්තා. ඒ දෙන්නා නැවත මහලු ආච්චිලාගේ කාමරවලට ගියා. ඒ වර ඔහු කිසිම දෙයක් අතින් ඇල්ලුවේ නැහැ.

පළමුවැනි කාමරය තුළින් ගමන් කරන විට, ගිනි තපින උඳුන ළඟ මැස්සේ ඇඳලා ඇති මිනිසුන්ගේ හා සතුන්ගේ රූපවලට පණ ඇවිත්, ඒ ගොල්ල අලෝෂා දිහා බලලා මඳ සිනා පානවා, ඔහුව ඒගොල්ලන් වෙතට ඇද ගැනීමට වෑයම් කරනවා. එවිට අලෝෂා වුවමනාවෙන්ම අහක බලාගත්තා. දෙවැනි කාමරයේ පෙර දවසේදී මෙන්ම ඕලන්ද මහලු ආච්චිලා නිදා හිටියේ හරියට සුදුමැලි ඉටි රූප වගෙයි. ගිරවා අලෝෂා දෙස බලා ඉඟි මැරුවා, පූසා අත ලෙව කකා මූණ සෝදනවා වගේ අත මූණෙහි ගා ගත්තා. ඊයේ අලෝෂා නොදැකපු චීන පිඟන් බෝනික්කෝ දෙදෙනෙක් මේසය උඩ තිබෙන සැටි දැකපි. බෝනික්කෝ දෙන්නා අලෝෂා දෙස බලා හිස පාත් කළා. කළු කිකිළියගේ නියමය මතක් වුණ නිසා ඔහු හිටින්නේ නැතිව යන්ට ගියා. යන ගමන් ඔහු බෝනික්කන්ට හිස නමා ආචාර කළා. ඔන්න ඒ පාර චීන බෝනික්කෝ දෙදෙනො මේසයෙන් බිමට පැනලා අලෝෂා පස්සේ දුවමින් හිස වනන්ට පටන් ගත්තා. අලෝෂා නැවතිලා ඔවුන් දෙස බලන්ට ලෑස්ති වන විටම කල්ලී ඔහු දෙස ඔරවලා බැලුවා. දොර ළඟට ගිය බෝනික්කෝ දෙදෙනා අලෝෂා ඔවුන් දෙස නොබලන සැටි දැක ආපහු සිටි තැනටම ආවා.

නැවත අලෝෂායි කල්ලීයි පඩි පෙළ ඔස්සේ බිම් ගෙට බැහැලා එහි වට වංගු දිගේ ඒ අත මේ අත ගමන් කළා. ඉස්සෙල්ලා දවසේදී මෙන්ම පළිඟු ලාම්පු තියෙන මහා ශාලාවට පැමිණියා. එහි බිත්තිවල සෙනවියන්ගේ රූප එල්ලා තිබුණා. තඹවන් දොර ළඟට යන විට ඊයේ වගේම අදත් සෙනවිවරුන් දෙදෙනා හෙල්ල අරගෙන සටනට ආවාට මොකද ඊයේ වගේ තරහා

වෙලා හිටියේ නැහැ. ඒ ගොල්ල නිදිමත හැදිච්ච මැස්සන් වගේ බොහොම අමාරුවෙන් තමයි හෙල්ල ඔසවා සටනට ආවේ.

කල්ලි එක වරම ලොකු සතකු වෙලා අත්තටුවලින් ගහලා සෙනවිවරුන්ව බිම වැට්ටෙව්වා විතරක් නොවෙයි; ඒ ගොල්ලන්ව කෑලි කෑලිවලට වීසි වෙලා ගියා, තඹවන් දොර ඉබේටම ඇරිලා දෙදෙනාට යාමට ඉඩ සලසා දුන්නා.

ඊළඟට ඒ දෙදෙනා ආවේ ඉඩකඩ ඇති නමුත් අලෝෂාට අතින් සීලිම අල්ලීමට තරම් පුලුවන්, උස නැති කාමරයකටයි.ඒ කාමරයේත් කුඩා ඉටිපන්දම් ආලෝක කැරලා තිබුණා. එහෙත් රිටි රිදී නොවෙයි, රත්තරන්.

එතැනදි කල්ලි අලෝෂාට මෙහෙම කියුවා:

"මෙතන පොඩ්ඩකට ඉන්න. මම ඉක්මනට එන්නම්. චීන බෝනික්කන්ට හිස නමා ආචාර කරලා ප්‍රවේසම් නොවන විධියට වැඩ කළා වුණත් අද ඔය ළමයා හොඳට හැසුරුණා. හිස නමන්නේ නැතිව ගියා නම් අර සෙනවිවරුන් බිත්තියේ එල්ලිලා ඉන්නවා ඇති. අද ඔය ළමයා මහලු ආච්චිලාව අවදි කළේ නැති නිසා තමයි, අර සෙනවිවරු අද බොහාම පණ නැති විදිහට සටන් කළේ.'' මෙහෙම කියලා කිකිළිය පිට වී ගියා.

ශාලාවේ තනි වුණ අලෝෂා එය නරඹන්ට පටන් ගත්තා. එම කාමරයේ බිත්ති කිරි ගරුඬෙන් හදලා තියෙන හැඩයි. දොර ජනේල ඉතා හොඳ රත්රන් වලින් හදලා. ශාලාව කෙළවරේ කොළ පාට රෙදි පියස්ස යට උසැති තැනක රනින් කළ සිහසුනක් තිබුණා. එහි සැරසිලි වලට අලෝෂා බොහොම කැමති වුණා. ඔහුට පෙනුණේ, එහි හැම දෙයක්ම කුඩා බෝනික්කන් සඳහා හදලා තියෙන බවයි.

ඔහු ඒවායේ ලස්සන බල බලා ඉන්නා විට, ඔහු ඉස්සෙල්ලා නොදුටු දොරක් එක් පැත්තකින් ඇරුණා. අඩි දෙකක් විතර උසැති මිනිස්සු ගොඩක් නොයෙක් පාටැති ඇඳුම් ඇඳගෙන කාමරයට ඇතුළු වුණා. ඒ ගොල්ලො බොහොම වැදගත් පෙනුමක් මවා ගෙන හිටියා. සමහරු යුද්ධ නිලධාරී, සමහරු සිවිල් නිලධාරී. හැම දෙනාම පිහාටු ඇති තොප්පි හිස පැළඳගෙන හිටියා. ඒ ගොල්ල අලෝෂා දෙස නොබලා වැදගත් ලෙස කාමර ගානේ ඇවිදිමින් කතා බහ කළා. ඒ ගොල්ලන්ගේ කතාව අලෝෂාට තෝරා ගැනිමට බැරි වුණා.

ඔහු ඒ ගොල්ලන් දෙස බොහෝ වේලාවක් බලාගෙන ඉඳලා, ප්‍රශ්නයක් අහන්ට එක්කෙනෙකු ළඟට ගියා විතරයි, ශාලවේ අයිනේ තිබුණ ලොකු දොර විවෘත වුණා... කුරු මිනිස්සු ටික නිහඬ වෙලා, පේළි දෙකකට සිටගෙන හිස් වැසුම් සියල්ල අතට ගත්තා.

පිහාටු සහිත තොප්පි හිස ලාගත්, රත්තරන් සැට්ට ඇඳ ගත් කුඩා සෙනවිවරුන් විසි දෙනෙක් දෙදෙනා බැගින් සෙමින් පා නගා ගමන් කළා. පසුව සිංහාසනය දෙපැත්තේ ඒ ගොල්ල නිහඬව සිට ගත්තා. ඊට ටික වේලාවකට පසුව, ඔටුන්නක් හිස පැළඳගෙන රාජකීය විදිහට කෙනෙක් ආවා. එයාගේ ඇඳුමට මුතු මැණික් අල්ලා තිබුණා. එයාගේ ලෝගුව ළා කහ පාටයි. එයා ඔසවා ගෙන ආවේ පොඩි ළමයින් විසිදෙනෙකු විසිනි.

එයා තමා මේ රටේ රජ්ජුරුවෝ. අලෝෂා රජුට හිස නමා ආචාර කළා. රජු බොහාම සතුටින් හිස වනලා සිංහාසනය මත වාඩි වුණා. රජු ළඟ හිටිය සෙනවියකුට මොනවදෝ කිව්වා. ඔහු අලෝෂා ළඟට ඇවිත් රජුගේ සිංහාසනය ළඟට ළං වෙන්ටයි කියා දන්වා හිටියා. අලෝෂා එය ඉටු කළා.

"මම දැනගෙන හිටියා නුඹ හොඳ ළමයකු බව. තුන්වැනිදා නුඹ මගේ රටේ ජනතාවට ලොකු සේවයක් කළා. නුඹට සම්මාන දිය යුතුයි. මගේ ප්‍රධාන ඇමතියාව නුඹ වැළැක්විමට බැරි ඉතා භයානක මරණයෙන් බේරාගත්තා කියලා ඔහු මට දැනුම් දුන්නා."

"කවදාද ?" මවිත වුනු අලෝෂා ඇසුවා.

"තුන්වැනි දා ගෙවත්තේදී. මෙන්න මෙයාගෙ ජීවිතය තමා ඔය ළමයා බේරා ගත්තේ."

රජ්ජුරුවෝ පෙන්නාපු මිනිහා දිහා අලෝෂා බැලුවා. ඒ මිනිහා කළුම කලු පාට ඇඳුමක් ඇඳලා හිටියා. ඔහුගේ හිස මත තිබුණු තොප්පිය කුකුල් කරමලයක් වගේ රතු පාටයි. එයාගේ බෙල්ල වටේට සුදු පාට පටියක්. ඒ පටියට බොහොම කැඳ දමලා වගෙයි. ඔහු අලෝෂා දිහා බලාලා සතුටු ලෙස සිනා වුණා. එයාව දැකලා තියෙන බව අලෝෂාට මතකයි වගේ, නමුත් කොහෙද කියලා කියන්ට බැහැ.

මේ තරම් උතුම් උදාර ක්‍රියාවක් අලෝෂාගේ නමට පැටවීම ගැන ඔහු කැමති වුණා. ඒ වගේම ඔහු ඇත්තටත් කැමතියි. ඒ නිසා රජුට නමස්කාර කරලා මෙහෙම කිව්වා.

"මහ රජතුමනි! මා නොකළ දෙයක් මා කළැයි කියලා මට පිළිගැනීමට බැරිය. තුන් වැනිදා මා පණ බේරා දුන්නේ ඇමතිවරයාට නොවේ. අපේ ගෙවත්තේ ඇවිදිමින් සිට කළු කිකිළියටයි. අපේ කුස්සි අම්මා ඒ කිකිළියට කැමති නැත්තේ, එයා එකම දවසක්වත් බිත්තර දාපු නැති නිසයි..."

"කොල්ලා, නුඹ මොනවා දොඩවනවාද !" රජතුමා කේන්තියෙන් කතා කළා. "එයා කිකිළියක් නොවෙයි, ඇමතිවරයෙක්."



අන්න එවිට ඇමතිවරයා ඉදිරියට ආවා. මේ ඇමතිවරයා කළ කිකිළිය බව ඒ වර සැක හැර අලෝෂාට පෙනුණා. ඔහු බොහොම සතුටු වෙලා රජුගෙන් සමාව ඉල්ලා සිටියා. ඒ වුණාට කිකිළිය ඇමති වුණ හැටි නම් අලෝෂාට කොහොමටවත් තේරුම් ගන්ට බැරි වුණා.

"ඔයා ළමයාට ඕන මොනවාද ? මට ශක්තිය ඇති පමණින් එය ඉටු කරන්නම්" රජතුමා කිව්වා.

"අලෝෂා බය නැතුව ඉල්ලන්න !" ඇමතිවරයා ඔහුගේ කනට කොඳුරා කියාපි.

අලෝෂා කල්පනා කළාට ඉල්ලන්ට ඕන මොනවද කියල ඔහුට සිතා ගන්නටවත් බැහැ. මොනවා හරි හොඳ දෙයක් ඉල්ලන්ට ඕනයි කියලා කල්පනා කළාට මොකද, රජතුමා බලාගෙන ඉන්න නිසා ඉක්මනට පිළිතුරු දුන්නාඃ

"පාඩම් නොකළත් හැමදාම පාඩම දැනගෙන සිටීමේ බලය මට ලැබෙන්ඩ හොඳයි."

"මම සිතුවේ නැහැ ඔය ළමයා ඔය තරම් කැම්මැලියෙක් කියලා, හොඳයි දැන් ඉතින් කරන්ට දෙයක් නැහැ. මම එය ඉටු කරන්නම්."

රජතුමා අත වැනුවා විතරයි, රාජ දූතයෙක් රන් පිඟානක් ගෙනාවා. එහි එකම එක වී ඇටයක් තිබුණා.

"මේ වී ඇටය ගන්න. මේ වී ඇටය ඔය ළමයා ළඟ තිබෙන තුරු හැම දෙයක්ම ඔයාට පාඩම් හිටීවි. හැබැයි ඒක කොන්දේසියක් උඩයි. මෙහි දැකපු දේවලුත් පසුව දකින දේවලුත් කිසිම කෙනෙකුට නොකිව යුතුයි. පුරසාරම් දෙඩවීම යම්තමින් වත් කළොත් නුඹට අපේ ආධාරය නැති වී යාවි, ඒ වගේම අපටත් කරදර වලට මූණ පෑමට සිදු වේවි."

අලෝෂා වී ඇටය කඩදාසි කොළයක ඔතාගෙනැ එය සාක්කුවේ දමා ගත්තා, නිහඬව චාම් ලෙස ඉන්නා බවට ඔහු පොරොන්දු වුණා. රජතුමා සිහසුනෙන් නැගිට ශාලාවෙන් පිටවෙලා ගියා. අලෝෂාට බොහොම ජයට කෑම බීම සපයන්ටයි කියලා රජතුමා ඊට පෙර ආඥාවක් නිකුත් කළා.

රජතුමා ශාලාවෙන් පිටතට ගිය විගස ප්‍රභුවරු සහ අනිත් ලොකු ලොක්කෝ අලෝෂාව වට කැරගෙන එයාට ස්තුති කරන්ට වුණා. ඇමතිවරයාව බේරා ගැනීම නිසා එයට ස්තුති කළා. හැම දෙනෙක්ම ඔහුට උදවු කිරීමට ඉදිරිපත් වුණා. රජ මල් වත්තේ ඇවිදීමට කැමතිද, නැතිනම් රජුගේ සත්තු වත්ත බැලීමට කැමතිද කියල ඔහුගෙන් ඇසුවා. තවත් අය අලෝෂාට දඩයම් කිරීමට එන ලෙස ආරාධනා කළා. අලෝෂාට තීරණයක් ගැනීම

ලෙහෙසි වුණේ නැහැ. රජතුමාට අයත් බිම් ගෙවල්වල වට වංගු අලෝෂාට පෙන්වීමට ඇමතිවරයා ඉදිරිපත් වුණේ එවිටයි.

ඉස්සෙල්ලාම ඇමතිවරයා අලෝෂාත් කැටුව රජ මල් වත්තට ගියා. එහි මාර්ග වෙන් කරලා තිබුණේ, ලස්සන පාට ඇති ගල් කැටවලින්, පුංචි ගස්වලට දිලිසෙන මුතු මැණික් අල්ලා තිබුණා. මෙලෙස දිලිසෙන ආලෝකය නිසා අලෝෂා බොහොම සතුටු වුණා.

"මේ ගල් කැට නුඹලාගේ මනුස්ස ලෝකයේ බෙරලියන්තු, මැණික්, රතු කැට, පුෂ්පරාග ආදී නම්වලින් හඳුන්වනවා", එහෙම කියුවේ ඇමතිවරයා හෙවත් කල්ලී.

"හොඳයි අපේ රටේත් ඔය ගල් කැට මහා පාරට දැමුවොත් !" මෙහෙම ඇහුවේ අලෝෂා.

"එහෙනම් නුඹලාගේ රටේත් ඒවා ඒ වගේම අඩු වටිනාකමක් ඇති වේවි!" ඇමතිවරයා කිව්වා.

රජ මල් වත්තේ ගස් ද බොහොම ලස්සනයි. ඒවා නොයෙක් පාටවලින් දිලිසෙනවා. රතු, කොළ, දුඹුරු, සුදු, නිල්, දම් ආදී පාටවලින්, ඒවා කුඩා දිලිසෙන ගල් කැට සහිත පත් වර්ගයක් බව ඔහුට පෙනුණේ, ඔහු ඒවා දෙස හොඳින් බලන විටයි. ඒවාට රජතුමා විශාල මුදලක් ගෙවලා ඈත පාතාල රටකින් ගෙනා බව ඇමතිවරයා අලෝෂාට දැන්වූවා.

ඉන් පස්සේ මේ දෙන්නා ගියේ සත්තු වත්තට යි. රත්රන් දැම්වැල් වලින් බැඳ තිබුණු වන සතුන් අලෝෂාට පෙන්වූවා. ඒ වුණත් මේ වන සතුන් හැටියට අල්ලා ගෙනැවිත් ඉන්නේ ලොකු ඌරු මීයෝ, උරගයෝ වැනි එවුන් කියන එක අලෝෂාට තේරුම් ගියේ එයා උන් දෙස හොඳින් බැලූ නිසයි. අලෝෂාට මේ නිසා හිනා යන්ට ගියත්, ඔහු වචනයක්වත් නොකියා නිහඬව හිටියා.

රජ මල් වත්ත සහ සත්තු බලා ලා ශාලාවට එන විට, කෑම මේසය ලෑස්ති කරලා තිබුණා. එතැන නොයෙක් වර්ගවලට අයත් චොකලට්, සීනිබෝල, කේක්, පලතුරු ආදිය තියෙනවා. පිඟන් රත්රන්වලින් හදලා. බෝතල සේරම සාදා තියෙන්නේ මුතු මැණික් සහ වටිනා ගල් වර්ගවලින්.

"ඕන තරම් කන්න. හැබැයි ගෙදර ගෙනියන්ට අවසර නැත." එහෙම කියුවේ ඇමතිවරයා.

අලෝෂා එදා හොඳට කා, බී සිටි නිසා ඔහුට බඩගිනි දැනුණේ නැහැ.

"ඇමතිතුමා මාව දඩයම්වලටත් ගෙනියනවා කිව්වා නේද ?" අලෝෂා ඇසුවා.

"බොහොම හරි. දැනටමත් අපට අශ්වයින් ලෑස්ති කරලා ඇති."

ඔන්න ඒ පාර දෙදෙනාම අස්ව ඉස්තාලෙට ගියා. එතන ලස්සනට සරසපු අශ්වයෝ ඉන්නවා. ඇමතියා බොහොම කඩිසර ලෙස එයාගේ අස්පයා පිටට නැග ගත්තා. ඒවා හැබෑ අශ්වයින් නොවෙයි. සෙල්ලම් අශ්වයෝ. අශ්ව ඔලු වලට රිටි සවි කරලා. අලෝෂාට දුන්නෙ අශ්ව ඔලුවක් සහ ලොකු රිටක් ඇති 'අශ්වයෙක්.'

"ප්‍රවේෂම් වෙන්න. අශ්වයා ඔය ළමයාව වීසි කරලා දාවි. ඌ කුලප්පු සතෙක්!" ඇමතිවරයා කළේ අනතුරු ඇඟවීමක්.

අස්ප ඔලුවට සවි කරලා තියෙන රිට කකුල් දෙක අතරට දමා ගන්නා විට, අලෝෂා සිත ඇතුළෙන් හිනා වුණා. නමුත් ඒ අස්ප රිට ඒ අත මේ අත නැමෙන්ට වුණාම, ඇමතිවරයාගේ අනතුරු ඇඟවීම ඇත්තක් බව අලෝෂාට තේරුම් ගිය. රිට උඩ වාඩි වීමට ඔහුට පුලුවන් වුණේ බොහොම අමාරුවෙනි.

ඒ අතර පාතාල ලෝකයේ බොහෝ වටවංගු හා මාර්ගවලින් අසුන් පන්නලා දඩයම් කිරීම පටන් ගත්තේ නළාව පිඹපු හැටියේමයි. අනිත් අය අස්ප ඔලු සහිත රිටිවලට දෙපය හිර කැරගෙන උඩ පැන පැන ගියා. අලෝෂාට එයාගේ රිට නවත්වා ගන්ට පුළුවන් වුණේ බොහොම අමාරුවෙන්.

හිටි හැටියේම එක මුල්ලක ඉඳලා ලොකු ඌරු මීයන් ගොඩක් ඉදිරියට පැන්නා. අලෝෂා එතරම් විශාල ඌරු මියන් ඊට ඉස්සෙල්ලා දැකලා නැහැ. උන් අසලින් දිව යන්ටයි ගියේ. නමුත් ඇමතිවරයා මීයන්ව වටලන ලෙස අණ කළා. එවිට ඌරු මීයෝ නැවතී වීරයින් ලෙස සටන් කරපි. එසේ වුණත් දඩයම් කරුවන් නිර්භයකම සහ දක්ෂතාවය පෙන්වලා සටන් කළා. මියන් අට දෙනෙක් එතැනම මළා. තුන් දෙනෙක් පැන දිව්වා. බරපතළ තුවාල ලබාපු එක මීයකුව අල්ලා උගේ තුවාල සුව කරලා ඌ සත්තු වත්තට යවන ලෙස ඇමතියා අණ කළා.

දඩයම් අවසන් වන විට, අලෝෂා කොතරම් විඩාපත් වුණාදැයි කියනවා නම් ඔහුගේ දෙනෙත් තද නිදිමත නිසා ඉබේටම වැහුණා. එපමණක් නොවෙයි, අලෝෂා ට වුවමනා වුණා කළු කිකිළිය හෙවත් ඇමතිවරයා සමග විස්තර කතා කරන්ට. දඩයමේ යාමට ඉස්සෙල්ලා හිටිය ශාලාවට එන්ට ඕනයි කියලා අලෝෂා කියුවා. ඇමතිවරයා එයට එකඟ වුණා.

ඒ ගොල්ල අශ්වයින් පන්නා ගෙන ආපහු මහා ශාලාවට ගිහිල්ලා, අශවයින්ව ඉස්තාලෙට බාර දුන්නා. රජ ගෙදර ලොක්කන්ට සහ

දඩයක්කාරයින්ට ආචාර කළා. දෙදෙනාටම මූණට මූණ ලා වාඩිවෙලා සතුටු කතා පටන් ගත්තා.

"ඔය ගොල්ලන්ට කරදර නොකරන, ඔය ගොල්ලන්ගේ ගෙදරින් බොහෝ ඈත ජීවත් වන අර දුප්පත් මීයන්ව මරා දැම්මේ මොකද ?" අලෝෂා ඇහුවා.

"අපි ඒ උඟුරු මීයන්ව විනාශ නොකළා නම්, අපව මේ කාමරවලින් පන්නා දමලා, උන් අපේ ආහාර ටිකත් කාලා දමාවි, ඒ විතරක් නොවෙයි. මීයන්ගේ සහ උඟුරු මීයන්ගේ ලොම් බොහොම වටිනවා, ඒ ලොම් අඳින්ට අවසර දීල තියෙන්නෙ විශේෂ වැදගත් අයටයි.''

"ඔය ගොල්ල කවුරුන්දැයි මට කරුණාකරලා කියන්ට පුලුවන්ද ?" අලෝෂා ඇහුවා.

"පාතාල ලෝකයේ ජීවත් වන අපේ මිනිසුන් ගැන ඔය ළමයා හැබෑටම අහලා නැද්ද ? ඇත්ත තමා අපව දැකලා තියෙන්නෙ ටික දෙනෙක් විතරයි. බොහොම ඉස්සර කාලෙ නම් අපි එළිමහනට ඇවිත් මිනිසුන් ඉදිරියේ පෙනී හිටිලා තියෙනවා. දැන් එය සිදු වන්නේ ඉතාමත්ම කලාතුරකින්. මොකද හේතුව දන්නවද, මිනිස්සුන්ගේ චාම් කම දැන් නැත්තටම වාගේ නැතිවෙලා. ඔන්න අප ගැන දන්න කෙනෙක් ඒ රහස හෙළි කළොත් අපට සිද්ද වෙනවා, අප ජීවත් වන තැනින් වෙනත් ඈත, බොහෝ ඈත රටකට යාමට. ඔය ළමයා මොහොතකට කල්පනා කර බලන්න, මේ පාතාලයේ තියෙන සියලු ගොඩනැගිලි ආදිය අත හැරලා රට වැසියනුත් සමග වෙනත් රටකට යාම ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. ඒ නිසා මම ඔයා ළමයාගෙන් ඉල්ලා හිටිනවා, පුළුවන් තරම් හොඳින් මේ රහස ආරක්සා කරන්ට කියලා. නැති නම් ඔය ළමයා අපේ රටවැසියන් අවාසනාවන්ත, විශේෂයෙන් මාව, බොහොම අවාසනාවන්ත කෙනෙකු කරාවි. රජුට අලෝෂාව පිළිගන්ටයි කියලා කිව්වේ මා ය. අලෝෂාගේ කට මැත දෙඩවීම නිසා අපට මෙතැනින් යන්ට සිදු වුවහොත් රජතුමා මට කිසිම දවසක සමාව නොදනු ඇති..."

"මම ඔබට දිවුරා පොරොන්දු වෙන්නම්. ඔබගෙ රට සහ මිනිසුන් ගැන කිසිවකුට කියන්නේ නැහැ. මට මතකයි, මම එක පොතක් කියැව්වා. පාතාල ලෝකයේ වාසය කරන වාමනයින් ගැන ඒ පොතේ විස්තර කරලා තබුණා. අපේ ලෝකයේ එක සපත්තු මහන්නෙක් බොහෝ ම පොහොසත් වුණා. පසුව දැන ගත්තා ඔහු වාමනයින්ට සපත්තු විකුණලා බොහොම ගොඩක් මිල මුදල් සහ වස්තු ලබා ගත් බව."

"සමහර විට එය ඇත්ත වෙන්ට පුළුවනි," ඇමතිවරයා කියුවා.

"හොඳයි, මට එක කරුණක් විස්තර කරන්න. ඔබ පාතාල ලෝකයේ අමතිවරයකු වෙලා ඉන්න අතරම අපේ ලෝකයේ කිකිළියක් වෙලා ඉන්නේ කොහොමද ? ඕලන්ද ජාතික මහලු ආච්චිලා සමග ඔබට ඇති සම්බන්ධකම් මොනවාද ?"

කළු කිකිළිය හෙවත් ඇමතිවරයා අලෝෂාගේ කුතුහලයට සෑහෙන පිළිතුරක් දිමට දිග විස්තරයක් කරන්ට පටන් ගත්තා විතරයි, අලෝෂාට තද නිදිමතක් හැදිලා ඔහු තද නින්දකින් නිදා ගත්තා. පහුවදා උදේ අවදි වුණ අලෝෂා ඇඳ මත වැතිර සිටියා.

ඔහු දුටු සිහිනය ගැන ඔහු කල්පනා කළාට ඔහුට හරි හැටි තෝරා-බේරා ගන්ට බැරි වුණේ ඔහුට මොනවා වෙලාද කියන එක ගැනයි. ඇමතිවරයා හෙවත් කළු කිකිළිය, රජතුමා, සෙනවිවරු, ඕලන්ද ජාතික මහලු ආච්චිලා, ඌරු මීයෝ, මේවා හැම දෙයක්ම අලෝෂාගේ හිසේ එකට මුසු වෙලා, ඊයේ රෑ ඔහු දුටු සිහිනය ගැන ඔහු නැවත කල්පනා කළා. එවිට ඔහුට එක වරම මතක් වුණේ. ඊයේ රාත්‍රී සිහිනය දකින විට රජතුමා දුන් වී ඇටය ගැනයි. ඔහු ඉක්මනට සාක්කුවට අත දමා හොයලා බලන විට, කඩදාසියක ඔතාපු වී ඇටය සාක්කුවේ තිබෙන බව දැන ගත්තා. "හොඳයි, අපි බලමුකො, රජතුමා කියපු විදිහට වැඩේ කරාවිද කියල ! හෙට පන්ති පටන් ගන්නවා. මම තවම එකම පාඩමක්වත් ඉගෙනගෙන නැහැ."

අලෝෂා වැඩියෙන්ම බය වුණේ ඉතිහාස පාඩම ගැනයි. ලෝක ඉතිහාසය ගැන පිටු කීපයක් ඉගෙන ගන්ට ඔහුට භාර දීලා තිබුණා. ඔහු එක වචනයක්වත් පාඩම් කර තිබුණේ නැහැ.

සඳුදා උදේ වන විට, ගෙවල් බලා ගිය සිසුවරු පාසලට පැමිණ හිටියා. පාඩම් පටන් ගත්තා.

අලෝෂාගේ හදවත සට සට ගාලා ගැහෙන්ට පටන් ගත්තා... ගුරුතුමා එයාගෙන් පාඩම් අහන්ට ඉස්සෙල්ලා අලෝෂා එයාගේ සාක්කුවේ තිබුණ වී ඇටය කීප වරක්ම අත ගාන්ට පටන් ගත්තා. ඔන්න ගුරුතුමා එයාට අඬ ගැසුවා. ඔහු ගුරුතමා ළඟට ආවේ මොනවා කියන්ටද කියාල දැනගෙන නොවෙයි. එහෙත් පුදුමයක මහත, ඔහු කට ඇරියා විතරයි, ඉබේම කට පාඩමින් පාඩම කියැවෙන්නට පටන් ගත්තා. එකම වචනයක්වත් අඩු වුණේ නැහැ. එකම වරදක්වත් සිදු වුණේ නැහැ. ගුරුතුමා බොහොම සතුටු වෙලා, අලෝෂාට ස්තුති කළා. එහෙත් සැබෑටම පාඩම් කරපුවාම තමාට ලැබෙන සිතේ සතුට මේ වර ඔහුට ලැබුණේ නැහැ. අලෝෂාගේ හිත ඇතුළෙ හඬක් කතා කරන්නට පටන් ගත්තා වගෙයි. ඔහුගේ සිතට සැබෑ සතුටක් ඇති නොවුණේ, ඔහු හැබෑටම පාඩම් කිරීමට මහන්සි නොවී, ගරු බුහුමන් ලබා

ගත්තු නිසයි. ඒවා බොරු ගරු බුහුමන් !

සති කීපයක් යනතුරුම ගුරුවරයා අලෝෂාට බොහොම ස්තුති කරන්ට පටන් ගත්තා. එයා සියලු පාඩම් කට පාඩමින් දැනගෙන හිටියා, එක භාෂාවකින් තවත් භාෂාවකට වචන පරිවර්තනය කරන විට කිසිම වැරැද්දක් නැතුව ඉතා අගේට පරිවර්තනය කළා. අලෝෂාට ලොකු කීර්තියක් ලැබුණු අතරම හිත ඇතුළෙ ඔහුගේ මේ ක්‍රියාව ගැන ඇති වෙච්ච ලජ්ජාව වැඩි වෙන්ට පටන් ගත්තා. අනිත් ළමයින්ට ආදර්ශයක් හැටියට ගුරුවරුන් පෙන්නුවේත් අලෝෂාවයි. මෙයත් ඔහුගේ හිත ඇතුළේ තිබෙන ලජ්ජාව වැඩ කළා.

හැමදාම රෑට නිදාගන්ට යන විට අලෝෂා කළු කිකිළිට හීනෙන් පෙනී සිටින ලෙස ඉල්ලා හිටියට, වී ඇටය ලැබුණු පළමුවැනි දවසේ ඉඳලා වඩාත් ඕනෑකමින් එලෙස ඉල්ලා හිටියට ඇමතිවරයා හීනෙන් පෙනී හිටියේ නැහැ. මුලදී ඔහු ලජ්ජාව නිසා කනගාටු වුණා. එහෙත් පසුව, කල් යන්නට පටන් ගත් විට, එහෙම බොරු කීර්තිය ලබාගැනීම වැදගත් දෙයක් ලෙස අලෝෂා කල්පනා කළා.

සියලුම පාඩම් කට පඩමින් දන්න මේ අරුම පුදුම ළමයා ගැන මුළු මහත් පිතර්බූර්ග් නගරය පුරාම කතා කරන්ට වුණා. පාසල්වල ලොකු අධිකාරි තුමා කිපවරක්ම මේ පාසලට ඇවිත්, අලෝෂාගේ දක්ෂතාවය නිසා ඔහුට බොහොම ප්‍රශංසා කළා. අලෝෂා නිසා පාසලට කීර්තිය ලැබෙන හන්දා ගුරුතුමා ඔහුට බොහොම ගරු කළා. නගරයේ හැම පෙදෙසෙකින්ම දෙමාපියන් ඇවිත් පාසල භාර ගුරුතුමාගෙන් ඉල්ලා හිටියේ, ඒ ගොල්ලන්ගෙ ළමයින්වත් ඒ පාසලට බාර ගන්ට කියලයි. ඒ ළමයිනුත් අලෝෂා වගේම කට පාඩමින් ඉගෙන ගනීවි කියලා ඒ දෙමාපියෝ විශ්වාස කළා.

ඔන්න ඉතින් ඉක්මනටම මුළු පාසලම සිසුන්ගෙන් පිරිලා. වෙන අලුත් ළමයින්ට ඉඩ නැහැ. ඒ හන්දා ගුරුතුමයි, ගුරුතුමියයි දැන් තියෙන ගොඩැනගිල්ලට වඩා බොහොම ලොකු ගොඩනැගිල්ලක් ගැනීමට කල්පනා කළා.

අලෝෂා මුලදී රජතුමා තමාට දුන් වී ඇටයේ බලය නිස ඉබේටම කට පාඩම් සිටීම ගැන බොහාම කනගාටු වුණාට, පසුව කල් යන්ට පටන් ගත්තම බොරු ප්‍රශංසාවට පුරුදු වුණා. ඊටත් පසුව ඔහුට කරන ප්‍රශංසා ඔහුට හැබෑවටම කළ යුතු දේ හැටියට පිළිගැනීමට තරම් ආඩම්බර කොල්ලෙක් බවට පත් වුණා. අලෝෂා තමා ගැන බොහොම සිතා ගෙන, අනිත් ළමයින් ඉදිරිපිට, මහ ලොකු අහංකාර වැදගත්කමක් මවා ගත්තා. අනිත් ළමයින්ට වඩා

බොහොම නුවණක්කාරයෙකැයි සිතා ගත්තා. මේ කරුණු නිසා අලෝෂාගේ චරිතයත් වෙනස් වෙලා, ඉස්සර ගුණ යහපත්, චාම් ළමයෙකුවැ සිටි ඔහු මහා ආඩම්බරකාර දඟ කරන කොල්ලකු බව පත් වුණා. එහෙත් ඔහුගේ හදවත ඔහුට කොඳුරා මෙහෙම කියන්ට පටන් ගත්තා: "අලෝෂා ආඩම්බර වෙන්ට එපා. නුඹ නොකරපු දේවලට ලැබෙන බොරු කීර්තිය හා ප්‍රශංසාව නිසා ආඩම්බර වෙන්ට එපා. ඉරණම විහින් නුඹට ලොකු වාසියක් ලබා දුන්න පලියට අනිත් ළමයින්ට වඩා නුඹ උසස් කියලා හිතන්ට එපා. නුඹ ඔය විදිහට හැසුරුණොත්, නුඹ සියලු පාඩම් කට පාඩමින් කියන්ට පුළුවන් උගතකු බවට පත් වුණත්, නුඹ බොහොම අවාසනාවන්ත කෙනෙකු බවට පත් වෙනවා!''

සමහර දවස්වලදී ඔහු තමාගේ වැරදි හදාගන්ට හිතා ගත්තට මොකද, ඔහුගේ අහංකාරකම බොහොම වැඩි වුණු නිසා ඔහුගේ හිත ඇතුළෙන් පැන නගින හඬට ඔහු සවන් දුන්නේ නැහැ. ඔහු ආඩම්බර වෙන්ට, වෙන්ට ඔහුගේ සගයෝ ඔහුගෙන් වැඩියෙන් ඈත් වුණා.

ඒ විතරක් නෙමෙයි, අලෝෂා වැඩියෙන් දඟ කරන්ට පටන් ගත්තා. අනිත් ළමයින් පොත් පාඩම් කරන විට, තමාට කරන්ට වැඩක් නැති නිසා ඔහු දඟ කරන්ට පටන් ගත්තා. ඔන්න ඔය ආකාරයට ඔහුගේ දඟකාරකම් නිසා ඔහු වඩාත් නරක ළමයෙක් විය.

ගුරුවරයාට පෙනුණා අලෝෂා ආඩම්බරකාර, නරක ළමයකු වී තිබෙන බව. ගුරුතුමා ඔහුට අනික් ළමයින්ට වඩා දෙතුන් ගුණයකින් වැඩියෙන් ගෙදර වැඩ නියම කළා. නමුත් ඒවායින් කිසිම ප්‍රයෝජනයක් වුණේ නැහැ. අලෝෂා පොතක් අතින් ඇල්ලුවේවත් නැහැ, ඒ වුණාට සියලුම පාඩම් මුල සිට අග දක්වා ඉතා හොඳින් දැනගෙන හිටියා.

ගුරුතුමා ඔහුට මොනවා කළ යුතුදැයි නොදන්නා නිසා, දවසක් දා පිටු විස්සක් කට පාඩම් කරන්ටයි කියලා ඔහුට නියම කළා. ගුරුතුමා සිතුවේ ඔහු එදාවත් දඟ නොකර හිටීවි යැයි කියලා.

කොහේද ! අලෝෂා පොත අතින්වත් ඇල්ලුවේ නැහැ. එදා ඔහු වඩාත් වැඩියෙන් දඟ කළා. පසුවදාට කට පාඩමින් පිටු විස්ස දැනගෙන හිටියේ නැති නම් දඬුවම් කරනවා කියලා ගුරුතුමා ඔහුට තරවටු කළා. සාක්කුවේ තියෙන වී ඇටය ඔහුට පිහිට වන බව දත් ඔහු හිත යටින් ගුරුතුමාට සිනා වුණා.

පසු දා නියමිත වේලාවට ගුරුතුමා පාඩම් පොත අතට ගෙනැ, අලෝෂාට කතා කරලා කිව්වා පාඩම කියන්නයි කියලා. සියලු ළමයි අලෝෂා දෙස බලාගෙන සිටිය අතර අලෝෂා ගුරුතුමා ළඟට ආවේ තමාගේ දක්ෂකම්

අදත් පෙන්වන්ට පුළුවනිය කියන විශ්වාසය ඇතිවයි. ඔහු ගුරුතුමා ළඟට වෙලා කට ඇරියාට මොකද වෙනදා වගේ වචන ගලා ගියේ නැහැ. වචන හිර වෙලා !

"නිහඬ වෙලා මොකද ? පාඩම කියනවා !" ගුරුතුමා අලෝෂාට කියුවා.

අලෝෂාගේ මුහුණ මුලදී රතු වූ අතර පසුව සුදුමැලි වෙලා අයෙමත් රතු වුණා. දෑත්වල ඇඟිලි මිරිකමින් සිටි ඔහුගේ දෙනෙත්වල කඳුළු කැට කඩා වැටිලා, බියෙන් වෙවුලන්නට පටන් ගත්තා... හැම දෙයක්ම නිකරුණේ ! එක වචනයක්වත් කතා කිරීමට ඔහුට නොහැකි වුණු අතර ඔහු පාඩම් පොත එක වාරයක්වත් නොබැලුවේ වී ඇටයේ පිහිට තිබෙන බවට විශ්වාසය කැරගෙන සිටි නිසයි.

"අලෝෂා, මේකේ තේරුම කුමක්ද ? නුඹ කතා නොකැරන්නේ මන්ද ?" ගුරුතුමා සැර වුණා.

මේ වගේ දෙයක් සිදු වෙතියි කියලා අලෝෂාට සිතින් සිතාගැනීමටවත් බැහැ. ඔහු සාක්කුවට අත දමලා වී ඇටය සෙව්වා. වී ඇටය සාක්කුවේ නැත ! ඔහුගේ තත්ත්වය ඉතාමත්ම නරක් වුණා. ඔහු සුසුම්ලමින් අඬන්ට පටන් ගත්තා. එනමුත් ඔහුට එක වචනයක්වත් කියන්නට නොහැකි විය.

ඒ අතරතුර ගුරුතුමාගේ ඉවසීම සිඳී ගියා. හැමදාම වචනයක්වත් වරද්දන්නේ නැතිව පාඩම කියන අලෝෂාට අද මොනවා වෙලාද! අඩු වශයෙන් ඔහු පාඩමේ මුල හරියවත් දැනගෙන සිටිය යුතුයි. ඒ නිසා ගුරුවරයා ඔහුගේ හැසිරීම ගණන් ගත්තේ මුරණ්ඩු කොල්ලකුගේ හැසිරීමක් හැටියටයි.

"පාඩම් ඉගෙන ගන්නා තුරු නිදාගන්න කාමරයට ගිහිල්ලා ඉන්න !" ගුරුතුමා ඔහුට අණ කළා.

අලෝෂාව පහළ තට්ටුවේ නිදාගන්න කාමරයට දමලා, ඔහු අතට පාඩම් පොතක් දීලා කාමරයේ දොර වසා දැම්මා.

ඔහු තනි වුණ හැටියේම, සාක්කුවේ තිබුණු වී ඇටය ආයෙමත් හොයන්ට පටන් ගත්තා. සාක්කු හොඳට අතගාලා බැලුවා. ඇඳ යට සොයලා බැලුවා. ඇඳ රෙද්ද, කොට්ට, මෙට්ට ගුදිරිය හැම තැනම සෙව්වා, නමුත් වී ඇටය තිබුණේ නැහැ. ඊයේ හවස ගෙවත්තේ සෙල්ලම් කරන විට, එම වී ඇටය නැති වුණායි කියලා ඔහු සිතා ගත්තා.

දැන් එම වී ඇටය හොයන්නේ කොහොමද ? ඔහුව කාමරය තුළට දමා දොර වසාලා ය. ගෙවත්තට ගිහිල්ලා සෙවුවත්, එම වී ඇටය සමහර විට

කුකුළෙක් කාලා ඇති. කර කියාගන්ට දෙයක් නොමැතිව ඔහු කළු කිකිළියට අඬ ගහන්ට පටන් ගත්තා :

"අනේ හොඳ කළු කිකිළියේ, මගේ හොඳ ඇමතිතුමනි ! මා ඉදිරියේ පෙනී හිටින්න ! මට වෙනත් වී ඇටයක් දෙන්න ! මීට පස්සෙ මම බොහොම ප්‍රවේසම් වෙනවා."

කිසිවෙක් ඔහුගේ ඉල්ලීමට කන් දුන්නේ නැහැ. අලෝෂාට ලොකු දුකක් සිතිලා ඔහු සුසුම්ලමින් ආයෙමත් ඇඬුවා.

ඒ අතර දවල් කෑමට වේලාවයි. දොර ඇරගෙන ගුරුතුමා ආවා.

"නුඹට දැන් පාඩම මතකද ?" ගුරුතුමා ඇහුවා. සුසුම්ලමින්ම අලෝෂා කිව්වේ පාඩම නොදන්නා බවයි.

"එහෙනම් මෙතනම වාඩිවෙලා පාඩම් කරපන් !" ගුරුතුමා මෙහෙම කියලා ඔහුට කළු පාන් කෑල්ලකුයි වතුරු වීදුරුවකුයි දෙන්ට නියම කරලා, අයෙමත් ඔහුව තනියම කාමරයෙහි දාලා දොර වැසුවා.

අලෝෂා කොච්චර කට පාඩම් කළත් ඔහුට පාඩම් මතක හිටියේ නැහැ. ඔහු බොහෝ කලක් තිස්සේ පාඩම් කරලා නැහැ. පොතේ පිටු විස්සක් කට පාඩම් කිරීමට කොච්චර මහන්සි ගත්තත් ඔහුට පිටු දෙකකට තුනකට වැඩිය පාඩම් කිරීමට බැරි වුණා. එයත් එතරම් හොඳ හැටි නොවෙයි.

හවස් වුණාම අනික් ළමයිනුත් නිදන කාමරයට ආවා. ඔවුන් සමග ආපු ගුරුතුමා ආයෙමත් අලෝෂාගෙන් ප්‍රශ්න කළා :

"අලෝෂාට දැන් කට පාඩම් තියෙනවද ?"

ඔහු ලජ්ජාවෙන් හෙමින් පිළිතුරු දුන්නා :

"පිටු දෙකක් විතරයි, කට පාඩම්."

"එහෙනම් හෙටත් මුළු දවසම මේ කාමරේට වෙලා පාන් කාලා ඇල් වතුර බීලා පාඩම් කරන්ට අලෝෂාට සිද්ද වේවි !" අනික් ළමයින්ට 'සුබ රාත්‍රියක් වේවා' කියලා ගුරුතුමා යන්ට ගියා.

අලෝෂා සහ අනික් පාසල් ළමයි ඉතුරු වුණා. ඉස්සර අලෝෂා බොහොම දයාන්විතයි, බොහොම චාම්. කීකරුව හිටපු කාලෙදි එයාට දඬුවම් දීපුවම ඔක්කොම ළමයි එයාට අනුකම්පා කළා. දැන් මේ වර එකම ළමයෙක්වත් එයාව ගණන් ගත්තේ නැහැ. හැම කෙනෙක්ම ඔහු දෙස බොහොම අමනාපයෙන් බැලුවා. කිසිම කෙනෙක් එයාත් එක්ක වචනයක්වත් කතා කළේ නැහැ.

ඉස්සර අලෝෂාත් එක්ක හොඳට යාළු වෙලා හිටිය ළමයකුත් එක්ක කතා කරන්නට එයා පටන් ගත්තා. නමුත් ඒ ළමයා කට වහගෙන හිටියා. ඒ පාර එයා තවත් ළමයකුට කතා කළා. එයත් වචනයක්වත් නොකියා කරබාගෙන හිටියා. ආයෙමත් අලෝෂා ඒ ළමයාත් එක්ක කතා කරන විට, ඒ ළමයා ලෑස්ති වුණේ එයාව තල්ලු කර දමන්ටයි. ඔහු අනික් ළමයින්ගේ හිත අමනාප වන විධියට කතා කළ නිසා ඔහුට ලැබුණු මෙම දඬුවම සුදුසු යැයි කියලා ඔහු සිතුවා. ඔහු කඳුළු පිරුණු ඇස්වලින් ඇඳ මත දිගා වුණාට ඔහුට නින්ද ගියේ නැහැ. ඔහු ඇඳේ වැතිර පහුගිය දවස් වලදී ඇති වූ සතුට ගැන කල්පනා කළේ ලොකු කනගාටුවකින්. අනිත් ළමයි සියලු දෙනාම සැපට නිදාගන සිටි අතර ඔහුට විතරක් කිසිම නින්දක් නැහැ. "අර කල්ලී මාව අත හැරලා දාලා ගියා." මෙහෙම හිතාපු හැටියේම එයාගේ දෙනෙත් ආයෙමත් කඳුලෙන් පිරුණා.

පළමුවැනි දවසේ කළු කිකිළිය රෑ හීනෙන් පෙනුණ දවසේදී මෙන්, ආයෙමත් පාරක් ඇඳ රෙද්ද සෙළවෙන්නට පටන් ගත්තා.

"කල්ලී ! කල්ලී !" ඔහු සෙමින් ඇයට කතා කළා.

ඇඳ රෙද්ද උඩට වීසිවෙලා කළු කිකිළිය පෙනී හිටියා.

"අනේ කල්ලී! මගේ සතුට වචනයෙන් කියන්ට බැහැ ! මම ඔයාව දකීවි කියලා විශ්වාස නැහැ. ඔයාට මාව අමතක වුණාද ?"

"නැහැ, මට ඔය ළමයා කරපු උදවුව අමතක වෙලා නැහැ. ඒ වුණාට මාව මරණයෙන් බේරා ගත්තු අලෝෂා නොවෙයි දැන් ඉන්නෙ. දැන් මේ ළමයා බොහොම වෙනස් වෙලා. එදා ඔයා හොඳ කරුණාවන්ත, චාම්, ගුණවත් ළමයෙක්වැ හිටියා. එදා අනික් ළමයි ඔයාට ආදරය කළා. දැන් නම් බොහොම වෙනස් ළමයෙක්. මට හඳුනාගන්නවත් බැහැ ! බොහොම අහංකාර කොල්ලෙක් !"

අලෝෂා බොහොම සුසුම්ලමින් ඇඬුවා. කළු කිකිළිය ඔහුට හොඳ නුවණ කියලා දුන්නා. එයා ඔහු සමග බොහොම වෙලා කතා කරලා හොඳට හැදෙන්ට කියලා බැගෑපත්ව ඔහුගෙන් ඉල්ලා හිටියා. උදෑසන එළිය වැටෙන්ට ඔන්න මෙන්න කියා තියෙන විට, කිකිළිය ඔහුට මෙහෙම කියුවා:

"දැන් ඉතින් මම ඔය ළමයාව අත හැරලා යන්නම්. මෙන්න මේ වී ඇටය ගෙවත්තේ තිබිලා මම ඇහිඳ ගත්තා. එය හැමදාටම නැති වුණායි කියලා සිතන්නට එපා. ඔයාගේ නොසැලකිලිකම නිසා ඔයා මේ වී ඇටය නැති කැරුගත්තාට අපේ රජතුමා බොහොම උදාර කෙනෙක්. මතක තියාගන්න අලෝෂා ඔබ අප පිළිබඳව රහස දන්නවා. ඒ රහස කිසිවකුට හෙළි කරන්න එපා. දැන් ඔය ළමයාට බොහොම නරක ගතිගුණ පුරුදු වෙලා තියෙනවා,

එයට තවත් කළගුණ නොසැලකීම වගේ නරක ගති එකතු කරගන්ට එපා !"

අලෝෂා ඉතාම සතුටින් වී ඇටය අතට ගෙන අරගෙන සියලු නරක ගති නැති කැරගෙන හොඳ ගති ඇති කැර ගැනීමට පොරොන්දු වුණා.

"අද ඉඳලා මම අමුතු ළමයෙක් බවට පත් වෙනවා. ඔයාටම බලාගත හැකියි." අලෝෂා කිවුවා.

"නරක ගති පුරුදු වුණාට පස්සේ ඒවායින් ඈත් වීම ලෙහෙසියි කියලා සිතන්ට එපා. නරක ගති ගුණවලට ඉතාම ලෙහෙසියි පුරුදු වෙන්ට, ඒ වගේම ඉතාම අමාරුයි ඒවායින් ඈත් වීමට. නරක ගතිවලින් ඈත් විමට ඉතා මහන්සියෙන් වීරිය වඩන්නට ඕන ! දැන් ඉතින් මම යන්නම්, ආයුබෝවන් !" කළු කිකිළිය එහෙම කියලා අතුරුදහන් වුණා.

අලෝෂා තනි වූ විගසම වී ඇටය අතට ඇරගෙන එය බලමින් බොහොම සතුටු වුණා. දැන් ඉතින් කිසිම දෙයක් පාඩම් කිරීමට වුවමනා නැහැ. මෙතෙක් වේලා ඔහු කනගාටු වුණු සැටි ඔහුටම අමතක වුණා. හෙට උදේට ඔහු පොතේ පිටු විස්සක්ම කට පාඩමින් එක හුස්මට කියන නිසා ඔහු ආඩම්බර වුණා. අනික් පාසල් ළමයින්ට වඩා ඉහළින් සිටීමට පුළුවන් වීම නිසා ඔහුගේ මානය තවත් ඔහුව සුරතල් කළා. තමාගේ නරක ගති නැති කැරගැනීම ඔහු කල්පනා කරලා මෙලෙස තමාටම කියා ගත්තා. "ඒක කළු කිකිළිය කියාපු තරම්ම අමාරු දෙයක් නොවෙයි. මට ඕන නම් හැම කෙනෙකුගේම ආදරය මට දිනාගත හැකියි. හොඳටත් නරකටත් දෙකටම මුල මා නොවේද !"

අනේ පවු. අලෝෂා එක දෙයක් දැනගෙන හිටියේ නැහැ. නරක ගති අතහැර දමන්ට නම්, කළ යුතු ප්‍රධාන දේ අහංකාරකම සහ ඕනෑවට වැඩි ආඩම්බරය නැති කළ යුතු බව.

පහුවදා උදේ ඔහුට පංති කාමරයට එන ලෙස දැනුම් දුන්නා. අලෝෂා පංතියට ඇතුලු වුණේ ලොකු ජයක් ලැබූ කෙනෙකු හැටියටයි.

ගුරුතුමා අලෝෂා දෙස දැඩි ලෙස බලා මෙලෙස ප්‍රශ්න කළාඃ

"පාඩම කට පාඩම් කළාද ?"

"ඔවු, මට දැන් කටපාඩමින් කියන්න පුළුවනි." බය නැතුව අලෝෂා පිළිතුරු දුන්නා.

ඔහු කට ඇරියා විතරයි, පිටු විස්සම කිසිම අඩුවක් නැතිව එක හුස්මට කියාගෙන ගියා. එක වචනයක්වත් වැරැද්දුවේ නැහැ. ගුරුතුමා බොහොම මවිත වෙලා බලාගෙන ඉන්නා විට, අලෝෂා ඔහුගේ සගයින් දෙස බැලුවේ ආඩම්බරයෙන්.

අලෝෂාගේ ආඩම්බර ඇස් දෙක දුටු ගුරුතුමා මෙහෙම ප්‍රශ්න කළා:

"ඔය ළමයා පාඩම් දන්නවා. එහෙනම් ඇයි ඊයේ එය කට පාඩමින් කීමට ඉදිරිපත් නූනේ ?"

"ඊයේ මට එය පාඩම් තිබුණේ නැහැ!"

''ඒක වෙන්ට බැහැ. ඊයේ ඔය ළමයා මට කිව්වා පිටු දෙකක් පාඩම් තියනවයි කියලා. එයත් ඒතරම් හොඳ හැටි පාඩම් නැතෙයි කිව්වා. දැන් එක වැරැද්දක්වත් නැතිව පිටු විස්සම කට පාඩමින් කිව්වා. පාඩම් ඉගෙන ගත්තේ කොයි වේලාවේදීද?

අලෝෂා කට වහගෙන හිටලා අන්තිමේදි වෙවුලන කට හඬකින් මෙසේ පිළිතුරු දුන්නා :

"මම කට පාඩම් කළේ අද උදේ !"

එවිට පංතියේ සිටිය සියලු ළමයි අලෝෂාගේ අහංකාරකම නිසා බොහාම තරහා වෙලා එකා මෙන් මෙහෙම කිව්වා :

"එයා බොරු කියනවා, අද උදේ එයා පොත අතින්වත් ඇල්ලුවේ නැහැ!

අලෝෂා තිගැස්සිලා බිම බලාගෙන හිටියා මිසක් වචනයක්වත් කතා කළේ නැහැ.

"උත්තර දෙනු ! කොයි වේලාවේද පාඩම් කළේ !" ගුරුවරයා සැර වුණා.

ඔහු දිගටම නිහඬව හිටියේ, ඔහු වෙත බලාපොරොත්තු රහිතව එල්ල වුණු ප්‍රශ්නය සහ අනිත් ළමයින් ඔහු කෙරෙහි දක්වූ අකාරුණික ගති නිසාය.

අලෝෂා පාඩම දැන සිටි අතර ඔහුගේ මුරණ්ඩුකම නිසා ඔහු ඊයේ එය නොකී බව සිතූ ගුරුවරයා ඔහුට දඬුවම් කිරීමට තීරණය කළා.

"නුඹට ස්වභාවධර්මයේ ඉතා උසස් තෑගි ලැබුණු පළියට අහංකාරවීමට අයිතියක් නැහැ. ඒ නිසාම නුඹ වඩාත් චාම් ලෙසත්, කීකරු ලෙසත් ජීවත් විය යුතුයි. නුඹට ලැබී තිබෙන නුවණ සහ දක්ෂකම නරක දේවල්වලට පාවිච්චි නොකළ යුතුයි. ඊයේ පාඩම නොදුන්නාට නුඹට දඬුවම් කරන්ට ඕන. අද ඒ මදිවට තවත් බොරු කී නිසා එම දඬුවම වැඩි කරන්ට ඕන. අලෝෂා හොඳ ළමයෙක් වන තුරු ඔය ළමයි එක්කෙනෙක්වත් ඔහු සමග කතා නොකළ යුතුයි. ඒ දඬුවම විතරක් මදි. ඒ නිසා ඔහුට වේවැල් පහර දිය යුතුයි. වේවැල ගෙන්න!

වේවැල ගෙනා විට, අලෝෂා කෝපයෙන් සහ බියෙන් පිස්සු වැටුණා වගේ හිටියා. පාසල පටන් ගත් දා සිට පළමුවැනිවරට වේවැල් පහරදීමක් තීරණය කරලා. කාටද මෙම පහරදීම කරන්නට යන්නේ. තමා ගැනම

බොහොම හිතපු, අනික් ළමයින්ට වඩා තමා බොහොම දක්ෂ යැයි හිතපු අලෝෂාට වේවැල් පහර දීමට යනවා. කොතරම් ලොකු ලජ්ජාවක්ද !...

ඔහු ගුරුතුමා ළඟට ගිහිල්ලා මීන් මතු හොඳින් ඉන්න බවට පොරොන්දු වුණා.

"ඒ ගැන කල්පනා කරන්ට තිබුණේ ඉස්සෙල්ලා." ගුරුතුමා කියුවා.

අලෝෂා අඬමින් පසුතැවිලි වන සැටි දුටු අනික් ළමයින්ට ඔහු ගැන දුකක් ඇති වුණා. එවර ඔහු තවත් හයියෙන් අඬන්ට පටන් ගත්තා.

"හොඳයි, අනික් ළමයි සේරමල්ලා නුඹට දඬුවම් නොකරන ලෙස ඉල්ලා සිටින නිස මම දඬුවම් කරන්නේ නැහැ. නමුත් අලෝෂා අපට සියලු දෙනාටම කියන්ට ඕන. කොයි වේලාවෙද පාඩම් කළේ කියලා."

ඔන්න එවිට අලෝෂාට හැම දෙයක්ම අමතක වුණා. පාතාල ලෝකයේ රජතුමාටයි, කළු කිකිළිය හෙවත් ඇමතිවරයාටයි දුන් පොරොන්දුව අමතක කරලා ඔහු ඒගොල්ල ගැනත්, වීර සෙනවියන් ගැනත්, පාතාල ලෝකයේ කුඩා අඟුටුමිටි මිනිසුන් ගැනත් කියන්නට පටන් ගත්තා...

"මොනවා දොඩවනවාද ? නුඹේ මුරණ්ඩු වැඩ ගැන පසුතැවිලිවනවා වෙනුවට, නුඹ වැදගැම්මකට නැති කළු කිකිළියක් ගැන පල් හැලි දොඩවනවා නේද ?" ගුරුවරයා ඔහුගේ කතාවට බාධා කරමින් බැණ වැදුණා. "ළමයිනේ නුඹලාට පේනවා නේද අලෝෂාට දඬුවම් නොකර සිටීමට බැරි බව."

ගුරුවරයා අලෝෂාට වේවැලෙන් පහර කීපයක් ගැසී ය.

අලෝෂා හිස පහත් කැරගෙන නිදන කාමරයට ගියේ ඉතාම ලොකු වේදනාවකින් සහ කනගාටුවකින්. ලජ්ජාවත්, පසුතැවිල්ලත් නිසා ඔහුගේ හිතට තද දුකක් දැනුණා. පැය කීපයකට පසු ඔහු ටිකක් සැනසුනාම සාක්කුවට අත දාලා බැලුවා... වී ඇටය අතුරුදහන් වෙලා. ආයෙමත් කවදාවත් එය නොලැබෙන බව දැනගත් ඔහු සුසුම්ලමින් ඇඬුවා.

හවස අනික් ළමයින් පාඩම්වලින් පස්සෙ නිදන කාමරයට ආවා. එහෙත් අලෝෂාට නින්දක් නැත. ඔහුගේ අහංකාරකම නිසා ඔහු පසුතැවිලි වුණා. හොඳ ළමයකු වීමට ඔහු ස්ථිර ලෙසින්ම සිත ගත්තා. වී ඇටය යළිත් කිසි කලෙක ඔහුට නොලැබෙන බව ඔහුට දැන් සහතිකයි.

රෑ යාමෙට ආයෙමත් අල්ලපු ඇඳේ රෙද්ද උඩට ඇදිලා ගියා. ඉස්සර එහෙම වුණාම අලෝෂා ආශාවෙන් කල්ලී එනතුරු ඉන්නවා. දැන් ලජ්ජාව නිසා එයා ඇස් දෙක තදින් වසා ගත්තා. හොඳින් ඉන්නා බවට ඔහු කළු

කිකිළියට පොරොන්දු වුණේ, ඒයේ ය. දැන් ඉතින් ඔහුගේ හැසිරීම ගැන ඔහු මොනවා කියන්ටද ?

ඔහු දෙනෙත් වසාගෙන සිටියත්, අල්ලපු අඳෙහි ඇඳ රෙද්ද ඉහළට ඇදෙන සැටි ඔහුට දැනේ. ඔහු හොඳට හඳුණන කට හඬෙකින් යමෙක් ඔහුගේ ඇඳ ළඟට විත් කතා කරන සැටි ඔහුට ඇසිණි.

"අලෝෂා ! අලෝෂා !"

ලජ්ජාව නිසා ඔහු දෙනෙත් හැර බැලුවේ නැහැ. ඔහුගේ දෑසින් කඳුළු කැට වැටිණි.

කවුදෝ ඔහුගේ ඇඳ රෙද්ද ඇද්ද නිසා ඔහු දෙනත් හැර බැලුවේ ඉබේටම මෙනි. ඔහු ඉදිරියේ වෙනදා පෙනෙන කළු කිකිළිය නොවේ. එදා පාතාල ලෝකයේ ශාලවේදී දුටු කුඩා අමතිවරයා ය. ඔහු කළු ඇඳුමක් ඇඳ කුකුළු කරමලයක් වැනි තොප්පියක් හිස ලාගෙන සිටී.

"අලෝෂා, නුඹ නිදි නැති බව මට පේනවා... මම ආවේ නුඹෙන් සමුගන්ටයි. අපි මීට පස්සෙ කවරදාකවත් හමුවන්නේ නැහැ." ඇමතිවරයා කියුවා.

අලෝෂා හයියෙන් සුසුම්ලමින් මෙසේ පැවසුවා :

"ආයුබෝවන්! හැකිනම් මට සමාවෙන්න! මම ඔබ ඉදිරියේ වරදකරුවෙක්!"

"අලෝෂා, මම නුඹට සමාව දෙනවා. නුඹ මගේ ජීවිතය බේරා ගත්තා. එය මට අමතක කරන්ට බැහැ. නුඹ අප ගැන රහස හෙළි කරලා. අපව සදහටම අවාසනාවත් කළාට මොකද මම නුඹට ආදරෙයි. ආයුබෝවන් ! මට අවසර දීලා තියෙන්නේ නුඹත් සමග ඉතා කෙටි කාලයකට මුණ ගැසීමට විතරයි. අද රෑ එළිවෙන්ට පෙර අපේ රජතුමාටයි, පාතාල ලෝකයේ අනික් සියලු වැසියන්ටයි ඈත, බොහෝ ඈතට යන්ට වෙලා තියනවා. හැම දෙනෙක්ම අඬනවා. බොහොම දුක් වෙනවා. අපි මෙම පාතාල ලෝකයේ අවුරුදු සිය ගණනක්ම බොහොම සන්සුන් ලෙස හොඳින් ජීවත් වුණා !

අලෝෂා ඇමතිවරයාගේ අතක් ගෙන සිපගත්තා, හිත වාවාගන්ට බැරි දුකකින්. ඒ වේලාවේදී ඔහු යම්කිසි දිලිසෙන දෙයක් දැක්කා. එවිටම අපූරු හඬක් ඔහුට ඇසුණා.

"ඒ මොකක්ද ?" ඔහු මවිත වී ප්‍රශ්න කළා.

ඇමතිවරයා දෑත් ඔසවපු හැටියේම අලෝෂා දැක්කා ඔහුගේ දෑත් රත්රන් දම්වැල්වලින් බැඳලා තියෙන සැටි. අලෝෂා බොහොම කනගාටුවට පත් විය.

"අලෝෂා, නුඹේ අහංකාරකම නිසා මේ දම්වැල් මගේ දෑත්වලට දමලා තියෙනවා. අඬන්ට එපා ! නුඹ ඇඬුවාට මට නිදහස් වීමට ඉඩ ලැබෙන්නේ නැහැ. මගේ අවාසනාව තුනී කිරීමට අලෝෂාට පුළුවන් වන්නේ එක් දෙයකින් විතරයි, එය නම් ඉස්සර වගේම හොඳ ගුණ යහපත් ළමයකු වීමෙන්. ඉතින් අපි සමුගනිමු !"

ඇමතිවරයා අලෝෂාට අතට අත දීලා අතුරුදහන් වුණා.

අලෝෂාට මුළු රැයම නින්ද ගියේ නැහැ. උදේ එළි වන යාමෙට ඔහුට ඇහුණා පොළව යට ශබ්දයක්. ඔහු ඇඳෙන් නැගිටලා ලී පොළවට කන තියලා හඬ ඇසුවා. පාතාල ලෝකයේ පුංචි මිනිසුන්ගේ පා ගැටෙන හඬ, පුංචි කරත්ත රෝදවල හඬ, ගෑනුන් සහ ළමයින් අඬන විට ඇතිවන දුක් සහිත හඬ ඔහුට ඇසුණා. ඒ අතරින් ඔහුට කළු කිකිළිය හෙවත් ඇමතිවරයාගේ කට හඬත් ඇසිණි :

"අලෝෂා, ආයුබෝවන් ! සදහටම ආයුබෝවන් !"

පහුවදා ළමයි නැගිටන විට අලෝෂා බිම වැටිලා සිහිය නැතිව ඉන්නා සැටි දුටුවා. ඔහුව ඔසවලා ඇඳ උඩ තියලා දොස්තර ගෙන්වන ලදී. අලෝෂාට උණ සන්නිපාතය වැලඳී තිබෙන බව දොස්තර කියුවා.

ඔහුට සුවය ලැබුණේ සති හයකට පසුවයි. රෝගයට ඉස්සෙල්ලා ඔහු විඳි සියලු දේ මහා බියජනක සිහිනයක් ලෙසය, ඔහුට දැනුණේ. ගුරුතුමා හෝ සිසුන් හෝ කළු කිකිළිය ගැනවත්, ඔහුට දඬුවම් කිරීම ගැනවත් මතක් කළේ නැහැ. අලෝෂාටත් ඒ ගැන මතක් කිරීම ලජ්ජාවට කරුණක් විය. ඔහු නැවත වරක් කීකරු, ගුණ යහපත්, හොඳ ළමයෙක් වුණා. ඔහුට ළමයින් සියලු දෙනාම ආදරයෙන් සැලකුවා. ඔහුට ඉස්සර වගේ පාඩම් පොතේ පිටු විස්සක් කට පාඩමින් කියන්ට බැරි වුණත්, ඔහු ඉතා හොඳට පාඩම් ඉගෙන ගන්න ආදර්ශවත් ළමයකු බවට පත් වුණා.

විලදීමිර් ඔදොයෙව්ස්කි

දුම් කුඩු හෙප්පුවේ ඇති නගරය

තාත්තා දුම් කුඩු හෙප්පුව මේසය මත තැබී ය.

"මීෂා මෙහාට ඇවිත් මේක බලන්න" ඔහු සිය පුතාට පැවසී ය.

මීෂා කීකරු ළමයෙකි. ඔහු සෙල්ලම් බඩු පසෙකින් තියලා හනිකට මේසය ළඟට විත් දුම්කුඩු හෙප්පුව බලන්නට වුණා. ඒක බොහොම විසිතුරු දුම් කුඩු හෙප්පුවක්. බොහාම ලස්සනයි. පාට පාට වලින් අලංකාර කරලා. ඉබි කටුවෙන් හදලා තියෙන්නේ. අපූරු පියන! දොරටු, කුළුණු, කුඩා ගෙය, කුඩා ගෙවල් හතරක්. අපොයි නැහැ! ගෙවල් ගොඩක්, පුංචි පුංචි ගෙවල් මහා

ගොඩක්. ගණන් කරන්නටවත් බැහැ. ඒවා රත්රන් ! ගස් ද රත්රන්, ගස්වල කොළ රිදී පාට යි. ගස්වලට එහා හිරු පායනවා වගෙයි. හිරු රැස් නිසා අහස ආලෝක වෙලා, රතු පාටින්.

"මේ පුංචි නගරයේ නම මොකක්ද ?" කියලා මීෂා ඇහුවා.

"ඒ නගරයේ නම තමයි ඩින් - ඩින්" තාත්තා මෙසේ කියා දුන්න තද කළා.

මොනවා වුණේදැයි දන්නව ද? නොපෙනන විදයකට සංගීතය වාදනය වුණා. ඒ සංගීතය ඇසෙන්නේ කොහෙන් ද කියලා මීෂාට හිතාගන්නටවත් බැහැ. ඔහු දොරවල් කාමර අතගාලා බැලුවා. සංගීතය ඇසෙන්නේ වෙනත් තැනකින්. ඒ වර ඔහු මේසය යට බැලුවා. ඔහුට අන්තිමට තේරුණා සංගීත හඬ දුම්කුඩු හෙප්පුව තුළින් ඇති වුණ බව. ඔහු දුම්කුඩු හෙප්පුව ළඟට ආවා, ඉරු අහසින් නැග එන සැටි ඔහුට පෙනේ. නැග එන හිරු එළිය කුලුණට වැටී එය දිලිසේ. හිරු එක පැත්තක සිට අනික් පැත්තට ආවා. හිරු පහළ බැසීමට පටන් ගෙන ඇත. දැන් එය කන්දටත් එහා බැස ඇති බැවින් නගරය උඩින් අඳුර පැතිරිලා ය. දැන් අහසේ තරු දිලෙන්ට පටන් ගෙන ඇත. ගස් අතරින් හඳහාමි එබී බලයි. නගරය මේ වර සඳ රැස්වලින් දිලිසෙයි. ජනේල රිදී පැහැයෙන් ද, කුළුණු නිල් පැහැයෙන්ද ආලෝක වී ඇත.

"අනේ තාත්තේ, මට මේ දුම්කුඩු හෙප්පුව ඇතුළෙ තිබෙන නගරයට යන්ට බැරි ද? මම හරිම ආසයි එහි යාමට!"

"ලෙහෙසි නැහැ, මගේ පුතේ. ඒ නගරයට පුතාට යාම ලෙහෙසි නැහැ!"

"අනේ තාත්තේ, මම බොහොම පුංචියි, මාව එම නගරය ඇතුළට යවන්නකෝ. මට හරි ආසයි ඒ පුංචි නගරයේ වෙන දේවල් බලන්ට..."

"ඒ වුණාට පුතේ, පුතා නැතිවට ඒ පුංචි නරගයේ තදබදයක් තියෙනවා නේද?"

"ඒ නගර පොඩ්ඩේ ජීවත් වන්නේ කවුද?"

"එහි ජීවත් වන්නේ පුංචි සීනු" තාත්තා එහෙම කියලා දුම්කුඩු හෙප්පුවේ පියන ඇරියා. එවිට මීෂා දුටුවේ මොනවාද ? පුංචි සීනු, පුංචි මිටි, පුංචි කණු සහ පුංචි රෝද පොඩිති. මීෂා මවිතයට පත් වුණා.

"මේ සීනු පොඩිති, මිටි පොඩිති, කොකු සහිත කණු පොඩිති. මොකටද?"

"මොකටද කියලා පුතාට මම කියන්නේ නැහැ. පුතාම බලාලා කල්පනා කරන්නකෝ. නැතිනම් දෙගිඩියාවෙන් හිතාගන්නකෝ. මෙන්න මේ දුනු විතරක් අත ගාන්ට එපා. එහෙම කළොත් කැඩිලා යාවි."

තාත්තා යන්ට ගියා. පුතා දුම්කුඩු හෙප්පුව දිහා බලාගෙන ඉන්නවා. ඔන්න ඉතින් ඒක දිහා බල බලා ඉඳලා සීනු හඬ නගන්නේ කොහොමද කියලා දිගින් දිගට ම කල්පනා කරන්නට වුණා.

ඒ අතර සංගීතය දිගින් දිගට ම ඇහෙනවා, සංගීත හඬ කෙමෙන් අඩු වීමට පටන් ගත්තා. මීෂා දුම්කුඩු හෙප්පුව දෙස බලාගෙන කල්පනා කරනවා. දුම්කුඩු හෙප්පුව ඇතුළෙ තියෙන දොර අරිලා, ඒ දොරෙන් එහි ඉඳලා රත්රන් හිසක් ඇති ළමයෙක් දුවගෙන එනවා. එයාගේ ජංගිය වානේවලින් හදාලා තියෙනවා. ඒ ළමයා ඇවිත් මීෂාට අඬ ගහනවා, නගරය ඇතුළට එන්ට යි කියලා.

මීෂාට තාත්තා කියාපු දේ කල්පනා වුණාඃ "තාත්තා කිව්වා නේද ඒ නගරයේ පුතා නැතුවට තදබදයක් තියෙනව යි කියලා, මොකටද තාත්තා එහෙම කිවේ? මේ පුංචි නරගයේ ඉන්නවා ඇත්තේ බොහොම හොඳ මිනිස්සු. ඒ ගොල්ල මට ආරාධනය කරනවා වෙන්නට ඕන."

"එන්න, එන්න අපි බොහොම සන්තෝසයි !"

ඔන්න ඒ පාර මීෂා පුංචි නගරයේ දොරටුව ළඟට ගිහිල්ලා බැලුවා. එහි නගර දොර මීෂාගේ උසට සමානයි. ඉතින් අපේ මීෂා බොහොම ගුණ යහපත් ළමයා නිසා එයා ඇහුවා "කවුද මට නගරය පෙන්වන්නට යන්නෙ ?" කියලා.

"ඩින්-ඩින්, මගේ නම තමයි සීනු පොඩිත්තා. මම පුංචි නගරයෙ පුංචි වැසියෙක්. අපි අහලා තියෙනවා ඔය ළමයා අපේ නගර පොඩිත්ත බලන්න ආසයි කියලා. ඉතින් අපි තීරණය කළා ඔය ළමයාට මේ නගරය හොඳහැටි පෙන්වන්ට. ඩින්-ඩින්-ඩින් !"

මීෂා හිස නමලා ආචාර කළා. සීනු පෙඩිත්තා ඒ ළමයව අතින් අල්ලාගෙන නගරයට ඇතුළු වුණා.   අහස හදාලා තිබුණෙ විශේෂ කඩදාසි වගයකින්, එහි වාටිය රත්රන්. වහලවල් තුනක් තිබුණා. එකක් අනිකට වඩා කුඩයි. හතරවැනි වහලය තවත් කුඩයි, ඔහොම ඇතට ඇතට යන්ට කුඩා වී ගිහිල්ලා පුංචි හිසක් දැමීමට තරම් එය කුඩා වෙනවා.

"මම බොහොම ස්තුති කරනවා ඔය ගොල්ලන්ට මට ආරාධනා කරපු එක ගැන. නමුත් හැබෑටම මට එයින් ප්‍රයෝජන ගන්ට පුළුවන්ද ? මේ වහලය යටින් නම් මට යන්ට පිළිවනි. බලන්නකෝ ඇතට යන්ට යන්ට මේ වහලවල් පුංචි වෙලා යන සැටි. ඇත ගියාම මම කොහොමද ඒවා යටින් රිංගලා යන්නේ. යාළුවා, ඔයා කොහොමද ඒවා යටින් රිංගන්නේ ?"

"ඩින්-ඩින්, ඒවා හරි ! අපිට කරදර වීමට වුවමනා නැහැ. මා සමග එන්න!" එහෙම කියුවේ සීනු පොඩිත්තා.

මීෂා කල්පනා කරලා සීනු පොඩිත්තත් එක්ක ගියයි කියමුකෝ. ඔන්න උස් වෙනවා වගේ මීෂාට දැනෙනවා. ලෙහෙසියෙන් යන්ට පුළුවනි. ඔහොම බාගයක් දුර ගිහිල්ලා සීනු පොඩිත්තා මීෂාට කිව්වා හැරිලා බලන්ට යි කියලා. මීෂා හැරිලා බැලුවා ම එයාට පේනවා එයා පහු කැරගෙන ආපු වහලවල් පොඩියි වගේ. හරියට එයයි සීනු පොඩිත්ත යි වහලයක් යටින් ගියාට පස්සේ එය කුඩා වෙනවා වගෙයි. මීෂාට දැනුණෙ. ඉතින් එයා බොහොම පුදුම වුණා.

"එහෙම වෙන්නේ කොහොමද ?" මීෂා සීනු පොඩිත්තාගෙන් ඇහැව්වා

"ඩින්-ඩින්, හැමදාම ඈතට පෙනෙන්නේ වහල පාත් වෙනවා වගේ තමයි. ඕනෑම දෙයක් ඈත තියෙන විට කුඩාවට පේනවා, එයා එහෙම වුවමනාවෙන් බලා නැතුව වගෙයි. අප තවත් දුරට යමු," යි කියලා සීනු පොඩිත්තා කියුවා.

"ඔවු ඒ කතාව නම් ඇත්ත තමා. දැන් දවස් තුනක් තිස්සේ මම පින්තූරයක් අඳිනවා. මට ඕන අම්මා මා ළඟ වාඩිවෙලා පියානෝව වාදනය කරන සැටිත්, තාත්තා කාමරයේ එහා කෙළවරේ වාඩිවෙලා පොතක් කියවන සැටිත් පෙන්වන්න යි. කොහොම ඇන්දත් තාත්තා මා ළඟ පුටුවේ ඉන්න සැටිත්, අම්මා පුටුව ළඟ පියානෝව වාදනය කරන සැටිත් තමයි මගේ අතින් ඇඳෙන්නේ. ඒ වුණාට මට හොඳට පෙනෙනවා අම්මා මා ළඟ වාඩි වෙලා පියානෝව වාදනය කරනවා. තාත්තා කමරයේ ඈත කෙළවරේ වාඩිවෙලා පොත කියවනවා. ඒ වුණත් දුර ප්‍රමාණය හරිහැටි අඳින්ට මට බැහැ. අම්මා කියුවා, තාත්තාව පුංචියට අඳින්ට ඕන කියලා. එහෙම කොහොම ද, අම්මාට වැඩිය තාත්තා උසයි, ලොකුයි. මම සිතුවේ අම්මා විහිළු කරනවයි කියලා. ඔන්න දැන් තමයි මට තේරෙන්නේ අම්මා මට කියුවේ ඇත්තක් බව. තාත්තා කාමරේ ඈත කොනක ඉන්න නිසා එයාව පුංචියට අඳින්ට ඕන. සීනු පොඩිත්තා මම බොහොම ස්තුති කරනවා කරුණු පැහැදිලා කරලා දුන්නාට," මීෂා කියුවා.

සීනු පොඩිත්තා හයියෙන් හඬ නගලා සිනාසුණා. "ඩින්-ඩින්, හරිම විහිළුවක්! ඩින්-ඩින්, හරිම විහිළුවක්! තාත්තාවයි අම්මාවයි අඳින්ට දන්නේ නැතිලු ! ඩින්-ඩින්, ඩින්-ඩින් !"

සීනු පොඩිත්තා මීෂාට හිනාවෙන නිසා එයාට දුක සිතුණා. ඔහු සීනු පොඩිත්තා ගෙන් බොහොම ආචාරශීලීව මෙහෙම ඇහුවාඃ

"ඔයා හැම වචනයකටම ඩින්-ඩින් කියලා කියන්නේ මොකද?"

"ඒක අපේ කට කතාවක්" සීනු පොඩිත්තා කියුවා.

"අපේ තාත්තා කියන්නේ කට කතාවලට පුරුදු වෙන්ට එපා කියලා."

සීනු පොඩිත්තා කට තදකරගෙන වහගත්තා මිසක් වචනයක්වත් කතා කළේ නැහැ.

දූත් ඒ ගොල්ල ඉදිරියේ දොරටුවක්. දොර ඇරිලා ඒ දෙන්නාම මගකට වැටුණා. මොකක්ද මේ මාර්ගය, මොකක්ද මේ නගරය? පදික වේදිකාව මුතු පාටයි, අහසේ නොයෙක් පාට, අහසේ හිරු රන් පාටයි, ඒ හිරු බැහැලා යනවා, ආපහු පායනවා. පුංචි ගෙවල් වානේ වලින් හදලා, ඒවායේ වහල පාට පාට සිප්පි කටුවලින් හදලා. හැම ගෙයක් ළඟම රන් හිසක් ඇති රිදී හැට්ටයක් ඇඳගත් සීනු පොඩිත්තකු බැගින් ඉන්නවා. ඒ වගේ පොඩි පොඩි සීනු මහ ගොඩක් තියෙනවා.

"ආ, දූන්නම් මට හොඳ හැටි තේරෙනවා. ඇතට ඇතට පුංචි, පුංචියට පෙනුණට ඒ සීනු පොඩි සේරම එක වගෙයි." මීෂා බොහොම සතුටින් කිව්වා.

"අන්න ඒ කතාව ඇත්ත නොවෙයි. සීනු එක වගේ නොවෙයි. සියලු සීනු එක වගේ තිබුණා නම් අපි සියලුදෙනාගේම හඬ එක වගේ. ඔය ළමයාට ඇහෙනවා නේද අපි වෙනත් වෙනත් ගීත ගයන සැටි? ලොකු සීනු රාළගේ හඬ ගොරෝසුයි. ඔයා ඒ ගැන දන්නේ නැද්ද? ඔන්න මීෂා ඔයාට මේකත් පාඩමක්. මීට පස්සේ කට කතා කියන අයට හිනාවෙන්ට එපා. සමහර කට කතා කියන කෙනෙක් අනිකාට වඩා වැඩියෙන් උගත්ය. එයාගෙන් සමහර දේ ඉගෙනගන්ටත් පුළුවනි."

ඒ පාර මීෂා කට වහගත්තා.

ඔන්න ඒ අතර අනිත් සීනු පොඩිත්තො ඇවිල්ලා මීෂාව වට කැරැගෙන සීනු ගසමින් උඩ පැන පැන දිව්වා.

"සීනු පොඩිත්තෝ බොහොම සතුටින් ජීවත් වෙනවා. මාත් කැමතියි ඒ ගොල්ලන් එක්ක හැමදාම ඉන්න. ඔයාගොල්ල මුළු දවස තිස්සේම කිසිම දෙයක් කරන්නේ නැහැ. ඔයගොල්ල ඉගෙන ගන්නේ නැහැ, ඔය ගොල්ලන්ට ගුරුවරුන් නැහැ. උදේ සිට රෑ වනතුරු ඔයගොල්ල සංගීත නාදය කරන එක තමයි." මීෂා කියුවා.

"ඩින්-ඩින්-ඩින්! අපට බොහොම සන්තෝෂයි? නැහැ මීෂා ඒක එහෙම නොවෙයි, අපටත් මේක මහ කරදරයක්. ඇත්ත තමයි අප ඉස්කෝලෙ යන්නේ නැහැ. එයින් ඇති පලය කුමක්ද? අපි පාසල් යන්ට බය නැහැ. අපට තියෙන කරදරය නම්, අපට එකම එක වැඩක් විතරක් කිරීමට සිදුවෙලා තිබීමයි. අපට පොත් නැහැ. පින්තූර නැහැ. අම්මලා තාත්තලා නැහැ. මුළු දවස තිස්සේම ඩින්-ඩින් ගාලා සද්ද කරන එක තමයි කරන්නෙ.

ඒක බොහාම කාන්සියත්, මහන්සියත් ගෙන දෙන වැඩක්. ඔයා විශ්වාස කරනවද? අපේ අහස ලස්සනයි, අපේ රත්තරන් ඉරයි, ගසුයි ලස්සනයි, නමුත් දැන් ඒවා බලාලා හොඳටම ඇති වෙලා. අපි මේ නගරයෙන් එක අඩියක් වත් ඉවතට ගිහිල්ලා නැහැ. අපි මේ නගරය තියෙන දුම්කුඩු හෙප්පුව ඇතුළට වෙලා හැමදාම ඩින්-ඩින් ගාලා කැගසමින් ඉන්න එක තමා තියෙන්නෙ, මෙයා කොතරම් විඩා ගෙන දෙන වැඩක්ද කියලා ඔයා දන්නව ද !

"ඔව්, ඒක නම් ඇත්ත තමා, මටත් ඔහොම වෙනවා. පොත් පාඩම් කරලා ඉවර වෙලා සෙල්ලම් කළාම හිතට බොහොම සැපයි. උත්සව දවස්වලදී පොත් පාඩම් කරන්නේ නැතිව, මුළු දවස තිස්සේම සෙල්ලම් කළාම හවස් වෙන විට හිතට මහ ලොකු පාලු ගතියක් දැනෙනවා. කිසිම සතුටක් නැහැ. සෙල්ලම් බඩු වෙනුවට වෙනත් සෙල්ලම් බඩු අරගෙන සෙල්ලම් කළත්, පාලු ගතිය ඇරෙන්නේ නැහැ. ඉස්සෙල්ලා මට මෙය තේරුම් ගන්ට බැරි වුණා. දැන් මට තේරෙනවා."

"ඒ විතරක් නොවෙයි, අපට තවත් පාඩුවක් තියෙනවා. ඒක තමා අපට මාමාවරු ඉන්න එක." එහෙම කියුවේ සීනු පොඩිත්තා.

"මොන විදිහේ මාමාලා ද ?" මීෂා ඇසුවා.

"මිටිවලින් ඔළුවට ගහන මාමලා. ඒ ගොල්ල නපුරු මාමලා. අපේ ඔළුවලට මිටිවලින් ගසමින් නගරය වටේට යනවා. පොඩිම සීනු පොඩිත්තන්ට මේ නිසා බොහොම වේදනා ඇති වෙනවා."

ඇත්තටම මීෂාට පෙනුණා, සම් කබායක් පොරවා ගෙන නගරයේ මාර්ගවල ගමන් කරන මිටි වගයක්. ඒ ගොල්ල ටුක්-ටුක් ගගා ශබ්ද කරනවා. "නැගිටපල්ලා! ටුක් ටුක්!"

අනේ හැබෑටම, ඔය මිටි පාරේ යමින් ලොකු පුංචි සීනුවලට ටුක්-ටුක් කියලා ගහනවා. මීෂාට කනගාටුවක් උපන්නේ. සීනු පොඩිත්තන් මිට වලින් පහර කන නිසයි. එවිට මීෂා මිටියක් ළඟට ගිහිල්ලා හිස පහත් කරලා ආචාර කරලා ඇහුවා, "මොකද ඔහොම අනුකම්පාවක් නැතුව සීනු පොඩිත්තන්ට මිටිවලින් ගහන්නේ" කියලා.

කොල්ලා, නුඹ අපට බාධා කරන්ට එපා. ඉහළ කාමරේ ඉන්න මහා ලොක්කා අපට අණ කරනවා සීනුවලට මිටිවලින් ගහන්ටයි කියලා" මිටි ටුක්-ටුක් ගාලා සීනු පොඩිත්තන්ට ගහන්ට පටන් ගත්තා.

"ඔයගොල්ලන්ගේ ලොක්කා කවුද ?" මීෂා සීනු පොඩිත්තන්ගෙන් ඇහුවා.

"අපේ ලොක්කා තමයි සිලින්ඩර මහත්තයා. එයා බොහොම කරුණාවත් මිනිහෙක්. උදේ හිට රෑ වන තුරුත්, ආයෙමත් උදේ වනතුරුත් ඇඳේ දිගා වෙලා ඉන්නවා. එයාට විරුද්ධව පැමිණිලි කරන්ට අපට බැහැ."

ඔන්න ඒ පාර මීෂා ගියා සිලින්ඩර මහත්තයව බලන්න. එයා හැබැටම ඇඳේ දිගා වෙලා ඒ පැත්තටයි, මේ පැත්තටයි පෙරලෙනවා. නිතරම පෙරලෙන්නේ උඩුබැලි අතටයි. එයාගේ ලෝගුවේ ඉදිකටු පුංචි කොකු ගණන් කරන්ට බැරි තරම් මහා ගොඩක්. ඔන්න එයාගේ කොක්කකට මිටියක් අහු වුණොත්, එයා අමුණලා පසුව අත හරිනවා. අන්න එවිට තමයි, මිටිය සීනු පොඩිත්තාට ගහන්නේ. එතකොට තමයි සීනු පොඩිත්තන් හඬ පිට කරන්නේ.

මීෂා සිලින්ඩරයට ළංවුණ හැටියෙම ඔන්න බොලේ එයා කෑගහපිඃ

"ෂූ-ෂූ ! කවුද ඔතන ඇවිදින්නේ ? කවුද ඔතන උඩ පනින්නේ ? එළියට යන්නේ නැත්තේ කවුද? මට නිදාගන්ට ඉඩ නොදෙන්නේ කවුද ?"

"ඒ මම තමයි." මීෂා බය නැතුව පිළිතුරු දුන්නා.

"නුඹට ඕන මොනවාද ?" සිලින්ඩර ලොක්කා ඇසුවා.

"මට මෙහි ඉන්න සීනු පොඩිත්තන් ගැන බොහොම කනගාටුයි. ඒගොල්ල බොහාම හොඳ, දයාබර උදවිය, ඔය සිලින්ඩර මහත්තයාගේ නියමය අනුව සීනු පොඩිත්තන්ට අර මාමාලා මිටවලින් ගහනවා. හැම තිස්සේම ඒගොල්ලන්ට මිටි පහර වදිනවා ..."

"ඉතින් මට මොකද? මම නෙවෙයි මෙතන ලොකුම ලොක්කා. මාමාලාට ඕන තරම් සීනු පොඩිත්තන්ට ගහපුදෙන්. මට මොකද ? මම තමයි සිලින්ඩරය. මම තමයි ලොක්කා-බක්කා. මම ඇඳේ වැතිරිලා ඒ අතටයි මේ අතටයි පෙරලෙනවා. ඒගොල්ලන් දිහා බලන්ට මට බැහැ...''

මීෂා තවත් දුර ගිහිල්ලා නැවතිලා බැලුවා. රන් පැහැති කුඩාරම මුතු ඇටවලට සමාන පාටකින් බැබලෙනවා. ඉහළ රන්වන් හුළං පෙත්ත කරකැවෙනවා. ඊට යටින් ඉන්නේ කවුද දන්නවද ? දුනු රැජිණ. එයා නාගයෙකු වගේ දරණ ගැහිලා ඉන්නවා. එක වරකට එයා දිග ඇදෙනවා. තවත් වරකට එයා ඇකිලෙනවා සිලින්ඩර මහත්තයව තල්ලු කරනවා. මෙයා දුටු මීෂා මවිතයට පත් වුණා.

"දුනු රැජිණියෙනි! ඔබතුමී සිලින්ඩර මහත්තයාව තල්ලු කරන්නේ කුමක් නිසාද ?"

"අපොයි, එයා මෝඩ ළමයෙක්. කල්පනා නොකරන කොල්ලෙක්. ඔක්කොම දේවල් බලනවා. කිසි දෙයක් පේන්නේ නැහැ ! මම සිලින්ඩරයාව තල්ලු නොකළා නම් එයා හැරෙන්නෙ පෙරලෙන්නෙ නැතිව

ඉඳීවි ! එතකොට සිලින්ඩරයාට බැරිවෙනවා එයාගේ කොකුවලට මිටි අමුණාගන්ට. මිටි අමුණාගන්ට බැරි වුණොත්, මිටිවලට නොහැකිවෙනවා සීනුවලට පහර දෙන්ට, සීනුවලට පහර දුන්නේ නැතිනම්, සීනුවලට බැරිවෙනවා සංගීත හඬ නංවන්න. ඔයාට දැන්වත් තේරුණාද ?"

දුනු රජිණිය කියන කතාව ඇත්තද කියලා බලන්ට මීෂා දුන්න ඇඟිල්ලකින් තදට ඔබාගෙන හිටියා. එවිට වුණේ මොනවාද ? එක වර ඉතා ඉක්මනට දුන්න දිග ඇදුණා. සිලින්ඩරය ලොකු වේගයකින් කැරකැවුණා. මිටි ඉතා ඉක්මනට සීනුවලට පහර දුන්නා. සීනු වලින් ඩින්-ඩින් යන හඬ ඇසුණා. හිටි හැටියේම දුන්න කැඩුණා. හැම දෙයක්ම නිහඬ වුණා. සිලින්ඩර නැවතුණා. මිටි ටික බිමට හැරුණා. සීනු පැත්තකට නැමුණා. හිරු නැවතුණා. පුංචි ගෙවල් කැඩිලා බිඳිලා ගියා... අන්න එවිට මීෂාට මතක් වුණා දුන්නට අත තියන්න එපයි කියලා තාත්තා ඔහුට කියාපු සැටි. මීෂා බයවෙලා... අවදි වුණා.

"මීෂා හීනෙන් දැක්කේ මොනවාද?'' තාත්තා ඇහුවා.

මීෂා දුටු හීනය නිසා එයාටම මතක නැහැ මොනවා වුණාද කියලා. එයා වටපිට බැලුවා. තාත්තාගේ කාමරය, එයා ළඟ දුම්කුඩු හෙප්පුව, තාත්තයි අම්මායි මීෂා දිහා බලමින් සිනහ වෙනවා.

"සීනු පොඩිත්තා කොහෙද ? මිටි කොහෙද ? දුන්න කොහෙද ? ආ, එහෙනම් මා දුටුවේ සිහිනයක් වෙන්ට ඕන !"

"ඔවු මීෂා, සංගීතයට ඔයා නැලවිලා ඉබේටම ඔයාට නින්ද ගියා. ඉතින් පුතා කියන්න, ඔයා දැකපු හීනේ මොකක්ද කියලා !"

මීෂා දෙනෙත් පිහදාගෙන මෙහෙම කිවුවා: "මට දැනගන්ට ඕන වුණා, දුම්කුඩු හෙප්පුව ඇතුළේ සංගීතය වාදනය වෙන්නේ කොහොමද කියලා. ඔන්න මට ඕන වුණා. දුම්කුඩු හෙප්පුව ඇතුළත තියෙන දේ වැඩ කරන්නේ කොහාමද කියලා දැනගන්නට. ඔය ගැන කල්පනා කරන විට තමයි මට නින්ද ගිහිල්ලා, දුම්කුඩු හෙප්පුව ඇතුළෙ ඇති නගරයට මම හීනෙන් ගියේ..." මීෂා තාත්තාට සිහිනය ගැන විස්තර කළා.

"එහෙනම් දැන් පුතා තේරෙනවා ඇති දුම්කුඩු හෙප්පුවේ සංගීතය ඇති වෙන හේතු මොනවාද කියලා. වඩාත් හොඳට පුතාට එය දැනගන්ට පුළුවන් වෙන්නේ යාන්ත්‍ර ශිල්පය ඉගෙන ගන්නා විටයි" තාත්තා කියුවා.

මිහයීල් ලෙර්මන්තව්

අෂික් - කරීබ්

මීට බොහොම කාලයකට පෙර තිප්ලිස් නගරයේ පොහොසත් තුර්කි ජාතිකයෙක් හිටියා. එයාට බොහොම වස්තුව තිබුණා. ඒ සියලු වස්තුවලටත් වඩා වැඩියෙන්ම එයාට වටිනා දේ වූයේ එයාගේ දුවයි. ඒ ගෑනු ළමයාගේ නම මෙගේරි. ඒ තරුණියට වඩා ලස්සන කෙනෙක් මුළු තිප්ලිස් නගරයේම හිටියේ නැහැ.

ඉතින් ඔය නගරයේ හිටියා බොහොම දුප්පත් අෂික් - කරීබ්. එයාගේ අත තඹයක්වත් නොතිබුණාට එයාගේ හදවත බොහාම හොඳයි, එයාට හොඳට ගීත ගයන්ට පුළුවනි. එයා තුර්කි ජාතික වීණාවක් රැගෙන තුර්කිස්තානයේ වීර කවියන් ගැන කවි හා සින්දු කියමින් පොහොසත් සහ වාසනාවත් මිනිසුන්ගේ මගුල් ගෙවල්වලට ගිහිල්ලා ඒ මිනිසුන්ව සතුටු කළා.

එක මගුල් ගෙදරකදී අෂික්-කරීබ්ට මෙගේරි නමැති ඉතා ලස්සන තරුණිය මුණ ගැසුණා. දෙදෙනාම එකිනෙකාට ආදරය කරන්ට පටන් ගත්තා. කරීබ්ට ඒ තරුණියව ලබා ගැනීමට ඇති ඉඩකඩ බොහාමත්ම අඩුයි. ඒ හින්දා ඔහු දුකෙන් දුකට පත් වුණා.

ඔන්න දවසක් දා ගෙවත්තේ මිදිවැල යට වාඩිවෙලා ඉන්නා විට, ඔහුට නින්ද ගියා. ඒ වේලාවේදී මෙගේරි සහ එයාගේ යෙහෙළියෝ ඔය වත්තට ආවා. එයාගේ එක යෙහෙළියක් මිදි වැල යට නිදා ඉන්නා වීණා වාදකයාව දැකලා එයා ළඟට ආවා.

"ඔයා මොකද මර නින්දේ, නිදාගෙන
යනවිට පෙම්වතිය ඔබෙ, ගී ගයාගෙන"

කියලා අර යෙහෙළිය ඔහුට කියුවා.

ඔහු අවදිවුණු හැටියේම ගීතය ගයපු තරුණිය වහාම අතුරු දහන් වුණා.

මෙගේරි යෙහෙළියට බැණ වැදුණා. ගීතයක් ගයාපු හන්දා.

"ඔයා දන්නවා නම් මම කාටද ඒ ගීතය ගායනා කළේ කියලා. ඔයාගේ පෙම්වතාටයි, ඔයා මට ස්තුති කරන්ට ඕන."

"අනේ අෂික්-කරීබ් ළඟට මාව අඬගහගෙන යන්නැ"යි කියා මෙගේරි ඉල්ලා හිටියා.

අෂික්-කරීබ් බොහොම දුකෙන් ඉන්නවා දැකලා මෙගේරි ඔහුගේ සැප දුක් විමැසුවා.

"මට දුකක් නැද්ද. මම ඔයාට කොතරම් ආදරය කරනවද. ඉතින් කවදාවත් මට ඔයාව ලබාගන්ට බැහැ." කරීබ් පිළිතුරු දුන්නා.

"අපේ තාත්තා ළඟට ඇවිත් මට විවාහ යෝජනා කරන්න. තාත්තා අපේ විවා මඟුලට මහා ගොඩක් වස්තුව දේවි. අප දෙදෙනාට ඒක හොඳටම ඇති." මෙගේරි කරීබ්ට කියුවා.

"හොඳයි, ඔබේ තාත්තා ඔයා නිසා හැම දෙයක්ම දුන්නයි කියලා සිතමු. පසුව එයා මට බැන වදින්නේ නැද්ද මම දුප්පත් මිනිහකුව සිටියා කියලා. ඔයාට මම හැමදාම යටත් වෙලා ඉන්ට ඕනයි කියලා. නැත, මගේ ආදරණීය මෙගේරි මම මෙන්න මෙවැනි පොරොන්දුවක් දීලා තියෙනවා. මම අවුරුදු හතක් රට රටවල් ගානේ ගිහින් සල්ලි හම්බ කරලා පොහොසතකු වෙනවා. නැතිනම් මම කාන්තාරෙදි මැරිලා යනවා. ඔයා කැමති නම් හරියට අද සිට අවුරුදු හතක් සම්පූර්ණ වෙන දවසෙදි මම ඇවිත් ඔයාව විවාහ කැර ගන්නවා."

මෙගේරි මේ අදහසට කැමති වුණා. හැබැයි එක කොන්දේසියක් අනුවයි. ඔහු හරියට හත් අවුරුද්ද සම්පූර්ණ වෙච්ච දවසට ආවේ නැතිනම් ඈ කුර්සුද් බේක් සමග එදාට විවාහ වෙනවා කියලා. කුර්සුද්-බේක් මෙගේරිට විවාහ යෝජනා කරලා බොහොම දවස්.

අෂික්-කරීබ් අම්මාට වැඳලා ඇගේ ආශිර්වාදය ලබා ගත්තා. පුංචි නංගිව සිප ගත්තා. ගමන් මල්ලක් කරේ දමාගෙන, හැරමිටියකුත් අතින් අරගෙන මහ මගට බැස්සා. ඔන්න එයා පසුපස අස්පයකු පිට නැග ගත්තු මිනිහෙක් එනවා. ඒ තමා කුර්සුද්-බේක්.

"සුබ ගමන් ! තමුසේ කොහේ ගියත් තමුසෙගෙ සගයා හැටියට මාත් එනවා," බේක් කියුවා.

මේ ගමන් සගයා නිසා අෂික්-කරීබ් සතුටු වුණේ නැහැ. නමුත් මොනවා කරන්ටද? දෙදෙනාම ගමන් කළා. අන්තිමේදී දෙදෙනා ගඟක් ළඟට ආවා. එයට පාලමක්වත්, ඒදණ්ඩක්වත් නැත.

"තමුසේ ඉස්සෙල්ලා පීනනවා, මම පසුපසින් එන්නම්!" එහෙම කියුවේ බේක්.

කරීබ් උඩ කබාය ගලවා ගඟ හරහා පීනුවා. ගඟ හරහා පීනලා බැලුවාම, අල්ලාගේ නාමෙට' මොකද වුණේ දන්නවද! කුර්සුද් බේක් කරීබ්ගේ උඩු කබාය ඇරගෙන අස්පයා පිට නැගිලා ටිප්ලිස් නගරයට බොහොම ඉක්මනින් යන්ට ගියා.

කරීබ්ගේ අම්මා ළඟට ගිහිල්ලා එයාගේ උඩු කබාය ඇයට පෙන්නලා කිව්වා. "ඔයාගේ පුතා නිල් ගඟේ ගිලීලා මැරුණා" කියලා.

අම්මා බොහොම දුකට පත්වෙලා පුතාගේ උඩු කබාය බදාගෙන ඇඬුවා. ඊළඟට අම්මා එය ඇරගෙන ගියා මෙගේරි ළඟට.

"මගේ පුතා ගඟේ ගිලිලා මළා. දැන් ඉතින් ඔය ළමයා නිදහස්."

මෙගේරි මඳ සිනා පාලා මෙහෙම කියුවාඃ

"ඔය කතාව විශ්වාස කරන්ට එපා. බේක්ගේ කපටිකමක් ඔය. අවුරුදු හතක් ගත වනතුරු මම කරීබ් එනතුරු බලාගෙන ඉන්නවා."

මෙගේරි වීණාව වයමින් කරීබ්ගේ ඉතාම හොඳ සින්දුව ගායනා කළා ....

මේ අතර කරීබ් ගඟෙන් එගොඩහට පීනලා එක ගමකට ගියා. ඒ ගමේ ඉන්න හොඳ මිනිස්සු කරීබ්ට ඇඳුම් දීලා කෑම බීමත් සපයා දුන්නා. එයා ඒ ගොල්ලන්ට බොහොම ලස්සනට ගී සින්දු කිව්වා. ඉතින් ඔහොම කරීබ් ගමෙන් ගමට යමින් සින්දු කියලා යමක් හම්බ කරගත් අතර එයාගේ නමත් බොහාම ප්‍රසිද්ධ වෙන්ට පටන් ගත්තා. එයා ඊළඟට හලාප් කියන නගරයට ආවා. කරීබ් ඒ නගරයේ කෝපි කඩයකට ගිහිල්ලා වීණාව වාදනය කරමින් ගීත ගායනය කළා. හලාප් නගරයේ පුරපතියා ගී, සින්දු අහන්ට බොහාම කැමති කෙනෙක්. එයා බොහෝ දෙනෙකුගේ ගී, සින්දු ඇහුවාට ඒවාට කැමති වුණේ නැහැ. එයාගේ මෙහෙකරුවෝ නගරයේ හැම තැනම ගිහිල්ලා සින්දු කාරයින්ව හොයනවා. ඔන්න ඒගොල්ලන්ට ඇහුණා කෝපි කඩයේ ඉන්න මිනිහෙක් බොහොම ලස්සනට ගීත ගයන සැටි. මෙහෙකරුවෝ දුවැගෙන ඇවිල්ලා අෂික්-කරීබ්ට මෙහෙම කියනවාඃ

"අපත් සමග වරෙන්, පුරපතිතුමා ළඟට යන්ට. නැතිනම් නුඹේ හිස ගසා දමනවා."

"මම නිදහස් මිනිහෙක්. මම තිප්ලිස් පුර වැසියෙක්. මට සිතුනාම මම ගීත ගයනවා. නැතිනම් නිකම් ඉන්නවා. නුඹලාගේ පුරපතියා මට ලොක්කෙක් නොවෙයි," කරීබ් කියාපි.

ඒ කීම අහන්නේ නැතුව ඔහුව පුරපතියා ළඟට ඇදගෙන ආවා.

"ගී ගයපන් !" පුරපතියා අණ කළා.

ඔහු මෙගේරිගේ ආලය ගැන බොහොම මිහිරි ගීතයක් ගායනා කළා. පුරපතියා ඒ ගීතය අහලා බොහොම සතුටු වී කරීබ්ව ළඟ තබා ගත්තා, ගායකයා හැටියට.

එයාට බොහොම රන් කාසි, රිදී කාසි දීලා, ලස්සන වටිනා ඇඳුම් තෑගි කළා. අෂීක්-කරීබ් දැන් බොහොම පොහොසත් කෙනෙක්. එයාට එයාගේ මෙගේරි ගැන අමතක වුණාද කියලා කියන්ට බැහැ. ඒ වුණාට හත්වැනි අවුරුද්ද ගෙවී යන්ට හොඳටම ළං වුණා. කාලය ගෙවීමට ළං වුණාට කරීබ් මෙගේරි ළඟට යාමට තවම සූදානම් වෙලා නැත.

මෙගේරි ගේ සිතට ලොකු වේදනාවක් ඇති වුණා. මේ කාලෙදි තිප්ලිස් නගරයේ ඉඳලා පොහොසත් වෙළෙන්දෙක් තවලමක් ඇරගෙන ගියා. ඒ තවලමට ඔටුවන් හතළිහකි, වහල් මෙහෙකරුවන් අසූවකි. මෙගේරි ඒ වෙළෙන්දාට රන් පිරිසියක් දීලා මෙහෙම කියුවාඃ

"ඔබ වෙළඳාම් කරන නගරවලදී මේ රන් පීරිසිය ඔබේ කඩේ තබන්න. මේ පීරිසියට අයිතිවාසිකම් කියන්ට යම් කෙනෙක් ඉදිරිපත් වුණොත්, එයාට දන්වන්ට, එයා එම අයිතිය ඔප්පු කළහොත් එයාට එම පීරිසියේ බරට සරිලන රත්රන් ගොඩක් තවත් දෙනවයි කියලා.''

වෙළෙන්දා මෙගේරිගේ ඉල්ලීම ඉටු කරන්ට පොරොන්දු වෙලා තවලමත් සමග රට රටවල් වලට යන්ට ගියා. එයාගේ බඩු බොහොමයක් වෙළඳාම් කරලා එයා ඉතිරි බඩු ටිකත් රැගෙන ආවා හලාප් නගරයට. රන් පීරිසිය ගැන අසන්ට ලැබුණු හැටියේම අෂීක්-කරීබ් දුවගෙන ආවා වෙළෙන්දාගේ කඩයට. ඒ කඩයේ තිබෙන රන් පීරිසිය දැකලා ඔහු මෙහෙම කියුවාඃ

"මේ පීරිසිය මගේ !" අෂීක්-කරීබ් එය අතින් ගත්තා.

"හරියට හරි, එය නුඹේ තමයි. නුඹව මම හඳුනාගත්තා. නුඹේ නම අෂීක්-කරීබ්. ඉක්මනට තිප්ලිස් නගරයට යන්. මෙගේරි කිව්වා හත් අවුරුදු කාලය ගෙවී යන්ට ඉස්සෙල්ලා ආවේ නැතිනම් වෙනින් මිනිහෙකුගේ බිරිඳ වෙනවයි කියලා."

අෂීක්-කරීබ් මහත් දුකකින් හිස බදාගත්තා. කාලය ගෙවී යාමට තවත් ඉතිරි වෙලා තිබුණේ දවස් තුනක් විතරයි. ඔහු තම අශ්වයා පිට නැගලා රන් කාසි මල්ල එක අතකින් අරගෙන වේගයෙන් උෟව පන්නන්ට පටන් ගත්තා. ඔන්න කරීබ් අශ්වයාව පන්නාගෙන ගියා අර්සින්ගාන් කන්දට.

අස්වයා එතැනදී මැරිලා වැටුණා. එතැනින් තිප්ලිස් නරගයට යාමට මාස දෙකක් ඕන. ඒ වුණාට ඉතිරි වෙලා තියෙන්නෙ දවස් දෙකක් විතරයි.

"අනේ දෙවියනි! ඔබ වහන්සේ මට උදව් කරන්නේ නැතිනම් මා විනාශයි." මෙහෙම කියලා කරීප් උසැති කන්දේ සිට බිමට පනින්ට සූදානම් වුණා. ඔන්න එවිට ඔහු දුටුවා සුදු පාට අශ්වයකු පිට නැග ගත් මිනිහකු කතා කරන සැටි.

"තරුණයා, නුඹ මොනවා කරන්ට යනවද ?"

"මැරෙන්ට යනවා !" කරීබ් පිළිතුරු දුන්නා.

"කන්දෙන් බැහැපන්. නුඹ මැරෙන්ට කැමති නම් මම නුඹව මරන්නම් !"

අෂික්-කරීබ් කන්දෙන් පහළට බැස්සා.

"මාත් සමග වරෙන් !" අනිත් මිනිහා බොහොම තර්ජනය කරලා කිව්වා.

"මම නුඹත් සමග එන්නේ කොහොමද ? නුඹේ අස්පයා ඉගිලෙනවා නොවැ. මගේ රත්රන් කාසි තියෙන මල්ල බොහොම බරයි." කරීබ් උත්තර දුන්නා.

"නුඹේ කාසි මල්ල මගේ සැදෑලයට බැඳපන්. මා සමග වරෙන්."

කොච්චර හයියෙන් දිවුවත් කරීබ්ට අර අනික් මිනිහා තරම් වේගයෙන් යන්ට බැහැ.

"නුඹ පමා වෙන්නෙ මොකද ?"

"මම කොහොමද නුඹේ අස්පයාත් එක්ක දුවන්නේ. එයා හිතනවාටත් වැඩිය වේගයෙන් දුවනවා. මට නම් හොඳටම මහන්සියි." කරීබ් කියුවා.

"ඇත්ත තමා නුඹ ගාටනවා. මගේ අස්පයාගේ පිට උඩට නැගපන්. සම්පූර්ණ ඇත්ත කියන්ට ඕන. නුඹට යන්ට ඕන කොහාටද ?"

"අර්සෙරුම් වලට වත් යාගන්ට පුළුවන් නම්!"

"එහෙනම් ඇස් වහගනින්" කරීබ් දෙනෙත් වසාගත්තා.

"දැන් ඇස් ඇරපන්."

කරීබ් ඇස් ඇරියා විතරයි, ඔන්න හැබෑටම අර්සෙරුම් නගරයේ උස කුළුණ ළඟටම ඇවිත්.

"අනේ ලොකු උන්නැහේ, මට කට වැරැද්දක් වුණා. මට ඕන වුණේ කාස් නගරයට යාමටයි."

"ඔන්න ඉතින් ඒක නොවෙන්නම් මම නුඹට කිව්වා නේද සම්පූර්ණ ඇත්ත කියන්ටයි කියලා." සුදු අස්පයා පිට නැගලා හිටිය මිනිහා කියාපි. එහෙනම් ඇස් දෙක වහ ගනින් !"

අෂික්-කරීබ් දෙනෙත් වසා ගත්තා. "ආයෙමත් ඇස් දෙක ඇරපන් !"

ඔන්න බැලින්නම් ඇත්තටම කාස් නගරයට ඇවිල්ලා. එවිට කරීබ් දණ ගහලා මෙහෙම කියුවා :

"මම වැරදිකාරයා. මට සමාවෙන්න උතුමාණෙනි. මට යන්ට ඕන තැන නොවෙයි මම කියුවේ. අද උදේ පටන් බොරු කියන්ට පටන් ගත් නිසා හවස් වන තුරුම බොරු කියන්ට සිද්ද වෙලා. හැබැටම මට යන්ට ඕන තිප්ලිස් නගරයට!" කරීබ් කන්නලව් කළා.

"නුඹ බොරුකාරයා ! හොඳයි, මම නුඹට සමාව දෙනවා. ඇස් දෙක වහා ගනින් ... දැන් ඇස් දෙක ඇරපන් !"

කරීබ් මහත් වූ සතුටින් කෑ ගැසුවා. ඔහු තිප්ලිස් නගරයට ඇවිත්, හරිම පුදුමයක්. කරීබ් අසු පිටින් බැහැලා ලොකු උතුමාට හිස නමලා ආචාර කළා.

"ගරුතර උතුමාණෙනි ! ඔබට පින් අයිති වේවා ! තවත් උදව්වක් කරන්න. හැතැප්ම දහසක් එක දවසකින් ආවයි කිවුවම මාව කිසි කෙනෙක් විශ්වාස නොකරාවි. එසේ ආ බවට ඔබතුමා මට කිසියම් සහතිකයක් දෙන්න."

සුදු අස්පයාගේ අයිතිකරුවා හිනාවෙලා මෙහෙම කියුවා:

"මගේ අස්පයාගේ කකුල යට තියෙන පස් පිඩක් අරගෙන නුඹේ පසුම්බියේ දා ගනින්. නුඹේ කතාව විශ්වාස කරන්නේ නැහැයි කියුවොත් හත් අවුරුද්දකට ඉස්සෙල්ලා ඇස් අන්ධ වුණු කෙනෙකුව ගෙන්නලා, එයාගේ ඇස්වලට ඔය පස් ගාපන්. එතකොටැ එයාට ඇස් පෙනීම ලැබේවි."

සුදු අශ්වයාගේ කකුලකට පෑගිලා තියෙන පස් පිඩක් කරීබ් අරගෙන හිස ඔසවන්ටත් ඉස්සෙල්ලා අශ්වයයි එයාගේ පිට උඩ නැගලා සිටි මිනිහයි අතුරුදහන් වුණා. ඔන්න එතකොට තමයි කරීබ් දැනගත්තේ එයාට උදව් කළේ මිනිහෙකු නොවෙයි, දෙවියෙකු බව.

ඇඳිරි වැටුණා යින් පස්සේ කරීබ් එයාගේ ගෙය හොයාගෙන ආවා. ඔහු වෙවුලන අතකින් දොරට තට්ටු කරලා මෙහෙම ඇසුවා:

"අම්මේ, අම්මේ දොර අරින්න. මම ආගන්තුකයෙක්. දෙවියන් වහන්සේ විසින් එවාපු කෙනෙක්. පිටරටවල ඇවිදින ඔබගේ පුතාගේ නමට මට අද ඔබේ ගෙදර නවාතැන් දෙන්න." මහලු අම්මා දුබල හඬින් මෙසේ පිළිතුරු දුන්නා යඃ

"ආගන්තුකයින්ගේ නවාතැනට පොහොසතුන්ගේ සහ බලපුළුවන් කාරයින්ගේ ගෙවල් තියෙනවා. අද නගරයේ මගුල් ගෙදරක් තියෙනවා. එහාට යන්න. රැය සතුටින් ගත කරන්ට පුළුවනි."

"අම්මේ, මේ නගරයේ කවුරුවත් මම හඳුනන්නේ නැහැ. ඒ නිසයි මේ ඉල්ලීම කරන්නේ. පිට රටවල ඇවිදින ඔබේ පුතුගේ නමට මට මෙහි නවතින්ට දෙන්න."

එවිට කරීබ්ගේ නංගී අම්මාට මෙහෙම කියුවා:

"අම්මේ, මම ගිහින් දොර අරින්නම්."

"නැහැදිච්ච කෙල්ල. නුඹ කැමතියි මහ රෑ තරුණයින්ට නවාතැන් දීලා උන්ට කෑම බීම සපයන්ට. නුඹ එහෙම කරන්නේ දැන් අවුරුදු හතක්

තිස්සේ කඳුළු වගුරවපු නිසා මගේ ඇස් අන්ධ වුණු හන්දා තමයි." අම්මා ඇයට දොස් පැවරුවාය.

එහෙත් දුව අම්මාගේ දොස් තැබීම්වලට සවන් නොදී නැගිට දොර හැර කරීබ්ට ගෙට ඇතුළු වීමට ඉඩ සැලසුවාය. කරීබ් සිරිත් පරිදි ඇයට ආචාර කර, සිතෙහි අති මහත් නොසන්සුන්තාවයෙකින් ගෙය හොඳට බලන්ට වුණා. එයා දැක්කා එයාගේ වීණාව ගෙදර බිත්තියේ එල්ලා තිබෙන සැටි. එවිට ඔහු අම්මාගෙන් මෙසේ ඇසුවාః "මේ බිත්තියේ එල්ලා තියෙන්නේ මොකක්ද?"

"ආගන්තුකය, නුඹ ඕන නැති දේ අහන්ට එපා. නුඹට රෑ කෑමට පාන් කෑල්ලක් ලැබේවි. හෙට උදේට දෙවියන්ගෙ නාමෙට යන දිහාවකට පලයන්."

"මම කිව්වා අම්මේ ඔබ මගේ වැදූ මවු කියලා, මේ ඉන්නේ මගේ නංගී, ඉතින් අම්මා මට කියන්න මේ බිත්තියේ එල්ලා තියෙන්නෙ මොකක්ද කියලා ?"

"ඒක තමා වීණාව" අම්මා කියුවේ ඔහුව විශ්වාස නොකර තරහයෙන්.

"වීණාව කියන්නේ මොකක්ද ?"

"එය වාදනය කරලා සින්දු කියන සංගීත භාණ්ඩයක්."

එම වීණාව එයාට පෙන්වන්ටයි කියලා කරීබ් නංගීගෙන් ඉල්ලා හිටියා.

"අපොයි බැහැ. ඒ වීණාව මගේ අවාසනාවන්ත පුතාගේ. අවුරුදු හතක් තිස්සේ එල්ලපු තැනම තියෙනව. කිසිවෙක් එය අතින් ඇල්ලුවේ නැහැ." අම්මා විස්තර කළා.

ඒ වුණාට නංගී නැගිටලා බිත්තියේ එල්ලා තිබෙන වීණාව රැගෙන ඔහුට දුන්නා. එවිට කරීබ් දෙවියන්ට මෙසේ කන්නලව් කළාః

"අහෝ සර්වබලධාරී දෙවියනි! මගේ බලාපොරොත්තුව ඉටු වීමට නම්, මේ වීණාව මීට අවුරුදු හතකට ඉස්සෙල්ලා මා වාදනය කළ දවසේ හඬ දුන් විදිහටම හඬ නගන්ට ඕනේ." ඔහු වීණාව වයන්ට පටන්ගත් විට, එයින් ඉතා මිහිරි නාදයක් පිට වුණා. ඔහු මෙවැනි ගීතයක් ගායනා කළාః "හිඟන්නෙකි මම (කරීබ් යන අරාබි වචනයේ තේරුමත් හිඟන්නා යනුයි). මගේ වචන ඉතා චාම්ය. උස කන්දේ සිට මෙහි එන්නට උදව් වුණේ මට මුනිතුමාය. මගේ වචන නැත ලස්සන. අම්මේ මාව හඳුනා ගන්න.''

ඔන්න ඒ ගීතය අහලා අම්මා සුසුම් ලෑවාః "නුඹේ නම කුමක්ද ?"

"මගේ නම රෂීඩ් (වීරයා)."

"රෂීඩ්, මා කියන දේ අහපන්. නුඹේ ලස්සන ගීතය නිසා මගේ හදවත දුකින් පැලුණා. අද රෑ මම හීනෙන් දුටුවා, මගේ හිසකේ පැහිලා සුදු වන සැටි. මගේ ඇස් දෙක පොට්ට වෙලා දැන් අවුරුදු හතක් වෙනවා. නුඹේ කටහඬ

හරියටම මගේ පුතාගේ කටහඬ වගේමයි. මගේ පුතා ගෙදර එන්නේ කවදාටද කියලා නුඹට කියන්ට පුළුවන්ද ?"

අම්මා දෙවරක්ම එහෙම ඇසුවේ අඬා කඳුළු වගුරවමිනි. දෙපාරම ඔහු ඇගේ පුතා බව කිව්වාට ඈ එය විශ්වාස කළේ නැහැ. ටික වේලාවකට පසුව ඔහු ඉල්ලීමක් කළා: "අද මේ ළඟ මගුල් ගෙයක් තියෙනවයි කියලා ආරංචියි. අම්මා මට අවසර දෙනවද වීණාව අරගෙන එම මගුල් ගෙදරට යන්නට. මට යම්කිසි මුදලක් ලැබුණොත්, එය මෙහාට ගෙනැවිත් ඔබත් සමග බෙදාගන්නම්."

"නැහැ. අවසර දෙන්නේ නැහැ. මගේ පුතා ගෙදරින් පිටවෙලා ගිය දවසෙ ඉඳලා, ඔය වීණාව කවුරුවත් අතින් ඇල්ලුවේ නැහැ."

වීණාවට කිසිම හානියක් නොකැර එය ආපහු ගෙනෙන බවට ඔහු දිවුරා පොරොන්දු වුණා.

"මේ වීණාවේ එක තතක්වත් එහෙම බිඳිලා තිබුණොත් මගේ වස්තුවෙන් එයට වන්දි ගෙවන්නම්" කරිබ් පොරොන්දු වුණා.

මැහැල්ල ඔහු සතු මල්ල අත ගා බලා, එහි බොහෝ කාසි තිබෙන බව සැක හැර දැන ගත්තෙන් වීණාව ගෙන යාමට ඉඩ දුන්නා.

ඔහුගේ නංගී ඔහු කැටුව මගුල් ගෙදරට ගිහිල්ලා, අයිනකට වෙලා බලාගෙන හිටියා මොනවා වේවිද කියලා.

එය මෙගේරි වාසය කරන ගෙදර ය. එදින රැයෙහි ඇය කුර්සුද්-බේක් සමග විවාහ විය යුතුය. කුර්සුද්-බේක් එයාගේ මිතුරන් සමග කමින් බොමින් ප්‍රීති වුණා, මෙගේරි මුස්ලිම් සිරිත අනුව තිරයට එහා වාඩි වෙලා හිටයා. ඇය ළඟ ඇගේ යෙහෙළියෝ හිටියා. මෙගේරිගේ එක අතක විෂ පානයක් සහිත කෝප්පයක්. අනිත් අතේ මුවහත ඇති කිනිස්සක්. කුර්සුද්-බේක්ගේ බිරිඳ බවට පත්වීමට ඉස්සෙල්ලා ඈ මිය යන බවට පොරොන්දු වුණා. නාඳුනන මිනිහෙක් ඇවිත් කතා කරන සැටි තිරයට පසුපසින් ඇයට ඇසුණා.

"ආයුබෝවන් ! ඔබ අද මඟුල් උත්සවයට සූදානම් වෙලා කා බී සතුටු වෙනවා නේද. මටත් මෙහෙන් වාඩි වී ඔබ සමග සතුටු වෙලා ගීත ගයන්න අවසර දෙන්න."

"සත්තකින්ම, ඔව්. මෙතැන අද ගායකයෝ ගයන්ට ඕන. නැට්ටුවෝ නටන්ට ඕන. අද මෙහි මගුල් ගෙයක්. අෂීක්, (ගායකයා) සින්දුවක් කියාපන්. මම නුඹට රන් කාසි අහුරක් දෙන්නම්'' කුර්සුද්-බේක් මනමාල අප්පු කියුවා.

"ගායකයා, නුඹේ නම මොකක්ද ?" මනමාල අප්පු ප්‍රශ්න කළා.

"හනිකට දැනගන්."

"අපොයි, හරිම විහිළුවක් තමයි. මෙහෙම නමක් මගේ ජීවිතේ පළමුවැනි වරට අහලා තියෙනවා." මනමාල අප්පු හෙවත් කුර්සුද්-බේක් හිනාවුණා.

"ඒකත් හරියට දුන්නම කන්නා, කාලා දුවන්නා වගේ නමක් නොවැ."

"මගේ අම්මාට මා ඉපදෙන්ට යන විට අහළ පහළ ගෑනු ඇවිල්ලා මගේ අම්මාගෙන් අහලා තියෙනවා, ලැබෙන්නට යන්නේ පුතෙකු ද නැතිනම් දුවක ද කියලා. අම්මා කියලා තියෙනවා 'හනිකට දූනගත්' ඉතින් අහළ පහළ උදවිය මට ඒ නම තැබුවා." ඔන්න ඊට පස්සේ කරීබ් වීණාව වාදනය කරලා ගීතයක් ගායනයා කළා:

හලාප් නගරේ ලස්සනයි
බීපු වයින් බොහෝ රසයි.
දෙවියෝ දීපු පියාපතින්
මෙහෙ ආවා විනාඩියෙන්.

මනමාලයාගේ මල්ලී තරමක් මෝඩ පහේ මිනිහෙක්. මේ සින්දුව අහලා එයාට කේන්ති ගියා. එයා කිනිස්ස අතින් ඇරගෙන කෝප වෙලා කෑ ගැසුවා:

"නුඹ බොරු කාරයෙක්. නුඹ කොහොමද යකෝ හැතැප්ම දහසක් දුර ගෙවලා එක විනාඩියට මෙහේ ආවේ? "

"එහෙම කිව්වාය කියලා නුඹට ඕන මාව මරා දමන්ටද? ගායකයා සියලු දේ එකට එකතු කරලා තමයි ගායනය කරන්නේ. නුඹලා මාව විශ්වාස කළත් නොකළත් මම නුඹලාගෙන් තඹ සතයක්වත් අය කරන්නේ නැහැ." කරීබ් පිළිතුරු දුන්නා.

"තමුසේ දිගටම සින්දු කියනවා." මනමාලයා කිව්වා.

අෂික්-කරීබ් දිගටම සින්දු කියන්ට පටන් ගත්තා:

"දේව මෙහෙයට උදේ මම අර්සින් නරගයේ
දහවල් දෙවියන් වැන්දේ අර්සෙරුම් පුරයේ
කාස් වලට මා ආවේ හවස දේව මෙහෙයටයි
රෑ වනු විට දෙව් පිදීම තිප්ලිස්වලදියි
දෙවියෝ දීපු පියාපතින්
මෙහේ ආවා විනාඩියෙන්
මා නංවාගෙන සුදෝසුදු අසකු පිට
පියාසර කළා වේගය බඳු පවනට
අෂික්, දෙවියන්ගෙන් පියාපත් ලබාගෙන
ආවා මෙගේරිගෙ මගුලට ගී ගයාගෙන.''

මෙගේරි කරීබ්ව හඳුනාගත්තේ ඔහු ගායනා කළ ගීතමය කටහඬින්. එවිට ඇ වස පානයත් කිනිස්සත් වීසි කළා.

"ඔන්න ඔයා දීපු පොරොන්දුව ඉටු කරන සැටි. එහෙනම් අද ඔයා කුර්සුද් බේක්ගේ බිරිඳ වෙනවා නේද?" ඇගේ මිතුරියෝ ඇගෙන් ඇහුවා.

"ඔයාලට අඳුනාගන්ට බැරි වුණාට මම ඒ කටහඬ ඇඳින්නා." මෙගේරි එහෙම කියලා කතුරක් ඇරගෙන තිරය කපලා ගායකයා දිහා බැලුවා. එයා වෙන කවුරුවත් නොවෙයි, අෂීක්-කරීබ් බව දැනගත්තු හැටියේම මෙගේරි එයාගේ බෙල්ල බදාගෙන කෑ ගහලා, සිහිය නැතුව ඇද වැටුණා.

මනමාලයගේ මල්ලී දෙදෙනාවම මරා දමන්ට කිනිස්ස ඇරගෙන ඉදිරියට පැන්න හැටියේම මනමාලයා එයාව නැවත්තුවා.

"නුඹ කලබල වෙන්ට එපා. අපේ සර්වබලධාරී දෙවියෝ නියම කරලා තියෙන හැටියට තමා සිදු වන්නේ. ඒවා වලක්වන්නට බැහැ."

මෙගේරිට සිහිය ආපු හැටියේම එයාට ලජ්ජා සිතුණා. එයාගේ මුහුණ රතු පාට වුණා. එතකොට එයා මුහුණ වසාගෙන ආයෙමත් තිරයේ පිටුපසට ගිහින් හැංගුණා.

"දැන් නම් පැහැදිලියි නුඹ අෂීක්-කරීබ් බව. නමුත් අපට විස්තර කරපන් මේ තරම් විශාල දුරක් නුඹ ආවේ කොහොමද කියලා ?"

"මගේ කතාව ඔප්පු කිරීම පිණිස මම ලැහැස්තියි, මගේ කඩුවෙන් ඕනෑම තදැති ගල් පරුවතයක් දෙකට කපා දැමීමට. මම බොරු කියනවා නම් මගේ බෙල්ල හිස කේ ගසක් තරම් සිහින් වෙන්ට ඕන. එයට වැඩිය ලොකු දෙයක් මට කළ හැකියි. හත් අවුරුද්දක් තිස්සේ ඇස් පෙනෙන්නේ නැති පොට්ට ගැහැනියකුව අඬ ගහගෙන එන්න. මම එයාට නැවත ඇස් පෙනීම ලබා දෙන්නම්."

අෂික්-කරීබ්ගේ නංගී මේ කතාව අහගෙන හිටියා නෙව. ඉතින් එයා ඉක්මනට ගෙදර දුවගෙන ගිහිල්ලා අම්මාට මෙහෙම කිව්වාඃ

"අම්මේ, එයා නම් වෙන කවුරුවත් නොවෙයි. අයියා ම තමයි. ඔබේ පුතා අෂික්-කරීබ්." නංගී අම්මාගේ අතින් අල්ලාගෙනැ ආවා මඟුල් ගෙදර.

එවිට කරීබ් එයාගේ පසුම්බියේ තිබුණු පස් ටික ඇරගෙන වතුරෙන් දිය කරලා අම්මාගේ ඇස් දෙකට ගෑවා.

"මට කන්ද උඩ දී හමුවුණේ උතුම් මුනිවරයෙක්."

අම්මාගේ ඇස් දෙක සුවය ලැබුවා. ඇයට ඇස් පෙනීම ලැබිණි. එතකොට තමා හැමදෙනාම විශ්වාස කළේ එයා අෂීක්-කරීබ් බව. කුර්සුද්-බේක් නිහඬව මෙගේරිට එයාගේ ස්වාමි පුරුෂයා ලෙස අෂීක්-කරීබ්ව තෝරා ගැනීමට ඉඩ දුන්නා.

ව්ලදීමිර් දාල්

බළලා සහ හිවලිය

ඔන්න එක ගෙදරක හිටියා බළලෙක්. ඌ තරුණ කාලෙ දී යසට මීයන් ඇල්លුවා. මහලු වයස ළං වෙනවිට බළලා බොහොම කම්මැලි වෙලා මීයන් ඇල්ලීම නවත්වා දැම්මා. ගෙදර කිසිම වැඩකට උදව් වුණේ නැහැ. ගෙදර අය ඔහුට කෑම බීම දුන්නා. දැන් ඉතින් මට ඉස්සර වගේ මීයන්ගෙන් වැඩක් නැහැ. කිරි, මුදවපු කිරි, කේජු, වෙඬරු, බටර්වලින් ජීවත් වෙනවා කියලා මහලු බළලා කල්පනා කළා. එක දවසක් ගෙදර ස්වාමි දුව ස්වාමියා ට බැණ වැදිලා මෙහෙම කියුවා: "ඔයා මොකට ද මේ ගෙදර ඔය කම්මැලි බළල් තඩියට ඉන්ට දීලා තියෙන්නෙ.

උෟ මීයකු තියා මී වලිගයක්වත් අල්ලන්නේ නැහැ. පිනට කකා ඉන්නවා. මට අහන්ට ලැබුණා ඔය බළලා නිසා අප දිහා බල බලා මීයෝ සිනාසෙන සැටි. මහලු බළලා නිසා ගෙදර ඉන්ට පවා ඉඩක් නැහැ. මූ හොර උපාසක බළලෙක්."

"ඉතින් ඔයා මොකටද මට බණින්නේ? උෟ මගේ පුතාද? ඔයා ගෙදර ස්වමිදුව, ඔයාට ඕන හැටියට වැඩ කරගන්න."

එවිට ස්වමිදුව කිව්වා, "බළලුන්ගෙන් බේරීම ගැහැණුන්ට අයිති වැඩක් නොවෙයි. ඒක පිරිමි වැඩක්. ඔයා දර කපන්ට කැලයට යන විට උෟවත් ගෙනියලා කැලෑවේ දාලා එන්ට," කියලා. ස්වමියා බිරිඳගේ උපදෙස් අනුව බළලාව මල්ලකට දමාගෙන කැලයට ගෙනියලා, දර කපලා ගැල පුරවා ගෙනැ, බළලාව ලොකු වළකට දාලා ගෙදර ආවා. බළලා වළට වෙලා මෙහෙම කල්පනා කළාඃ

"මම බල්ලෙක් නම්, මගේ හතුරා වුණත්, කරත්තය පසුපසින් බුර බුරා යනවා. මම බිලාලයකු නිසා එවැනි දෙයක් මට කරන්ට බැහැ. මේ වළ ඇතුළෙ මට මැරෙන්ට තමා සිද්ද වෙලා තියෙන්නේ."

"ආයුබෝවන් බළල් හාමි !" බළලාව දුටු හිවලිය හෙවත් කපටි රාළ හාමිනේ එයාට ආචාර කළා.

"නුඹත් කැමති නම් නුඹටත් ආයුබෝවන්!" ගෙදර ස්වාමියා කෙරෙහි කෝප වෙලා හිටිය බළලා කිව්වා.

"මේ උන්නැහෙ කැලෑවට ආවෙ මොකටද ?"

බළලා සිදුවුණු දේ විස්තර කළා.

"එකට එකතු වෙලා කිරියි, පැණියි වගේ හිටියා. නාකි වුණාම වැඩකට නැතැයි කියලා පන්නා දැම්මා. දැන් ඉතින් මා ඉවරයි."

කපටි රාළ හාමිනේට හොඳ කපටි අදහසක් පහළ වුණාඃ "බළලුන් මේ කැලෑවේ නැහැ. අපේ කැලෑවේ සතුන්ට මේ බළලාව පෙන්වලා උන්ව බය කරන්ට පුළුවනි."

"බළල් හාමි, මට ඔයා ගැන බොහොම දුකයි. එන්ට මගේ ගෙදරට, ඇවිත් මට තියෙන දෙයින් යමක් කාලා ජීවත් වෙන්ට. මම දුප්පත් සතෙක්."

"අනේ හිවල් රාළ හාමිනේ ඔයාට බොහොම ස්තුතියි."

හිවලිය බළලාව කැටුව එයාගේ හිවල් ගුහාවට ගියා. බළලාට ලොකු ගුහා කටක් හදලා දුන්නා. අනික් සතුන් මේ ගුහාව දැක්කම බයවෙන විදිහට හිවලා ගුහාව හැදුවා. බළලා ගුහාවට වෙලා ගිමන් හරිනවා.

හිවලිය ගියා කැලෑවෙ ඉන්න අනිත් සතුන් හමුවීමට. සතුන්ගේ සමාජයට සාමය සමාදානය හා සුබ සිද්ධිය පතා හිවලිය රැස්වුණු සතුන්ට මෙහෙම කිව්වා:

"ඔන්න ඉතින් අපේ කැලෑවේ වෙන දේ දන්නවද ? ඔන්න අපට එවලා තියෙනවා කැලෑපතියෙක්. එයා හරිම භයානක සතෙක්. ඒ වගේ සතකුව අපි කවදාවත් දැකලා නැහැ. මහ නරක දසාවක් අපට ලැබිලා. ඒ කැලෑපතියාගේ නම බළල් රාළහාමි, එයාගේ මූණේ දිග රැවුළු ගස් තියෙනවා. දිවේ කටු තියෙනවා. ඇස් දෙක ගිනිබෝල වගේ දිලිසෙනවා. නියපොතු බොහොම තියුණුයි. වලිගය නයකු වගෙයි. මහ නපුරා. දැන් එයා නිදි! එයා ගොරවන්නේ හරියට මිනිහකු වගෙයි. නමුත් හරියට නිදාග න්නේ නැහැ. නිදිකිරා වැටෙනවා විතරයි, නිතරම කියන්නෙ 'මට මදියි, තවත් ඕන, තවත් ඕන' කියලා. මොනවා දුන්නත් එයාට මදි. ඔන්න ඉතින් කැලෑවේ වාසය කරන්නෙනි, එයා මගේ ගෙදරට රිංගා ගෙන මාවත් මෙල්ල කළා. එයා මගේ හිවල් ගුහාවට බොහොම කැමතියි, මම ඒ වුණාට අමනාප වුණේ නැහැ. මට පුළුවනි වෙනත් ගුහාවක් හොයාගන්ට. නමුත් එයා මට කියනවා එයාට කෑම හොඳට පිළියෙල කරලා දෙන්ට කියලා. මායි මගේ ගෙදර මෙහෙකාරියයි බලාගෙන ඉන්න විට එයා මා මුළු අවුරුද්දේම දඩයම් කරලා එකතු කරගත් මස් සේරම කාලා දැම්මා. ඔන්න මට එයා අණ කළා කැලෑවේ ඉන්න සියලුම සතුන්ව එකතු කරලා එයාගේ නියෝගය අනුව දවස් පතා එයාට කෑම බීම ගෙනෙන්ටයි කියලා. මගේ අසල්වැසියනි, මිතුරනි, නුඹලා මට වඩා නුවණක්කාරයි, කළ යුත්තේ මොනවාදැයි නුඹලා දන්නවා. අපේ අලුත් කැලෑපතියා මහ වසයි. කෝපවෙලා ඉන්නේ! නුඹලා ඔහුගේ නියෝගය ඉටු කරපල්ලා."

වනයේ වාසය කරන සත්තු කැළඹීමට පත් වුණා. "තව කල් යනව විට, කරදර වැඩි වෙයි" වලසා හිස කසලා එහෙම කියුවා. සත්තු රැළ, එක් එක් සතා, අසුවල් දවසේදී අසුවල් කෑම ජාති ගෙනා යුතු යැයි නියම කරගෙන විසිරිලා ගියා. හෙට පළමුවැනි දවසේදී කැලෑපතිතුමා බැහැ දැකීමට හිවල් ගුහාවට පැමිණිය යුතු යැයි ගිවිසගෙන සියලු සත්තු විසිර ගියා. එහෙම එන විට එක් එක් සතෙක් තෑග්ගක් බැගින් ගේන්ට ඕන.

ඔන්න ඉතින් සේරම සත්තු ජාති ඇවිත් බයෙන් බයෙන් තෑගි හිවල් ගුහාව ඉදිරිපිට තැබුවා. වෘකයා මරාපු වහු පැටියෙකුගෙන් බාගයක් ගෙනාවා. වලසා මී පැණි පීප්පයක් ගෙනාවා. උගුඩුවා තාරාවකු ගෙනාවා. උගුඩු මායියා තාරා බිත්තර දෙකක් ගෙනාවා. හැම සතෙක්ම එක් එක් තෑග්ග බැගින් ගෙනාවා. හැම දෙනාම හිටගෙන ඉන්නවා මිසක් බළලා

ළඟට යාමට තරම් නිර්භය වුණේ නැහ. හිවලිය පිටතට හොම්බ දමලා බොහොම හෙමින් මුණු මුණු ගෑවාඃ

"ඔයගොල්ල දන්නවද, අපේ කැලෑපතිතුමා තවම නිදි, එයාව අවදි කරවන්නට මට බැහැ. මට බයයි. විසිරිලා යන්ට එපා නැවතිලා ඉන්න!"

"මේ අහන්නකො නැනා!" වලසා හිවල් හාමිනේට කතා කළා.

හිවලා ආයෙමත් හොම්බ දොට්ට දමලා මෙහෙම කියුවාඃ

"වලස් ගොයියා, මම ඔයාගෙ නැනා නොවෙයි, මම දැන් කැලෑපතියාගේ බිරිඳ, කැලෑපතිනිය. කැලෑපතියා අපේ කැලෑවට ආවේ තනිකඩයකු හැටියටයි. මම ජීවත් වුණේ ස්වාමි පුරුෂයා නැති වැන්දඹු හිවලියක් හැටියට බව ඔයගොල්ල හොඳට දන්නවා නොවැ. කැලෑපතියා මාව එයාගෙ බිරිඳ බවට පත් කරගත්තා. දැන් මම ඔහුට සේවය කරනවා. ගෙදර ස්වාමිදුවත් මම තමා. දැන් ඉතින් මගේ නම හිවල් බිලාල හාමිනේ."

සත්තු කරබාගෙන නිහඬ වෙලා හිටියා. වලසා හිස හරව හරවා වටපිට බලා, දෑතේ නියපොතු දිහා බැලුවා.

ටික වේලාවකට පස්සේ හිවල් බිලාල හාමිනේ ඇවිත් සතුන්ගේ වැඩිමහලු අයට අඬ ගැසුවේ, ඔවුන් කැලෑපතියාට ආචාර කළ යුතු බව දැන්වීමටයි.

සත්තු බොහාම බයවෙලා හෙලවෙන්නේ වත් නැතිව ඉන්නවා. එකිනෙකා දිහා බලා ලා මෙහෙම කියනවාඃ

"ඔයා යන්න ඉස්සෙල්ලා, මම පසුව."

අන්තිමට නියම වුණේ වල් ඌරා ගිහිල්ලා කැලෑපතියා බැහැ දැකිය යුතුයි කියලා. ඒ වල් ඌරා බොහොම මහලුයි, මයිල් පවා හැලිච්ච සතෙක්. ඔහු බළලා ළඟට ගොස් 'ප්රූස්! ප්රූස්!' ගාලා බොහොම බැගෑපත් ලෙස ශබ්ද කළා. "මේ සතා ඌරකු වගේ හැසිරෙනව" කියලා හිවල් බිලාල හාමිනේ එයාව පන්නා දැම්මා.

ඊළඟට වලසාගේ වාරයයි. වලසා ගුහාව ඇතුළට එබී බැලුවාම අඳුරේ බළලාගේ ඇස් දෙක ගිනිබෝල වගේ දිලිසෙන සැටි දුටුවා. උගේ රැවුළු ගස් සහිත වටකුරු මුහුණ දුටුවා. වලසා කොතරම් බිය වුණාදැයි කියතොත්, එයාගෙ දණහිස් වෙවුලන්ට පටන් ගත්තා. වලසා මොනවාදෝ මුණු මුණු ගාලා කියාලා හිස පාත් කරලා පිටවී ගියා.

"පලයන් යන්ට ! වලස් මෝඩයා ! තකතීරුවා ! කැලෑපතියා එනවා !" එහෙම බැණ වැදුණේ හිවලිය.

ඔන්න එවිට සියලු සත්තු බයේ පැනලා දිව්වා. සමහරු ගස් උඩට නැග ගත්තා. අන් සමහරු පඳුරු අස්සට වෙලා සැඟවුණා. එතකොට හිවලිය බළලාට රහසක් කියන්නා වගේ කට කොඳුරා මෙහෙම කිව්වා: "පුළුවන් තරම් උඩට වලිගය හරවාලා නටවන්න." බළලා එයාගේ පුටුව උඩට නැගලා සතුන් ගෙනාපු කෑම වර්ග රස කර කර කෑවා. ගෙදර ඉන්න කාලයේදී කියාපු විදහට "මට මදි! තව ඕන, මට මදි!" කියලා කිව්වා.

මේ වෙලාවේ දී වලසා ලොකු පඳුරක් අස්සේ සැඟ වී, අතු මෑත් කරලා අපූරු කැලෑපතියා දිහා බැලුවා. එවිට, කොළ සෙළවෙන සද්දයක් ඇති වුණා. බළලා සිතුවා ඒ මීයෙක් කියලා; ඉතින් ඌ එකවරම එතැනට පැන්නා. අපේ අවසානය ඇවිල්ලයි කියලා සියලු සත්තු බය වෙලා පණ එපයි කියලා දිව්වා. සියලුම සත්තු මේ කැලෑවේ සිට අනික් කැලෑවට දුවලා ගියා. හිවලිය සහ බළලා විතරයි කැලෑවේ ඉතුරු වුණේ. දැන් දඩයමට හොඳට ඉඩ පහසුව තියෙනවා. ඔන්න ඉතින් ඔය විදිහට කපටි හිවලිය මහලු බළලා ව ඇගේ ප්‍රයෝජනය පිණිස හරවා ගෙන කැලෑවේ හිටිය සතුන්ව බය කරලා පන්නා දැම්මා.



කොන්ස්තන්තීන් උෂීන්ස්කි

අන්ධ අශ්වයා

මීට අවුරුදු දහස් ගණනකට ඉස්සෙල්ලා විනේතා කියලා නගරයක් මුහුදු වෙරළක තිබුණා. ඒක වෙළඳ වරායක්, ස්ලාව් ජාතික නගරයක්. ඒ නගරයේ වාසය කළා ඉතා පොහොසත් වෙළෙන්දෙක්, එයාගේ නම උසේදොම්. එයාගේ නැව් බොහෝ වටිනා බඩුත් රැගෙන ලෝකයේ ඈත මුහුදු, සාගර යාත්‍රා කළා.

ඒ ගෙදර හැම දෙයක්ම තිබුණා. ඒ නිසා තමයි එයාට උස්දොම් කියලා නම් කළේ. ඒගොල්ලන්ගේ බසින් එහි තේරුම නම් සෑම දෙයක් ම තියෙන ගෙදර අයිතිකාරයා යන්නයි. ඒ වගේම ඒ කාලය අනුව ඒ ගෙදර සෑම දෙයක්ම තිබුණා. ගෙදර ලොක්කයි, එයාගේ බිරිඳ

සහ ළමයි කැවේ රන් පිඟන් වලින්, බීවේ රන් රිදී කුසලාන වලින්. ඉතා වටිනා ඇඳුම් ඒගොල්ල ඇන්දා.

උසේදොම්ගෙ අශ්ව ඉස්තාලෙ ඉතා හොඳ අශ්වයෝ බොහොම හිටියා. එයාගේ ඉතාම හොඳ අශ්වයා මුළු මහත් විනේතා නගරයේම හිටිය උසස්ම අශ්වයා. උගේ නම වාත වේග. ඌට එහෙම නම් කරලා තිබුණේ ඌ සුළං පහරටත් වඩා වේගයෙන් දුවන නිසා. වාත වේගයාගේ පිට උඩ ගෙදර ස්වාමියා හැරුණු විට වෙන කිසිවෙක් යන්නේ නැහැ. ඒ වගේම ස්වාමියාත් වාත වේගයාගේ පිට උඩ නැගලා තමයි ගමන් ගියේ.

තමාගේ වෙළඳ කටයුත්තක් සඳහා වාත වේගයාගේ පිට උඩ නැගිලා වෙළෙන්දා කැලෑවක් හරහා විනේතා නගරයට එමින් සිටියා. ඒ කැලෑව මහ විශාලයි, අඳුරුයි. හවස ඇඳිරිය වැටෙන්ට ඔන්න මෙන්න කියා තිබුණා. කැලෑව තුළ අන්ධකාරය තවත් වැඩි වුණා. හුළං පාරට ගස් සෙලවෙන්ට පටන් ගත්තා. අශ්වයා මහන්සි වී සිටිය නිසා වෙළෙන්දා ඌ පිට නැග ලා සෙමින් ගමන් කළා.

හිටි හැටියේම පඳුරක් අසල හැංගිලා හිටිය මහ පල් හොරු හය දෙනෙක් පාර අවහිර කළා. උන්ගේ මුහුණු බොහොම භයංකාරයි. උන්ගේ අත්වල කැති, පොරෝ පිහියා වැනි අවි තිබුණා. තුන් දෙනෙක් අශ්වයින් පිට නැගලා හිටියා. ඉතිරි තුන්දෙනා හිටගෙන උන්නා. හොරු දෙන්නෙක් වහාම ඉදිරියට පැනලා වාත වේගයාගේ කටකලියාවෙන් අල්ලා ගත්තා.

වාත වේග හැර වෙනත් අශ්වයෙක් එහෙම හිටියා නම්. වෙළෙන්දාට විනේතා නගරයේ තමාගේ මහා ධනය සහ යස ඉසුරු දකීමට ආයෙමත් කිසි දිනෙක ඉඩක් ලැබෙන්නේ නැහැ. අශ්වයා එක පාරටම ඉදිරියට පැනලා කඳ වැනුවා විතරයි උගේ කටකලියාව අල්ලාගෙන හිටිය පල් හොරු දෙදෙනා බිම ඇද වැටුණා. වාත වේග තුන්වැනි පල් හොරාගේ දෙපා පෑගුවා. ඒ පල් හොරා ඔහු අත තිබුණු අවි වැනුවා. වාත වේග සුළං පහර පරදවන වේගයෙන් ඉගිලෙනවා වගේ දුවන්ට පටන් ගත්තා. ඉතිරි පල් හොරු තුන්දෙනා වාත වේග පසුපස ඔවුන්ගේ අශ්වයින් පැන්නුවා. ඒ අශ්වයෝ තුන් දෙනත් හොඳ සත්තු. නමුත් වාත වේග සමග කොහොමටවත් උන්ට දුවන්ට බැහැ.

වාත වේග දුන්නකින් පිටවන ඊයක් වගේ වේගයකින් දුවපු නිසා නපුරු පල් හොරුන්ට බැරිවුණා, වෙළෙන්දාව අල්ලා ගන්නට.

පැය බාගයකින් මහ කැලෑව පසු කළ උසේදොම් විනේතා නගරයට සේන්දු වුණා. වාත වේග කොතතරම් වේගයකින් දිව්වේ ද යත්, උගේ කටින් පෙණ මතු වුණා.

ගෙදර ඇවිත් හති දමන අශ්වයා පිටින් බිමට බට උසේදොම් උගේ බෙල්ල අත ගාලා, ඩහදිය පිස දමලා මෙවැනි පොරොන්දුවක් වුණා: "මොනවා වුණත් මගේ පණ බේරගත්තු අශ්වයාව මම කාටවත් විකුණන්නෙවත් නැහැ. එළවා දමන්නේවත් නැහැ. කොතරම් නාකි වුණත් අශ්වයාට හොඳට සළකන්ටත්, හැමදාම ඌට ඉතාම හොඳ වර්ගයේ කොල්ලු සේරු තුනක් දීමට කටයුතු යොදනවා."

උසේදොම් එහෙම කියලා බිරිඳ සහ ළමයින් බැලීමට ඉක්මනට ගියා. ඔහු ඒ වෙලාවේ අශ්වයාට නිසි සැලකිලි කළේ නැතුවයි, යන්ට ගියේ. ඉස්තාලෙ සේවකයා කම්මැලියෙකි, එයා බොහොම විඩාපත් වෙලා හිටිය අශ්වයාට නිසි ලෙස සාත්තු නොකැර, උගේ හතිය ඉවරවෙන්ටත් කලින් ඌට ඇල් වතුර දුන්නා. අශ්වයා එය බීපු දා සිට ලෙඩ වුණා.

වාත වේග නමැති අශ්වාය දිගින් දිගටම ලෙඩ වෙලා දුර්වල වුණා. අන්තිමේදී උගේ ඇස් දෙක අන්ධ වුණා. වෙළෙන්දා බෙහොම කනගාටු වෙලා මාස හයක් තිස්සේම පොරොන්දුව අනුව අශ්වයාට සාත්තු සප්පායම් කළා. අන්ධ අශ්වයා ඉස්සර වගේම අශ්ව ඉස්තාලේ ඉන්නවා. ඌට දිනපතා කෑමට කොල්ලු සේරු තුනක් ලැබෙනවා.

කලකට පස්සේ උසේදොම් වෙනත් අශ්වයකුව මිලදී ගත්තා. තවත් හය මාසයකට පසුව, වෙළෙන්දා කල්පනා කළා, නිකම් ඉන්න සතකුට කරන වියදම් වුවමනා නැති එකක් බව. පොට්ට අස්පයකුට කොල්ලු සේරු තුනක් වැඩියි, ඒ නිසා සේරු දෙකක් බැගින් දීමට ඔහු අණ කළා. තවත් හය මාසයක් ගියාට පසුව පොට්ට අස්පයා තවමත් තරුණයි, මැරෙන පාටක් පෙනෙන්ට නැහැ. වෙළෙන්දා අණ කළා එක සේරුවක් බැගින් දීමට. තවත් හය මාසයක් ගියායින් පස්සේ, වෙළෙන්දා අණ කළා අස්ව ඉස්තාලේ දොරවල් ඇරලා, වාත වේග අන්ධ අශ්වයාව ඉස්තාලෙන් පිටතට පන්නා දැමීමට. ඌ පිටතට යාමට කැමති වුණේ නැති නිසා සේවකයෝ ඌට රිටකින් ගහලා එලවලා දැම්මා.

අනේ පව්, අසරණ අන්ධ අශ්වයාට තේරුම් ගන්ට බැරි වුණා ඌට මොනවා කළාද කියලා. ඇස් නොපෙනෙන නිසා ඌට කොහේවත් යන්ට බැහැ. ඌ දොරටුව අසල හිටගෙන හිටියේ කනගාටුවෙන් බෙල්ල පහත් කරගෙන, දෙකන් සොළවමින්. රෑ බෝ වුණා. හිම කැටිත් සමග වැස්සක් වැස්සා. ගල් කැට මත නිදාගන්ට බැහැ. අසරණ සතාට හීතලයි; ඌ පැය කීපයක්ම හිටගෙන හිටියා, අන්තිමේදී බඩගින්නක් දැනුණා. ඌ කෑම හොයන්ට පටන් ගත්තා. ඌ ඔළුව උස්සලා ඉව කරලා වෑයම් කළේ කොහේ

හරි වහලක පිදුරු ටිකක්වත් තිබේද කියලයි. අන්ධ අශ්වයා වත්තේ කොණක නැතිනම් වැට ළඟ කෑම ටිකක් තියෙනවද කියලා ඉව කරන්නට වුණා.

ඒ කාලයේදී විනේතා නගරයේ රජ කෙනෙක් හිටියේ නැහැ. ඉස්සර ස්ලාව් ජාතිකයින් නගර පාලනය කළේ මණ්ඩලයක් මගින්. වැදගත් ප්‍රශ්න විසඳන්ට ඕන වුණාම නගර වැසියන් සියලු දෙනාම නගරයේ චතුරශ්‍රයට එනවා. දඬුවම් දීම, දඩ ගැසීම, නිදහස් කිරීම වැනි දේ මෙම චතුරශ්‍රයේදී කළා. එයට වියේච් හෙවත් පාලන මණ්ඩලය කියලා නම තැබුවා. මේ නගර චතුරස්‍රයේ කුළුණු හතරක ලොකු ගන්ටාර හතරක් සවි කරලා තිබුණා. තමාට වරදක් කළයි කියලා කෙනෙක් සිතුවොත් ඒ පුද්ගලයා චතුරශ්‍රයට ඇවිත් ගන්ටාර හඬ නංවනවා. කිසිවෙක් නිකම් බොරුවට ඒවා හඬන්ට කල්පනා කළේ නැහැ. ජනතාව කෝප වෙලා දඬුවම් කරයි කියන බිය නිසා.

බඩගින්නේ ඉබාගාතේ යමින් සිටි අන්ධ, බිහිරි අශ්වයා නගර චතුරශ්‍රයට ඇවිල්ලා ඒ මේ අත ඉව අල්ලන විට, ඌගේ කටට අහුවුණා ගන්ටාර කඹයක්. ඌට කෑමක් වගේ එම ලණුව දැනුණු නිසාදෝ, ඌ ඒ ලනුව ඇදපි. ඒ වර ගන්ටාර සියල්ල එකවර මහා හඬක් පිට කළා. මේ හිමිදිරි පාන්දර කවුද දුක් ගැනවිලි ඉදිරිපත් කරන්නේ කියලා නගරයේ මිනිස්සු ඉක්මණට චතුරශ්‍රයට දුවගෙන ආවා. මුළු මහත් නගරයම දැනගෙන හිටියා වාතවේග අශ්වයා ගැන. ඌ උසේදොම්ගේ පණ බේරාගත් සැටිත්, ජනතාව අතර හොඳට පැතිර තිබුණා. මේ තරම් හොඳ අශ්වයෙක් අසරණ තත්ත්වයක වැටිලා, උගේ ඇස් අන්ධ වෙලා, හිම කැටිවලට වැහිලා ඌ වෙවුලනවා. ඉතින් මේ අසරණ සතාව දැකලා මිනිස්සු මවිතයට පත් වුණා.

රැස්වුණු මිනිස්සු කාරණා දැනගෙන ජීවිතය පවා බේරා දීපු වාත වේග අශ්වයාව උසේදොම් ගෙදරින් පන්නා දමා තිබෙන බව දැනගත් පසුව, ඌට චතුරශ්‍රයේ ගන්ටාර හැඬවීමට ඉඩ තිබෙන බව එක හඬින් පිළිගත්තා.

කළගුණ නොසළකන වෙළෙන්දාව ගෙන්වා ඔහුගෙන් කරුණු විමසූ විට ඔහු නිදහසට කරුණු ඉදිරිපත් කළා. රැස් වූ ජනතාව එය පිළිගත්තේ නැහැ. වාත වේග මැරෙන තුරු ඌට කෑම බීම සැපයීම, ඌව ඉස්තාලයේ තබාලා ඌට සාත්තු කිරීම ආදිය කළ යුතු බවට ජනතාවගේ මණ්ඩලය තීරණය කළා. ඒවා ඉටු කරනවාද නැද්ද යන්න සොයා බැලීමට මිනිහකුව පත් කළා. එම තීරණය ගලක කොටලා ඒ ගල් පුවරුව නගර චතුරශ්‍රයේ තැබුවා.

ලෙව් තෝල්ස්තෝයි

නඩුකාරයා

ඇල්ජීරියාවේ රජ්ජුරුවන්ගේ රටේ එක නගරයක නඩුකාරයෙක් බෙහොම දක්ෂ අන්දමට නඩු විසඳන බව රජතුමාට ආරංචි වුණා. රජතුමා අස්පයකු පිට නැගලා නඩුකාරයා ඉන්න නගරයේ ගේට්ටුව ළඟට ආවා විතරයි, එතන හිටිය කොර හිඟන්නෙක් වෙස් වළාගත් රජුගෙන් හිඟමනක් ඉල්ලුවා. හිඟන්නාට කාසියක් දීලා තවත් දුර යන්ට ලෑස්ති වෙන විටම, හිඟන්නා රජුගේ කබායේ එල්ලුනා.

"නුඹට ඕන මොනවද? මම නුඹට හිඟමන් දුන්නා නොවේද ?" රජතුමා ඇහුවා.

"ඇත්ත තමා, ඔබ මට හිඟමන් දුන්නා. තවත් එක උදව්වක් කරන්න. මාව ඔබේ අස්පයා පිට

නංවාගෙන චතුරශ්‍රයට ගෙනියන්න. නැතිනම් අබ්බගාත මාව අස්පයෝ, ඔටුවො පාගා දමාවි."

රජතුමා හිඟන්නාව පසු පසින් නංවාගෙන නගර චතුරශ්‍රයට ගෙන ගියා. අශ්වයාව නැවැත්තුවාට හිඟන්නා බිමට බැස්සෙ නැහැ.

"මොකද ඉන්නේ. අපි ආවා. නුඹ බිමට බැහැලා පලයන්." "මම බහින්නේ නැහැ. මේ අශ්වයා මගේ. නුඹ සමාදානයෙන් ඌව මට දෙන්නේ නැතිනම්. අපි නඩු කියමු." එහෙම කියුවේ හිඟන්නා.

මේ දෙදෙනා වටේ මිනිස්සු රැස් වුණා. දෙදෙනාම වාද කරති. වට වී සිටිය අය මෙහෙම කියුවා:

"අපේ නඩුකාරයා ළඟට ගිහිල්ලා මේ නඩුව කියපල්ලා !"

රජතුමා සහ කොර හිඟන්නා නඩුව කියන්න නඩුකාරයා ළඟට ගියා. නඩුකාරයා ඉදිරිපට තවත් මිනිස්සු රැස්වෙලා. ඔහු එක් එක් නඩුවක් බැගින් අරගෙන කරුණු විමසනවා.

රජුගේ නඩුවට ඉස්සෙල්ලා උගතකු සහ ගමයකුගේ නඩුව අහන්ට පටන් ගත්තා. මේ දෙදෙනාම එකම ගැහැනියක ඒගොල්ලන්ගෙ බිරිඳ බව කියා සිටීම නිසා තමා නඩු අහන්නේ. ගමයා කියනවා 'මේ ගැනි මගේ', උගතා කියනවා 'නෑ, නෑ ඒ ගැනි මගේ' කියලා. දෙදෙනාගේම කතාවලට බොහොම හොඳින් සවන් දීලා නඩුකාරයා මෙහෙම පැවසුවා: "මේ ගැනිව නඩු ශාලාවේ තියලා පලයල්ලා හෙට උදේට වරෙල්ලා මම තීන්දුව දෙන්නම්."

ඒ දෙදෙනා යන්ට ගියා. ඊළඟට ආවෙ මස් වෙළෙන්දෙකුයි, තෙල් වෙළෙන්දෙකුයි. මස් වෙලෙන්දාගේ ඇඟ පුරා ලේ. තෙල් වෙළෙන්දාගේ ඇඟ පුරාම තෙල් ගෑවිලා. මස් වෙළෙන්දා අත මුදල් තිබුණා. තෙල් වෙළන්දා මස් වෙළෙන්දාගේ අත අල්ලාගන හිටියා. මස් වෙළෙන්දා නඩුව කියුවා:

"නඩුකාර හාමුදුරුවනේ, මම මේ මිනිහාගෙන් තෙල් අරගෙන සල්ලි ගෙවන්නට මුදල් පසුම්බිය එළියට ගත්තු හැටියේම මේ මිනිහා මගේ අතින් අල්ල ගත්තා. ඔන්න එහෙම අපි දෙන්නා ඔබතුමා ළඟට ආවා. මම එක අතකින් මුදල් පසුම්බිය අල්ලාගෙන. මගේ අතක් මේ මිනිහා අල්ලාගෙන. මේ සල්ලි මගේ. මේ මිනිහා හොරා."

"ඒක බොරු. මස් වෙළෙන්දා ආවා මගෙන් තෙල් මිලට ගැනීමට. මම තෙල් එයාගෙ බුජමට වත් කළා. එතකොට එයා කිව්වා රන් කාසියක් මාරු කරන්න කියලා. මම සල්ලි මාරුකරන්න මල්ල එළියට ගත් විගසම, මේ මිනිහා ඒක උදුරා ගත්තා. මම එයාගේ අතින් අල්ල ගත්තා. මේ හොරාව මම ඔබතුමා ළඟට ගෙනාවා." කියලා තෙල් වෙළෙන්දා කිව්වා.

නඩුකාරයා ටිකක් වෙලා නිහඬ වෙලා මෙහෙම අණ කළා. "නුඹලා සල්ලි තියලා පලයල්ලා. නඩු තීන්දුව ලබාගන්ට හෙට උදේ වරෙල්ලා."

ඔන්න ඊළඟට රජතුමාගේ සහ හිඟන්නාගේ වාරය ආවා. රජතුමා සිදු වූ දෙය විස්තර කළා, ඊළඟට නඩුකාරයා හිඟන්නාගෙන් විස්තර ඇසුවා. හිඟන්නා මෙසේ කියුවාඃ

"එයා කියුවේ බොරු. මම අස්පයා පිට නැගලා නගරයට ගියා. මෙයා මට කියුවා එයාවත් නගරයට ගෙනියන්න කියලා. මම නගරයේ චතුරශ්‍රයට එයාව ගෙන ගිහිල්ලා බහින්නයි කිව්වම එයා කිව්වා මේ අශ්වයා එයාගෙ කියලා."

නඩුකාරයා කල්පනා කරලා මෙහෙම පිළිතුරු දුන්නාඃ

"හොඳයි අශ්වයාව මෙහෙ තියලා පලයල්ලා, නඩු තීන්දුව ලබාගන්ට හෙට උදේට වරෙල්ලා."

පහුවදා උදේ නඩු තීන්දුව දෙනවා බලන්ට බොහොම සෙනඟ රැස් වුණා.

ඉස්සෙල්ලාම උගතා සහ ගමයා ඉදිරියට ආවා.

නඩුකාරයා උගතාට මෙහෙම කියුවාඃ "මේ ගෑනි නුඹේ. ගමයාට වේවැල් පාරවල් කියම කරනවා අනුන්ගේ ගෑනියක් ගන්ට නඩු කිව්වට."

උගතා ගෑනිත් සමග යන්ට ගියා. ගමයාට දඬුවම් ලැබුණා.

ඊළඟට නඩුකාරයා මස් වෙළෙන්දාට අඬ ගැසුවාඃ "මේ සල්ලි නුඹට අයිතියි."

තෙල් වෙලෙන්දාව පෙන්වලා ඔහුට දඬුවම් කිරීමට නියම කළාඃ "බොරුකාරයාට වේවැල් පාර පනහක් ගසනු !"

රජතුමාගේ සහ කොර හිඟන්නාගේ වාරය පැමිණියා.

"අශ්වයින් මැද යුෂ්මතාගේ අශ්වයා හඳුනා ගැනීමට පුළුවන්ද ?" "පුළුවනි."

"යුෂ්මතාටත් පුළුවනිද ?"

"මටත් පුළුවනි" හිඟන්නා පිළිතුරු දුන්නා.

"මා සමග එන්න !" නඩුකාරයා වෙස් වළාගෙන හිටිය රජතුමාට අඬ ගැසුවා.

දෙදෙනාම අශ්ව ඉස්තාලයට ගියා. එහිදී රජතුමා අශ්වයින් විස්සක් අතරට මැදි වෙලා හිටිය එයාගේ අශ්වයාව පෙන්නුවා.

ඉන්පසුව කොර හිඟන්නාට අඬ ගහලා කියුවා එයාගේ අශ්වයාව පෙන්වන්ට කියලා. කොරාත් පෙන්නුවේ රජතුමා පෙන්නපු අශ්වයාවමයි.

නඩුකාරයා එයාගේ ආසනයේ වාඩිවෙලා නඩු තීන්දුව දුන්නා. වෙස් වළාගත් රජතුමාට ඔහු මෙහෙම කියුවාඃ

"මේ අශ්වයා යුෂ්මතාගෙ, ඌව අරගන්න. බොරු කියුවේ කොර මිනිහා, ඔහුට වේවැල් පාරවල් පනහක් ගැසිය යුතුයි."

නඩු ඇසීම ඉවර වෙලා නඩුකාරයා ගෙදර යාමට සූදානම් වන විට, වෙස් වළාගෙන හිටියා රජතුමා ඔහු පසු පසින් ගියා.

"යුෂ්මතා මගේ නඩු තීන්දුව ගැන අමනාප වෙලා ද?" නඩුකාරයා ඇහුවා.

"නැත. මා බොහොම සතුටුයි ඔබේ නඩු තීන්දු ගැන. නමුත් මා කැමතියි ඔබ නඩු විසඳපු විදිය දැනගන්ට. ගැහැනිය උගතාගේ කියලා දැනගත්තේ කොහොමද, සල්ලි මස් වෙළෙන්දාගේ මිස තෙල් වෙළෙන්දාගේ නොවෙයි කියලා දැන ගත්තේ කොහොමද, අස්පයා මගේ මිස හිඟන්නාගේ නොවෙයි කියලා දැනගත්තේ කොහොමද?"

නඩුකාරයා මෙලෙස විස්තර කළාඃ

"ගැහැනිය ගැන නඩු තීන්දුව දුන්නේ මේ ආකාරයටයි. උදේ මම ගැහැනියට අඬ ගහලා කිව්වා, මගේ තීන්ත කූඩුවට තීන්ත වක් කරපන් කියලා. ඒ ගෑනු මනුස්සයා තීන්ත කූඩුව සෝදලා බොහොම ඉක්මනට තීන්ත වත් කළා. එය ඇයට හුරු පුරුදු දෙයක්. ඇය ගමයාගේ බිරිඳ නම් ඇයට බැහැ ඉක්මනට හුරු පුරුදු ලෙස එහෙම වැඩක් කරන්ට. ඒ අනුව ඇත්ත කියුවේ උගතා... මස් සහ තෙල් වෙළෙඳුන්ගේ සල්ලි ගැන මම තීන්දු කළේ මේ විදියටයි. ඊයේ මම කාසි අරගෙන වතුර කෝප්පයකට දැම්මා. අද උදේ වතුර කෝප්පය හොඳට බැලුවා. වතුර උඩට තෙල් බින්දු ඇවිත් පාවෙන බවක් දුටුවේ නැහැ. ඒ සල්ලි තෙල් වෙළෙන්දාගේ නම් ඔහුගේ අත්වල තිබිච්ච තෙල් සල්ලිවල ගෑවෙන්නට ඕන. මස් වෙළෙන්දා කියුවේ ඇත්ත... අශ්වයාගේ ප්‍රශ්නය වඩාත් බැරෑරුම් වුණා. යුෂ්මතා මෙන්ම කොරාත් වෙනත් අශ්වයින් විසි දෙනෙක් අතුරෙන් සැබෑ අශ්වයාව තෝරා ගත්තා. මම ඔබ දෙපොළට ඉස්තාලෙට එන්ටයි කිව්වේ ඔබ දෙදෙනා ලවා අශ්වයාව හඳුනාගන්ට නොවෙයි. ඔබ දෙදෙනාගෙන් අශ්වයා කාවද හඳුනාගන්නේ කියල බලාගන්ට. යුෂ්මතා අශ්වයා ළඟට යන විට, ඌ ඔබ හඳුනන බවක් දන්වලා හිස වැනුවා, ඔබ ළඟට ආවා. කොරා ඌව අතගාන විට, ඌ දෙකන් තද කැරගෙන පයක් ඉස්සුවා. ඔන්න ඒ නිසා තමා, මා දැනගත්තේ ඔබ උගේ සැබෑ ස්වාමියා බව."

එවිට වෙස් වළාගෙන හිටිය රජතුමා මෙසේ පැවසුවාඃ "මම වෙළෙන්දෙක් නොවෙයි, මම මේ රටේ රජ්ජුරුවෝ. ඔබ ගැන කියන කතා ඇත්තදැයි සොයා බැලීමටයි මා වෙස්වලාගෙන ආවේ. දැන් ඔබ නුවණැති නඩුකාරයෙක් බව මට පෙනෙනවා. මගෙන් ඕන දෙයක් ඉල්ලන්න. ඔබට තිළිණයක් දීමට මා කැමතියි.

"රජතුමනි මට තිළිණ අවශ්‍ය නැහැ." කියලා නඩුකාරයා පැවසුවා.

විසෙවලද් ගාර්ෂින්

පියාඹන ගෙම්බිය

ඔන්න එකොමත් එක රටක හිටියා ගෙම්බියෙක්. එයාගේ නම බක - බක හාමිනේ. එයා මඩ ගොඩේ ඉඳගෙන හෝහපුටවන්, මැස්සන්, මදුරුවන් වැනි පුංචි සතුන්ව අල්ලාගෙන කමින් කාලය ගත කළා. අනිත් ගෙම්බන් සමග එකතු වෙලා එයත් බක-බක ගෑවා. බැරි වෙලාවත්, මාන කොකා එයා අල්ලා ගෙන කෑවේ නැතිනම්, එයාට තව ඕන තරම් කල් මේ ලෝකයේ ජීවත් වීමට පුළුවනි, ඒ වුණාට එක සිද්ධියක් නිසා එයාගෙ ජීවිතය වෙනස් වුණා.

බක-බක හාමිනේ මඩ වතුර වළෙන් උඩට ඇවිත් උණුසුම් වැස්සට තෙමී, තෙමී බොහොම සතුටු වුණා.

"වා, අද කොතරම් අපූරු වැසි වහින දවසක් ද. මේ ලෝකයේ ජීවත් වීම ලොකු වාසනාවක් !" එයා එහෙම කල්පනා කළා.

වැස්ස වහිනවා, පුංචි, පුංචි වැහි බින්දු වැටෙනවා. ඉතින් එයාට මේ වැස්ස හන්දා බෙහොම ලොකු සතුටක්. එයාට කොතරම් ලොකු සතුටක් ඇති වුනාදැයි කියනවා නම් , බක-බක ගාලා කෑගහන්ට තරම් එයාට ආසාවක් ඇති වුණා. ඔන්න එතකොට තමයි එයාට මතක් වුණේ. හිම වැටෙන ශීත කාලෙ ළං වෙන කොට ගෙම්බො කෑගහන්නේ නැති බව. උතුරු දිග රටවල ගෙම්බෝ කෑගහන්නෙ හිම කාලය ඉවර වෙලා පැමිණෙන වසන්ත කාලයටයි. ඉතින් බක-බක හාමිනේ බක-බක ගාන්නේ නැතුව බොහොම සැපට හිටියා.

ඔන්න හිටි හැටියෙම අහසෙහි බොහොම සිහින් හඬක් ඇති වුණා. අහසේ පියඹන සේරාවො වර්ගයක් ඉන්නවා. ඒගොල්ල පියාඹන විට, ඒ ගොල්ලන්ගේ පියාපත් සුළං පහරට හැප්පිලා සිහින් හඬක් ඇති වෙනවා. මේ සේරාවන් අහසේ බොහොම ඉහළින් පියාඹන්නේ. සිහින් හඬ ඇහෙනවා මිස ඒගොල්ලන්ව පවා පේන්නේ නැහැ. ඒ වර අහසේ පියාසර කරපු සේරාවො, බක-බක හාමිනේ ඉන්න මඩ වලට ඇවිත් වැහුවා.

"කර්-කර් ! අපට තවත් ඈතට පියාඹන්ට ඕන. බඩගිනියි, මොනවා හරි කන්න ඕන." සේරාවෙක් කියුවා.

මේ කතාව ඇහුණ ගමන් ම, ගෙම්බිය සැඟවුණා, බක-බක හාමිනේ ලොකුයි, මහතයි. එයාව කන්ට සේරාවන්ට බැහැ. ඒ බව එයා දැනගෙන හිටියත්, හිතේ බයට එයා මඩ වතුර වළට රිංගලා සැඟවුණා.

පසුව බක-බක හාමිනේට කල්පනා වුනා හෙමිහිට ඔළුව උස්සලා බලන්ට ඕනයි කියලා. එයාට ලොකු ආසාවක් ඇති වුනා සේරාවන් කතා කරන්නේ මොකක් ගැනද කියලා දැනගන්ට. උන් යන්නේ කොහෙද කියලා දැනගන්ට.

"කර්! මෙහෙ හීතල වේගෙන එනවා. ඉක්මණට දකුණට යන්ට ඕන. දකුණු දිසාවට යන්ට ඕන!" එක සේරාවෙක් කිව්වා.

අනික් සේරාවෝ එක හඬින් ඒ කතාව අනුමත කළා.

"සේරා නෝනාවරුනි, මහත්වරුනි! ඔයගොල්ල පියාසර කරන දකුණ කියලා කියන්නේ මොනවාටද? මම එහෙම අහනවට මට සමාවෙන්න." බක-බක ගෙඹි හාමිනේ ප්‍රශ්න කළා.

ඔන්න ඒ වර සේරාවෝ බක-බක හාමිනේව වට කැරුගත්තා. ඉස්සෙල්ලා ඒ ගොල්ලන්ගේ අදහස වුනේ, බක-බක හාමිනේව ගිල දමන්ටයි. නමුත් එයා ලොකු වැඩියි. එයාව ගිල්ලොත් උගුරේ හිරවෙන්ට පුළුවනි. සේරාවෝ අත්තටු ගසලා මෙහෙම කිව්වා:

"දකුණුදිග රටවල දූන් බොහොම හොඳයි ! එහි උණුසුමයි, හරිම අගෙයි ! එහි බොහොම හොඳ උණුසුම් මඩ ගොහොරු බිම් තියෙනවා. එහි ඉන්න පණුවො බොහොම රසයි. දකුණුදිග රටවල් බෙහොම අගෙයි. බොහොම උණුසුම් !"

සේරාවෝ හැමදෙනාම එක වර කෑ ගසමින් මෙහෙම කියාපු නිසා බක-බක හාමිනේගෙ කන්වල මහ ගෝසාවක් ඇති වුණා. සේරාවන්ට කෑ නොගසා නිහඬ වෙන්ටයි කියලා එයා බැගෑපත් ලෙස ඉල්ලා හිටියා. ඒගොල්ල නිහඬ වුණායින් පස්සේ, බොහොම තරබාරු, අනිත් සේරාවන්ට වැඩිය නුවණක්කාරයා කියලා ගෙම්බියට සිතිච්චි සේරාවාගෙන් ඉල්ලා හිටියා දකුණ ගැන විස්තර කරන්ටයි කියලා. ඔන්න ඒ වර සේරාවා දකුණුදිග උණුසුම් රටවල් ගැන විස්තර කළා. බක-බක හාමිනේ ඒ කතාව අහලා බොහොම සතුටු වුණා. පසුව, හෙමින් සැරේ පරෙස්සමින් මෙහෙම ප්‍රශ්න කළාඃ

"එහේ හෝහපුටුවො, මදුරුවො ගොඩක් ඉන්නවද ?"

"අපොයි ඔවු ! මහ ගොඩක් ඉන්නවා !"

'බක' ගාලා ගෙම්බිය එක වර කෑ ගහලා වහාම වටපිට බැලුවා තවත් ගොම්බෝ, ගෙම්බියෝ එහෙම අහගෙන හිටියද කියලා. මොකද දන්නවද, හිම වැටෙන්ට ළං වෙලා තියෙන වැහි කාලෙදි ගෙම්බො එහෙම කෑ ගහන්නෙ නැති හන්දා. නමුත් අපේ බක-බක හාමිනේට එක වරක් වත් කෑ නොගසා ඉන්ට බැහැ. "අනේ මාවත් එහාට ගෙනියන්න !" කියලා එයා සේරාවෙන්ගෙන් ඉල්ලා හිටියා.

"හරි පුදුම කතාවක් නොවැ! ඔයාට අත්තටු නැහැ නොවැ. ඔයාව අපි ගෙනියන්නේ කොහොමෙද? සේරාවා ඇසුවා.

"ඔයගොල්ල පියාඹන්නේ කවදාටද?" බක-බක හාමිනේ ඇහුවා.

"ඉක්මනට, ඉක්මනින්ම! මෙහෙ බොහොම හීතලයි, දකුණුදිග රටවලට ඉක්මනින්ම පියාඹනවා!"

"මට මේ ගැන කල්පනා කරන්ට විනාඩි පහකට අවසර දෙන්න. මම වතුර වළේ යට ඉඳලා උඩට ඇවිත් හොඳ අදහසක් ඉදිරිපත් කරන්නම්."

එහෙම කියලා එයා රිකිල්ලේ ඉඳලා වතුර වළට පැනලා දිය යටටම කිමිදිලා ගියා. බක-බක හාමිනේ දිය යටටම ගියේ එයාගේ කල්පනාවට වෙන කවුරුන් හරි බාධා කරයි කියල හිතාගෙනයි. විනාඩි පහක් ගෙවුණා. සේරාවෝ පියාසර කරන්ට සූදානම් වෙන විටම, බක-බක හාමිනේගේ මූණ දියට උඩින් මතු වුණා. එයාගේ මුහුණෙන් පළ වුනේ ලොකු සතුටක්. එතරම් ලොකු සතුටක් පළවන්නේ ගෙම්බෙකුගේ මුහුණෙන් විතරයි.

"මට බොහොම හොඳ අදහසක් පහළ වුණා. මම විසඳුමක් හොයාගත්තා." බක-බක හාමිනේ කිව්වා. "ඔන්න සේරාවන් දෙදෙනෙක් ඔයගොල්ලන්ගේ හොටවලින් කෝටු කෑල්ලක් දෙපැත්තෙන් අල්ලා ගන්නවා. මම මගේ කටින් කෝටුවේ මැද අල්ලා ගන්නවා. ඔයගොල්ල පියාඹනවා. මම අහසේ ගමන් කරනවා. හැබැයි ඔයගොල්ලෝ කෑගහන්ටත් එපා. මම 'බක-බක' ගාන්නෙත් නැහැ. සෑම දෙයක්ම යසට කෙරේවි."

කට වහගෙන හැතැප්ම තුන්දාහක් දුර පියාසර කිරීමයි, ගෙම්බකු වැනි පුංචි වුණත් සතකුව ගෙනයාමයි ලෙහෙසි, පහසු වැඩක් නොවේ. ඒ වුණාට බක-බක හාමිනේගේ අපූරු අදහස නිසා සේරාවෝ සියලු දෙනාම බොහොම සතුටු වෙලා, එයාව අහසින් ගෙන යාමට එක හඬින්ම තීරණය කළා. පැය දෙකෙන් දෙකට, මාරුවෙන් මාරුවට බක-බක හාමිනේව අහසින් ගෙන යාමට සේරාවෝ එකඟ වුනා. සේරාවෝ මහා ගොඩක් හිටිය නිසා තනි ගෙම්බාව ගෙන යාම එක් එක් සේරා ජෝඩුවට නිතර නිතර සිදුවන්නේ නැත. හොඳ සවි ශක්තිය ඇති කෝටු කෑල්ලක් සේරාවෝ දෙදෙනෙක් අල්ලා ගත්තා. එහි මැද බක-බක හාමිනේ කටෙන් අල්ලාගෙන ගමනට පිටත් වුණා. සේරාවන්ගෙ මුළු රෑනම අහසට නැංගා. අහසේ බොහොම ඉහලින් පියාසර කළ නිසා බක-බක හාමිනේගේ හදවත බියෙන් ගැහෙන්නට වුණා. කෝටුව දෙපැත්තෙන් හොටෙන් අරගෙන පියාඹන සේරාවෝ එකම මට්ටමක පියාසර නොකළ නිසාදෝ ගෙම්බා අහසේ වැනෙන්නට වුණා. කඩදාසියෙන් හදාපු කෝණංගියකු වගේ බක-බක හාමිනේ අහසේ හෙලවෙන්ටයි, වැනෙන්නටයි පටන් ගත්තා. ඒ වුණාට එයා බිමට නොවැටීමට කෝටුව මැද කටින් තදේට අල්ලා ගෙන හිටියා. ඔන්න ඉතින් බක-බක හාමිනේ අහස් ගමනට ඉක්මනින්ම පුරුදු වුණයි කියමුකො. දැන් ඉතින් යන ගමන් ඇස් කරකවලා වටපිටත් බලන්නට පටන් ගත්තා. තණ පිට්ටනි, දෙණි බිම්, ගංගා, කඳු ආදිය එයාට යම්තමින් පෙනුණා. කෝටුවක් කටින් අල්ලා ගෙන අහසේ වැනී, වැනී පාවෙන විට, පහළ තියෙන දේ බලන්ට බෙහොම අමාරුයි, එයාට පෙනුණේ ඉහළින් සහ පසුපසින් තියෙන දේ විතරයි. යම්තමින් ඒවා දැක ගැනීමට පුළුවන් වුණත්, බක-බක හාමිනේ බොහොම සතුටු වුණා.

"කොහොමද මගේ කල්පනාව. මම තමා හැබෑ නුවණක්කාරි."

අහසේ ගමන් කරන ගෙම්බිය අසලින් පියාඹන සේරාවෝ ඇගේ නුවණ නිසා ඇයට ප්‍රශංසා කරමින් ඇගේ දක්ෂකම ගැන පාරට්ටු කළා.

බක-බක ගාන හාමිනේ ඒගොල්ලන්ට ස්තුති කරීමට කට නොහැරියා විතරයි. එයාට මතක් වුණා. කට ඇරියොත් එයා බිමට වැටිලා කෑලි, කෑලිවලට කැඩිලා විනාශ වෙයි කියලා. එයා කෝටුව තදින්ම කටින් ගත්තා. අපහසුකම්

විඳ ගැනීමට එයා තීරණය කළා. ඉතින් ඔය විදියට කටින් කෝටුවේ එල්ලීගෙන මුළු දවස තිස්සේ ම එයා අහසේ ගමන් කළා. සේරාවෝ පියාඹන ගමන්ම මාරුවෙන් මාරුවට කෝටුවේ කෙළවර හොටෙන් අල්ලාගත්තා. ඒ ගෝල්ලෝ එය කළේ බොහොම දක්ෂ අන්දමට. බක-බක හාමිනේට නම් එය බොහොම බිය ගෙනදෙන වැඩකි. එයා තව පොඩ්ඩෙන් කට ඇරලා 'බක-බක' ගානවා. එයා බොහොම දහිරිය අරගෙන කටින් එල්ලීගෙන කතා නොකර අහසේ ගමන් කළා. හවස් වුණාම සේරාවෝ රෑන මඩ ගොහොරු පොකුණකට පාත් වුණා. උදේ පාන්දර ආයෙමත් ඒගොල්ල බක-බක හාමිනේවත් අරගෙන පියාසැරිය පටන් ගත්තා. එදා එයා කෝටුවේ එල්ලුනේ පිට පෙරට හිටින්නට. එතකොට ගෙඹි හාමිනේට වැඩිය හොඳට පේනවා. සේරාවෝ කහ පාට වෙච්ච කොළ සහිත කැලෑවලට උඩින් පියාඹා ගියා. ගම්වලට හා ගොයම් කපන කුඹුරුවලට ඉහලින් පියාසර කළා. මිනිසුන් කතා කරන සැටිත්, ගොවිතැන් උපකරණවල හඬත් සේරාවන්ටයි ගෙම්බියටයි ඇසුණා. අහසේ පියාඹන සේරාවන්ට අත් දිගු කොටැ පෙන්වන මිනිස්සු උන් හොටෙන් ගෙනයන දේ පෙන්වා කතා කළා. තමාව මිනිසුන්ට පෙන්වන්ටයි, මිනිසුන් තමා ගැන කියන්නේ මොනවාදැයි කියලා අසා දැනගන්ටයි බක-බක හාමිනේට ලොකු ආසාවක් ඇති වුණේ එවිටයි. පහුවදා එයා සේරාවන්ට මෙහෙම කියුවාඃ

"ටිකක් පහලින් පියාඹන්ට බැරිද? බොහොම ඉහළින් ගිය විට, මගේ ඔළුව කරකැවෙන්ට පටන් ගන්නවා. හිසේ කැක්කුම ඇති වුණොත් කට ඇරිලා මාව බිම වැටේවි."

කරුණාබර සේරාවෝ පහලින් පියාසර කිරීමට පොරොන්දු වුණා. පහුවදා ඒගොල්ල පහලින් පියාසර කළ හන්දා මිනිසුන්ගේ කතා බහ ඇසුණා.

"අර බලාපල්ලා ! බලාපල්ලා ! සේරාවෝ ගෙම්බකුව ගෙනියනවෝ" එක ගමක කොල්ලෝ කෑ ගැසුවා.

බක-බක හාමිනේට මේක ඇහිලා ඇතිවෙච්ච සතුට නිසා එයාගේ හදවත ගැහෙන්නට පවා පටන් ගත්තා.

"අන්න බලාපල්ලා ! ලොකුම ලොකු පුදුමයක් !" ඊළඟ ගමේ වැඩිහිටි උදවිය කෑගහලා කිව්වා.

"මෙතරම් උතුම් අදහසක් පහළ වුණේ මටයි, සේරාවන්ට නොවේ." බක-බක හාමිනේ කල්පනා කළා.

"බලාපියව් ! බලාපියව් ! අරුම පුදුම වැඩක හැටි. මේ වගේ හොඳ උපායක් කල්පනා කළේ කවුද ?" අනික් ගමේ ගම්මු ඇසුවා.

අන්න එතැනදී බක-බක හාමිනේට තවදුරටත් කට පරෙස්සම් කරගෙන ඉවසාගෙන ඉන්ට බැරිවුණා. එයා කට ඇරලා "මමයි මමයි !" කියලා කෑ ගැසුවේ මහ හඬින්.

එවිටම එයා බිම වැටෙන්ට පටන් ගත්තා. සේරාවෝ අනතුරු අඟවා ශබ්ද කළා ! එක් සේරාවෙක් බිමට වැටෙමින් සිටි බක-බක හාමිනේව හොටෙන් ඩැහැ ගැනීමට උත්සාහ කළා, නමුත් බැරි වුණා. සේරාවෝ ඉතා ඉක්මනින් පියාසර කළ නිසා ගෙම්බිය එක එල්ලේම බිමට වැටුණේ නැහැ. එහෙම වුණා නම් එයා මහ පාරට වැටිලා පොඩි වෙනවා. ඈතට ගහගෙන ගිහිල්ලා එයාගේ වාසනාවට මඩ ගොහොරු විලකට වැටුණා. ගම කෙළවර ඒ මඩ ගොහොරුව තිබුණේ.

වතුර යටට කිමිදිලා උඩට ආ බක-බක හාමිනේ ආයෙමත් ගිරිය පුප්පාගෙන කෑ ගහලා මෙහෙම කියාපි:

"මමයි, ඒ අදහස මගේ තමයි !"

නමුත් එයා වටේ කවුරුවත් හිටියේ නැහැ. බක-බක හාමිනේ උඩ ඉඳලා 'ජබොස්' ගාලා වැටුණු සද්දෙ ඇහුණ හැටියේම විලේ හිටිය ගෙම්බෝ බය වෙලා සැඟවුණා. ඒගොල්ල ආයෙමත් වතුරෙන් උඩට ඇවිත් බලන විට, අලුත් ගෙම්බිය හෙවත් බක-බක හාමිනේව දැක්කා.

ඔන්න ඉතින් එයා අනිත් ගෙම්බන්ට විස්තර කළා අහසේ පියාඹමින් රට රටවල් බලමින් ඇවිදින්ට එයා සේරාවන්ගෙන් උදව් ලබාපු හැටි. එයාගේ සේරාවෝ එයාව හැමතැනම ගෙනියනවා කියලා කිව්වා. එයා දකුණුදිග රටවල්වලට ගිහිල්ලා එහි තිබුණු උණුසුම් මඩ වගුරුවල හිටියා කියලා, ඒ රටවල උණුසුම් දේශගුණය ගැන විස්තර කළා. ඒ රටවල ගෙම්බන්ගේ ආහාරයට සුදුසු පුංචි සතුන් බොහොම ඉන්නවා කියලා ඒ ගෙම්බන්ට බක-බක හාමිනේ විස්තර කියා දුන්නා.

"මම මෙහේ ආවේ ඔයගොල්ලන්ගෙ වාස දේසේ දැනගන්ටයි. මම නිවාඩු දීපු මගේ සේරාවන් එනතුරු ලබන වසන්තය එනකල් මම මෙහේ ඉන්නම්." බක-බක හාමිනේ කියුවා.

නමුත් සේරාවන් ආයෙමත් කිසි දිනෙක ආවේ නැත. ගෙම්බිය බිම වැටිලා මළා කියලා සිතාගත්තු සේරාවෝ බොහොම කනගාටුවට පත් වුණා.

ද්මීත්‍රි මාමින්-සිබිර්යාක්

අළු කිරිල්ලී

I

උතුරුදිග පෙදෙස්වලට හිම ශීතල එන්නට ඉස්සෙල්ලා, ශීතල වැසි වසින්ට පටන් ගන්නවා. ඉර පායන කාලය අඩු වෙනවා. මේ කාලයට කියන්නෙ සරත් කාලය කියලා. ඉතින් මේ සරත් කාලයේදී උතුරු දිග වාසය කරන සියලු පක්ෂී වර්ග දකුණ දිග රට වලට, වඩාත් උණුසුම් සහ හිරු එළිය ඇති රට වලට පියාඹා යනවා. මේ විදියට පියාඹන්ට සූදානම් වුණු ලොකු කුඩා සියලු කුරුල්ලෝ මහත් කලබල ගතියක් දැක්වූවා. ඒගොල්ල හැතැප්ම දහස් ගණනක් දුර පියාඹන්ට ඕන. කුරුල්ලෝ සෑහෙන ගණනක් මෙලෙස පියාඹන විට අතර-මගදී මිය යනවා.

ලොකු පක්ෂි වර්ග හංසයෝ, පාත්තයෝ, තාරාවෝ මේ මහා පියාසැරියේ බාරදූරකම ගණන් ගෙන බොහොම වැදගත් පෙනුමක් ඇති

කැරැගත්තා. ඒගොල්ලො දන්නවා මේ පියාසැරියේ අමාරුකම. බොහොම හයියෙන් කෑ ගහලා කලබල ඇති කළේ පුංචි කුරුල්ලො. වැළි කුලිච්චියෝ, පීනන කුලිච්චියෝ, කළු ගලගණ්ඩ කුරුල්ලෝ, කළු කුරුල්ලෝ සහ සුයිකි කුරුල්ලෝ. වැඩියෙන්ම කෑ ගහනවා, කලබල වෙනවා, කඩිසර වෙනවා. ඒ ගොල්ලා රැන් පිටින් එක වෙරළක ඉඳලා තවත් වෙරළකට පියාඹා ගිහිල්ලා.

පුංචි කුරුල්ලන්ට වැඩ ගොඩක් තිබුණා.

කැලෑව අඳුරුයි, නිහඬ වෙලා. මොකද දන්නවද ගී ගයන කුරුල්ලෝ දකුණු දෙසට ගිහිල්ලා. ඒ කුරුල්ලෝ ශීත කාලය වනතුරු හිටියේ නැහැ.

"පුංචි කුරුල්ලෝ මොකටද මෙතරම් කෑ ගහන්නේ. වේලාවට ඔක්කොම කුරුල්ලන්ට ඉගිලිලා යන්ට පුලුවනි. මේ කලබලයට හේතුව මොකද කියලා මට නම් තේරුම් ගන්ට බැහැ." මහලු සේරා කුරුල්ලෙක් කියාපි.

"ඔයා හැමදාම කම්මැලියා නොවැ. ඒ නිසා ඔයාට අනුන්ගේ උනන්දුව පෙනෙන්ටවත් බැහැ." සේරාගේ බිරිඳ සේරාවිය කට දැම්මා.

"මා කම්මැලියෙක් ද? ඔයාගේ කීම අසාධාරණයි. මම හැම දෙයක් ගැනම සැලකිලි දක්වනවා. ඒ ගැන පිටට පෙන්වන්නේ නැහැ. එයින් ඇති පලක් නැහැ නොවැ. මාත් උදේ හිටන් රෑ වන තුරු කෑගහන්ට ගියොත්, ඒක හැම දෙනාටම කරදරයක් වේවි."

සේරාවිය නිතරම හැමදෙනා එක්ක සණ්ඩු කරගන්ට සිතන ජාතියේ කිරිල්ලියක්. දැන් ඉතින් එයාගේ මහත්තයාගේ කතාව නිසා එයාට කේන්ති ගියා.

"ඔයත් තාත්තා කෙනෙක් ද? තාත්තලා ළමයින්ට සළකනවා. ඔයා පිදුරු ගහක්වත් ගෙනෙන්නේ නැහැ ...!''

"ඔයා කියන්නේ අපේ අබ්බගාත දුව අළු කිරිල්ලිය ගැනද? එයාට පියාඹන්ට බැරිනම් මම ඒකට වැරදිකාරයා ද?"

ඒ ගොල්ලන්ගේ දුව අළු කිරිල්ලියගෙ පියාපතක් කැඩිලා. ඒක පහුගිය වසන්ත කාලෙදි වුණ දෙයක්. කපටි හිවලා ඒකිව අල්ලා නොගත්තා විතරයි. සේරාවිය හෙවත් කුරුලු අම්මා බය නැතුව හිවලගෙ ඇඟට කොටාපු හන්දා ඒ පැටවාව බේරාගන්ට පුළුවන් වුණා. ඒ නමුත් අළු කිරිල්ලීගේ පියාපතක් තුවාල වෙලා.

අම්මා කඳුළු වගුරවමින් මෙහෙම කියුවා:

"අපි අළු කිරිල්ලිව තියලා යන්නෙ කොහොමද? මට නම් දුව ගැන සිතන විටත් ලොකු බයක් හිතට ඇතිවෙනවා. ඔක්කෝමල්ලා ඉගිලිලා ගියාම මගේ දුවට මෙහේ තනියම ඉන්ට සිද්දවේවි. අපි දකුණට පියාඹනවා. දකුණුදිග රටවල උණුසුම හොඳයි. මෙහේ හීතලට ඒ දුප්පත් අළු කිරිල්ලිය මැරිලා යාවි. ඔයා දන්නවද, මම මේ වර සීත කාලෙට දුවගේ ආරක්ෂාවට මෙහාට වෙලා ඉන්නම්..."

"එතකොට අනිත් ළමයි ?"

"ඒගොල්ලන්ගේ ශරීර සනීපය හොඳයි. මා නැතුවට ඒගොල්ලන්ට පියාඹන්ට පුළුවනි."

අළු කිරිල්ලිය ගැන කතා කරන විට 'සැර බාල කිරීමට' කුරුලු තාත්තා සේරාවා උත්සාහ ගත්තා. ඔහුත් ඇයට ආදරය කළා. ඒ වුණාට සේරාවා ඒ ගැන කලබල වීමට කැමති වුණේ නැහැ. ඉතින් අළු කිරිල්ලියට නවතින්නට සිද්ද වේවි ! එයාව හීතලට අහු වේවි ! බොහොම දුක්බර දෙයක් තමයි. ඉතින් මොනවා කරන්ටද ? අනිත් කුරුළු පැටවුන් ගැන බලාගන්ට ඕන. ඔය දේ ගැන ඔයිට වඩා සුළු විදිහට බලන්ට ඕන. සේරාවා බිරිඳට ආදරය කළේ ඇයට නොකියා. අම්මා කෙනෙකුගේ දුක තාත්තාට තේරුම්ගන්ට බැරි වුණා. හිවලා එක පාරටම අළු කිරිල්ලිව අල්ලාගෙන කෑවා නම් හොඳයි කියාල සේරාවා කල්පනා කළා. එයා මේ වර ශීත කාලෙදි කොහොම වුණත් මැරෙනවා නොවැ.

II

කුරුලු අම්මා උණුසුම් රටවලට පියාඹා යන කාලය ළංවී ඇති නිසා පියාපතක් කැඩුණු අළු කිරිල්ලියට වඩාත් වැඩි ආදරයක් පෙන්වූවා. අළු කිරිල්ලිය දූනගෙන හිටියේ නැහැ වියෝවීම, අම්මා තාත්තා, නංගිලා, අක්කලා අයියලා නැතිව ජීවත් විම කොච්චර අමාරුද කියලා. එයා මේ අලුත් දේ ගැන බැලුවේ ලොකු කුතුහලයකින්. ඇත්ත තමා එයාට තරමක් ඉරිසියාවක් ඇති වුණා. නංගිලා මල්ලිලා සේරමල්ලා ශීත කාලය නැති - හිම වැටෙන්නේ නැති උණුසුම් රටකට පියාසර කරන්ට සූදානම් වෙලා, ඒ ගැන මහ ලොකුවට කතා කරන හන්දා.

"ඉතින් අම්මේ ඔයගොල්ල වසන්ත කාලය වන විට මෙහාට එනවා නේද?" අළු කිරිල්ලිය අම්මාගෙන් ඇහුවා.

"ඔවු හැබෑටම, ආපහු එනවා මගේ රත්තරන් දුවේ. අපි එතකොට, ආයෙමත් එකට එක්වෙලා ඉඳිමු."

"මම හැම තිස්සෙම අම්මයි තාත්තයි, අනිත් මගේ සහෝදරයන් සහ සහෝදරියන් ගැන මතක් කරනවා. ඔයගොල්ල කොහෙද පියාසර කරන්නේ ? මොනවද කරන්නේ කියලා මම හැම තිස්සේම සිතනවා." අළු කිරිල්ලී කිවුවා.

කුරුළු අම්මාට එයාගේ සිතේ ඇති දුක සඟවාගන්නට ලොකු වෑයමක් කරන්ට සිදු වුණා. ඈ අනිත් කුරුල්ලන්ට නොපෙනෙන්ට ඇඬුවා. ඒ ගමන්ම ඈ සතුටින් ඉන්නවයි කියලා, බොරුවට පෙන්නුවා. පියාපතක් කැඩිච්චි අළු කිරිල්ලී නිසා

කුරුලු අම්මාගේ සිත දුකින් පිරිලා. අනිත් කුරුලු පැටවු ගැන ඈ කොහෙත්ම සැලකිලි පෙන්වූයේ නැහැ. අනික් පැටවුන්ට එයා ආදරය කරන්නේ නැතුවා වගෙයි, ඇයට සිතෙන්නේ.

කොතරම් ඉක්මනට වේලාව ගෙවිලා යනවා ද! ඔන්න උදේ පාන්දරට තද හීතලක් දැනෙනවා. කොළ පාට කොළ ඔක්කොම කහ පාට වෙලා, නැති නම් රතුපාට වෙලා. ගඟේ වතුර කළු-බොර පාට වෙලා. ගිම්හානයේදී ගඟ දෙපස තිබුණු ගස්වල කොළ සුළඟට ගඟට වැටිලා ඉක්මණට ගසා ගෙන ගියා. අහස කළු පාට වලාකුළුවලින් පිරිලා. ශීතල වැසි වසින්නට පටන් ගත්තා. කුරුල්ලන්ට ඒ වගේ කාලයක් ගෙවන්ට බැහැ. කුරුලු රැන් රැන් දකුණුදිග උණුසුම් රටවලට ඉගිලිලා ගියා.

ඉස්සෙල්ලාම ඉගිලිලා ගියේ මඩ ගොහොරුවල ලගින කුරුල්ලන්. මඩ හීතල වෙන විට, ඒගොල්ලන්ට ඉන්ට බැහැ. පහුවෙලා ගියේ දියේ පීනන කුරුල්ලන් ය. වටුවන් ඉගිලිලා යන විට අළු කිරිල්ලීට ලොකු කනගාටුවක් ඇති වුණේ, ඒගොල්ලන් හරියට එයාට අඬ ගහන්නා වගේ, දුක්බර තාලෙට හඬ නංවපු නිසා. අළු කිරිල්ලීගේ හදවත ගැස්සුණා වගේ වුණා. ඉගිලිලා යන වටු රැන දිහා එයා බොහෝ වේලාවක් බලාගෙන හිටියා.

"ඒගොල්ලන්ට නම් හොඳ ඇති, හොඳටම හොඳ ඇති!" අළු කිරිල්ලිය කල්පනා කළා.

හංසයෝ, පාත්තායෝ, තාරාවෝ, දකුණුදිග උණුසුම් රටවලට ඉගිලිලා යන්ට සූදානම් වුණෝය. එක් එක් කුරුලු කූඩුවක සිටි කුරුල්ලෝ විශාල රැන්වලට රොක් වුණා. දකුණුදිග රටවලට කීපවරක්ම පියාසර කළ කුරුල්ලෝ කෝඩුකාරයන්ට උගන්වන්ට පටන් ගත්තා. හැමදාම උදේට කෝඩුකාර කුරුල්ලෝ බොහෝ පියාසර කළා. උන් එහෙම කළේ උන්ගේ පියාපත් දුර පියාසැරියක් සඳහා ශක්තිමත් කැරගන්ටයි. නුවණක්කාර නායක කුරුල්ලෝ ඉස්සෙල්ලා එක් එක් කෝඩුකාරයාට උගන්වලා ඊට පසුව සියලු දෙනාටම එකට උගැන්වූවා...

අළු කිරිල්ලියට මේ පියාසැරිවලට සහභාගි වෙන්ට බැහැ. එයාගේ පියාපතක් කැඩිලා නිසා. එයා ඈතට වෙලා අනික් කුරුල්ලන්ගේ පියෑඹීම් බලා හිටයා. එයාගේ ඉරණම පිළිගැනීමට එයා සිදුවෙලා තියෙනවා. ඒ වුනාට අළු කිරිල්ලී පීනන්ටයි, වතුර යටට කිමිදෙන්ටයි බොහොම දක්ෂයි.

"දැන් ඉතින් ගමනට ලෑස්ති වෙන්ට ඕන. අපි මෙහේ ඉඳන් මොනවා කරන්ටද?" මෝරපු කුරුල්ලෝ ඇසුවෝය.

ඔන්න ඉතින් ඒ අතර කාලය වේගයෙන් ගෙවී ගියා... ඒ තීරණාත්මක දවස එළැඹුණා.

මුලු මහත් කුරුලු රෑන ගං ඉවුරේ රැස් වුණා. එදින සරත් සමයේ එක් උදෑසනක ගං ඉවුරේ මීදුම තිබෙන දවසක් විය. එතැන සේරාවෝ, තාරාවෝ තුන්සියයක් විතර රැස්වෙලා. එක් එක් කණ්ඩායමක නායකයෝ කෑ ගසමින් ඒගොල්ලන්ගේ පිරිස් පෙළ ගැස්සුවා.

අළු කිරිල්ලීගේ අම්මා එදා රෑ කොහෙත්ම නිදාගත්තේ නැහැ. එයා දුව ගැන සිත සිතා දුක් වුණා.

"දුව ගඟේ එහා ඉවුරේ තියෙන උණුසුම් ජල උල්පත ළඟට වෙලා ඉන්න. එතැන ජලය හීත කාලයට පවා මිදිලා අයිස් වෙන්නේ නැහැ."

අළු කිරිල්ලී කුරුළු රෑන්වලින් ඈත් වෙලා බලාගෙන හිටියේ හරියට පිට කෙනෙක් වගේ ...

හැම කුරුල්ලෙක්ම පියාසැරියට සූදානම් වෙලා හිටිය නිසා අළු කිරිල්ලිය ගැන සිතන්ට ඉදිරිපත් වුණේ නැහැ. ඒ වුණාට එයාගේ අම්මාගේ සිත දුකින් පිරිලා. කුරුළු අම්මා හිත යටින් තමාට මෙහෙම කියා ගත්තා: "නැහැ, මම යන්නේ නැහැ. දූත් එක්ක නවතිනවා." නමුත් එයා කොහොමද නවතින්නේ, අනිත් පැටවු ගොඩක් ගමනට සූදානම් වෙලා නොවැ?

"පියාසැරිය පටන් ගනිමු !" මහා නායක කුරුල්ලා අණ දුන්නා. කුරුළු රෑන් හඬ නංවමින් අහසට නැංගා.

අළු කිරිල්ලිය කුරුලු රෑන් දකුණුදිග උණුසුම් රටවලට පියාඹන සැටි බලාගෙන සිටියේ ලොකු කනගාටුවකින්. ඉස්සෙල්ලා ඒගොල්ලො එක ගොඩේ පියාසර කළාට, පසුව තුන් හුලස් හැඩයට පියාඹන්නට පටන් ගත්තා.

"අනේ මා හැබෑටම තනි වෙලා ද? එදා මාව හිවලා කාලා දැම්මා නම් මීට වඩා හොඳයි..." අළු කිරිල්ලිය තමාටම කියා ගත්තේ ලොකු කනගාටුවකින්.

III

අළු කිරිල්ලිය නැවතිලා හිටිය ගංගාව කඳු දක්වා විහිදී යනවා. ඈතට එය වටේට ලොකු කැලෑවක්. බොහොම පාලු තැනක්. අවට ගෙවල් දොරවල් කිසිවක් නැත. ගං ඉවුරේ ජලය උදේට බොහොම ශීතල වෙලා අයිස් බවට පත් වෙනවා. දවල් වන විට තුනී අයිස් තට්ටු දිය වෙනවා.

"අනේ හැබෑටම මුළු ගංගාවම අයිස් බවට පත් වෙයිද?" අළු කිරිල්ලිය එහෙම සිතුවේ අති විශාල බයක් ඇතිවයි.

තනියම ඉන්නා විට ලොකු පාලු ගතියක් දැනෙනවා. අළු කිරිල්ලිය නිතරම කල්පනා කළේ ඈත රටවලට ඉගිලිලා ගිය එයාගේ සහෝදර කුරුල්ලන් ගැනයි. "ඒ ගොල්ලන් දැන් කොහිද?" ඒගොල්ල කරදර නැතිව උණුසුම් ඇති රටවලට

පියාසර කළාද? ඒ ගොල්ලන් අළු කිරිල්ලිය ගැන කල්පනා කරනවද? මේවා සියල්ල ගැන අළු කිරිල්ලියට කල්පනා කිරීමට හොඳටම ඉඩකඩ සහ වේලාව තිබුණා. තනිවම ඉන්න විට ඇති වන අමාරුකම් ගැන ඇයට තේරුණා. ගංගාව අවට පාලු වෙලා. කැලෑවල විතරක් සත්තු වාසය කළා. එහි ලේන්නු සහ හාවෝ දුවපැන ඇවිද්දෝය.

ඔන්න දවසක් දා අළු කිරිල්ලිය කැලෑව බලන්ට ගියා. හිටි හැටියේම පඳුරක් අස්සේ ඉඳලා හාවෙක් පැන්න හැටියේම එයා හොඳටම බය වෙච්චි.

"අනේ ඔයා හරිම මෝඩ සේරාවියක්! බයට මගේ හිත පපුව හෝස් ගාලා දාලා ගියා. ඔයා මෙහේ මොනවද කරනවාද ? අනිත් කුරුල්ලන් එක්ක පියාසර නොකළේ මන්ද?" හාවා ඇසුවා.

"මට පියාසර කරන්ට බැහැ. මගේ පියාපතක් හිවලා හපා කෑවා. එතකොට මම බොහොම පුංචි පැටියෙක්..."

"අපොයි ඒ කපටි හිවලා! ඌ තරම් නරක සතෙක් මේ කැලෑවේම නැහැ. එයා හිවලාගෙන් ප්‍රවේසම් වෙන්න. ගංගාවේ වතුර හීතල වෙලා අයිස් බවට පත් වුණාම හිවලා ඇවිත් ඔයාව අල්ලා ගනිවි..."

අළු කිරිල්ලිය සාවාව හැඳින ගත්තා. හාවාත් පියාපත් කැඩිච්ච මේ පුංචි කිරිල්ලිය තරමම අහිංසකයි. හාවා හිවලාගෙන් බේරෙන්නේ වේගයෙන් දුවලා ගිහිල්ලා.

"ඔය ගොල්ලන්ට වගේ මටත් පියාපත් තිබුණා නම්. මේ ලෝකයේ කාටවත් මම බය වෙන්නේ නැහැ. ඔයාට පියාපත් හොඳට නැති වුණාට පීනන්ට පුළුවනි. ඔයා බොහොම හොඳට දිය යට කිමිදෙනවා. මට ඒවා කිසි දෙයක් බැහැ. කැලෑවේ මට හතුරන් මහ ගොඩක් ඉන්නවා. මුළු ජීවිතයම මම බයෙන් තමා ගත කරන්නේ... ගිම්හාන කාලෙට හොඳට ගහ කොළ වැඩිලා තියෙන හන්දා හැංගෙන්ටවත් පුළුවනි. සීත කාලෙට එහෙමවත් හැංගෙන්ට බැහැ." හාවා එයාගේ බැරිකම ගැන විස්තර කළා.

ඔන්න නැවුම් හිම වැටෙන්ට පටන් ගත්තා. තවම ගඟේ වතුර හීතල වුණේ නැහැ. රෑට බොහොම සීතල වන ගංගා ජලය දවාලට තරමක් උණුසුම් වෙනවා. ආහාර සොයාගන්නවාට වඩා ජීවිතය මරණයෙන් ගළවා ගැනීමට විශාල සටනක් ගෙනගියා. ගස්වල කොළ හැලිලා. පඳුරුවල කොළ හැලිලා, ඉතින් හැංගෙන්නටවත් තැනක් නැහැ. රෑ කාලේ පැහැදිලි අහස නිසා ජීවිතයට ඇති අනතුර වැඩි වුණා. ගංගා ජලය අයිස් බවට පරිවර්තනය වෙන විට අළු කිරිල්ලියට නිදිමත වැඩිවෙන්නට පටන් ගත්තා.

ඔන්න එක නිහඬ රැයෙක අහසේ හොඳට තරු පායා තිබෙන විට, ගස්වල සෙවණැලි යෝධයින්ට සමානයි වගේ පෙනෙනවා. කඳුවල උසත්

හරියට වැඩිවෙලා වගෙයි. හඳ පායලා, දවාලට හඬ නගා ගලා බසින ජලය දැන් හීතල වෙලා. තද සීත නිසා සෙමින් සෙමින් ගංගා ජලය අයිස් තට්ටුවකින් වැහෙන්නට පටන් ගත්තා.

අළු කිරිල්ලිය යන එන මං නැති අමාරු තත්ත්වයකට වැටිලා. දැන් ඉතින් හීතලට අහුවෙලා නැත්තේ ගඟ මැද ඇති ජලය විතරයි. එතැන ජලය වටේට රවුමට ලපයක් වගේ හැදිලා තිබුණා. පීනන්ට පුළුවන් හරිය අඩි පහළොවක්වත් නැහැ.

අළු කිරිල්ලියගේ බියයි දුකයි, කනගාටුවට ඉතාමත්ම වැඩි වුණේ එයා ගං ඉවුරේ හිම ගොඩේ හිටිය හිවලාව දුටු විටයි.

අළු කිරිල්ලි කුඩා කාලෙදි ඇගේ පියාපතක් හපා කෑවේ ඒ හිවලාම තමයි.

"ආයුබෝවන් අළු කිරිල්ලියේ, බොහොම දවසකින් මට නුඹව හමුවුණේ නැහැ නොවැ. හිම කාලය පැමිණීම ගැන මම නුඹට සුබ පතනවා... " කපටි හිවලා බොරු දොඩවන්ට පටන් ගත්තා.

''අනේ ඔයා යන දිහාවක යන්න. මා කැමති නැහැ ඔයත් සමග කතා කරන්න'' බයවෙච්ච අළු කිරිල්ලී කිවුවා.

''මම නුඹට ආදරයෙන් කතා කරනවා. නුඹ මට සැරවෙනවා! මේ කැලෑවේ ඉන්න සත්තු මා ගැන බොරු කියනවා. ඒගොල්ල වැරදි කරලා ඒ වැරදි මා පිට පටවනවා. දැනට ආයුබෝවන්!'' හිවලා එහෙම කියලා යන්ට ගියා.

හිවලා කැලෑවට ගියාට පසුව ගඟ ළඟට ආපු හාවා අළු කිරිල්ලියට මෙහෙම අනතුරු ඇඟවූවාඃ

අළු කිරල්ලියේ ප්‍රවේසම් වන්න! හිවලා ආයෙමත් එයි!''

අළු කිරිල්ලියත් හාවා වගේම බය වෙන්ට පටන් ගත්තා. එයාට වටේටම ඇතිවන ලස්සන දේ ගැන බලන්නටවත් වෙලාවක් නැහැ.

ඔන්න ඉතින් හැබෑටම බොහොම තද හිම සමග ශීත කාලය ආවා. අවට හැම දෙයක්ම සුදෝ සුදු හිමවලින් වැසුණා. එකද කළු පැල්ලමක්වත් තිබුනේ නැහැ. කොළ නැති අතු පවා හිම කැටිවලින් වැහිලා. ගස් අතු වැල් සියල්ලම සුදුම සුදු පාට හිම වලින් හදාපු ඇඳුම් ඇඳගෙන ඉන්නවා වගෙයි.

වටේටම කියන්න බැරි තරම් ලස්සනයි! නමුත් අළු කිරිල්ලිය ට ඒවා කිසි දෙයක් බලා හිත සනසාගන්නට බැහැ. ඇගේ සිත බියෙන් පිරිලා. ගංගාව මැද තිබෙන උණුසුම් ජලය සහිත ලපය හීතල වෙලා අයිස් බවට හැරුණොත් ඇයට විනාශය තමයි. දවස් කීපයකට පසුව ආයෙමත් හිවලා ඇවිත් ගං ඉවුරේ වාඩි වෙලා කපටි බස් දොඩවන්ට පටන් ගත්තාඃ

"ඉතින් මගේ කිරිල්ලියේ මම නුඹව සොයාගෙන ආවා. මා ළඟට එන්න. නැතිනම් මම නුඹ ළඟට එන්නම්. මට ඉවසීම තියෙනවා..."

එහෙම කියලා හිවලා අයිස් තට්ටු උඩින් ප්‍රවේසමින් යන්ට පටන් ගත්තා. අළු කිරිල්ලිය ඉන්න තැනට. අළු කිරිල්ලිගේ හදවත බිය නිසාම ගල් ගැහුණා. නමුත් හිවලාට බැහැ එයා ළඟට යන්ට, මොකද දන්නවද එතැන හිම තට්ටුව ඉතාමත්ම තුනියි. හිම තට්ටුවත් කඩාගෙන හිවලා ගඟ පතුලට ඇද වැටෙන්ට පුළුවනි. හිවලා එයාගේ හොම්බ ඉස්සරහා ගත් උඩ තබාගෙන තලු මරලා මෙහෙම කියාපි:

"අපොයි නුඹ බොහොම මෝඩ සේරාවියක් නොවැ. ගඟෙන් අයිස් ගොඩ උඩට වරෙන්! කොහොම වුනත් ආයුබෝවන්, මම මගේ වැඩ වලට යනවා.."

ඉතින් එදා ඉඳලා හිවලා හැමදාම එන්නේ අළු කිරිල්ලිය වටේට තියෙන උණුසුම් ජලය මිදිලා අයිස් වෙලා තියෙනවද කියල බලන්නටයි. හිතල වැඩි වෙන්ට, වැඩි වෙන්ට ගංගා ජලය අයිස් වෙන්ට පටන් ගත්තා. උණුසුම් ජලය ඇති ලපය අඩි පහළොවක සිට අඩියක් තරම් කුඩා වුණා. දැන් ඉතින් ගංගාව වසා තිබෙන අයිස් තටටුව හොඳට ශක්තිමත්. බොහොම බය වෙච්ච අළු කිරිල්ලි වතුරට වෙලා කිමිදෙන්නට පටන් ගත්තා. හිවලා දිය ලපය ළඟටම ඇවිල්ලා නපුරු ලෙස හිනා වෙලා මෙහෙම කිව්වා:

"කිමිදියන්, කිමිදියන්, තව ටිකයි, කොහොම හරි මම නුඹව කනවා, කනවාමයි. ඒ නිසා වැඩිය හොඳයි දැන්ම මා ළඟට වරෙන්."

පඳුර අස්සෙ හැංගිලා හිටිය හාවාට හිවලාගේ වැඩ පෙනෙනවා. එයා බොහොව කේන්තියෙන් මෙහෙම කියාපි:

"අනේ අනේ, මේ හිවලා කොයිතරම් නපුරු සතෙක්ද? අළු කිරල්ලිය බොහොම අවාසනාවන්ත කෙනෙක්. නපුරු හිවලා එයාව කාලා දමාවි!"

IV

ඉතුරු වෙච්ච උණුසුම් ජලයත් හීතල වෙලා අයිස් වුණාම හිවලා අළු කිරිල්ලියව කා දමනවා සත්තකයි. නමුත් එහෙම වුණේ නැහැ. සිදුවුණ දේ හැම දෙයක්ම හාවා දුටුවා.

ඔන්න දවසක් දා උදේ හාවා එයාගේ ගුහාවෙ ඉඳලා එළියට ආවෙ මොනවා හරි යමක් කාලා අනිත් හාවුන් සමග සෙල්ලම් කරන්ටයි හිම ශීතල බොහොම සැරයි. හාවෝ උණුසුම රැකගන්ට ඉදිරිපස ගාත් දෙක එකිනෙකට පිරිමැද්දා. බොහොම ශීතල වුනාට හිතට බොහොම සතුටක්.

"හා පැටියනේ බේරියල්ලා!" කවුදෝ කෑ ගැහුවා.

ඇත්තටම, අනතුර අත ළඟටම ඇවිත්. කැලෑවේ හිටියේ කුදු ගැසුණු මහලු දඩයක්කාරයෙකි. ඔහු හිම උඩ සද්ද නැතිව ලිස්සලා යන්ට පුළුවන් ලී පතුරු ඇඳගෙන හාවුන් ළඟටම වෙලා වෙඩි තියන්ට ඕන කොයි සතාටද කියලා බලනවා.

"මගේ ගෙදර උන්දෑට හා සමින් කළ හිම කබායක් අඳින්ට පුළුවනි." එයා මෙහෙම කියලා ලොකුම ලොකු හාවාට වෙඩි තියන්ට කුරුමාණම් ඇල්ලුවා.

එවිටම මේක දකපු හාවුන් පිස්සු හැදිච්ච එවුන් වගේ බොහොම ඉක්මනට කැලෑවේ පඳුරුවලට රිංගා ගත්තා.

"ආහ් මුරණ්ඩු හාවුනේ! මම නුඹලාට... ඇයි බොලව් නුඹලාට තේරෙන්නේ නැද්ද මගේ ගෙදර උන්දෑට හා සමින් කළ හිම කබායක් ඕනැයි කියලා. නැතිනම් මගේ නාකිච්චිට හීතලේ හැදේවි. නුඹලා කොච්චර දිවුවත් මාව රවටන්ට නුඹලාට බැහැ. මම නුඹලාට වැඩිය කපටියි. මම ගෙදරින් පිටත් වෙන විට, මගේ ගෙදර උන්දෑ කීවේ මොනවාද "ඔන්න නොකීවයි කියන්ට එපා, හිම කබායක් නැතිව ආපහු ගෙදර එන්ට එපා? ඉතින් නුඹලා පැනලා දුවනවා..." දඩයක්කාරයා තනියම කතා කරන්නට විය.

දඩයක්කාරයා හාවුන්ගේ පා සටහන් අනුව උන්ව හොයන්ට උත්සාහ ගත්තට වැඩේ හරි ගියේ නැහැ. උන්ගෙ පා සටහන් හැම තැනම තියනෙවා. හරියට වී පොරි ඉහලා වගෙයි. ඉතින් උන්ව කොහේ කියාල හොයන්ටද, දඩයක්කාර මහල්ලා හාවුන්ට බැණ වැදිලා ගං ඉවුරට ඇවිත් පොඩ්ඩක් විඩා හැරියා.

"අනේ ගෙදර අම්මණ්ඩියෙ ඔයාගේ හිම කබාය පැනලා ගියා නොවැ. දැන් ඉතින් වෙනින් එකෙකුව හොයන්ට යන්නම්."

ඔහොම වාඩිවෙලා මහල්ලා කල්පනා කරමින් ඉන්නා විට, එයාට පෙනුනා හිවලා හරියට පූසකු වගේ ගොදුරක් ළඟට බඩ ගා ගෙන යන හැටි.

"ඔන්න බොලේ වැඩක හැටි. හිවල් නයිදෙ මා ළඟටම බඩ ගානවා. මගේ ගෙදර උන්දෑට හිවල් ලොමින් කළ හිම කබා කර පටියක් ලැබෙන හැඩයි. මට පෙනෙන හැටියට හිවලා මාලු බා ගෙන කන්ට යනවා වගෙයි."

හිවලා ඉස්සරහා ගාත් දෙකින් බඩ ගාගෙන ගියා අළු කිරිල්ලිය ඉන්න තැනට. දැන් ඉතින් ගඟ පුරාම හිම මිදිලා නිසා උණුසුම් ජලය නැහැ. අළු කිරිල්ලිය අයිස් ගොඩකට වෙලා ඉන්නවා. මහලු දඩයක්කාරයාට අළු කිරිල්ලියව හරිහැටි පෙනුණේ නැත්තේ එයා හිවලා දිහා විතරක් බලාපු හන්දා.

"හිවලාට වෙඩි තියන්ට ඕන, ලොම් වලට වුවමනා කොටස නරක් නොවන විදියට." දඩයක්කාරයා මෙහෙම හිතලා තුවක්කුව කුරුමාණම් ඇල්ලුවා. "මගේ ගෙදර උන්දෑට බනින්ට ඉඩ තියන්න නරකයි. මම එයාගේ හිම කබායේ හිවල් ලොම් කර පටියේ පතොරම් සිදුරක් ඇති කළායි කියලා. හුරුබුහුටිකම ඕන. දස්සකම නැතිනම් මැස්සෙකුවත් අල්ලන්ට බැරිය..."

ඔහොම සිතලා දඩයක්කාරයා බොහෝ වේලාවක් කුරමානම් අල්ලා වෙඩි තිබ්බා. වෙඩිල්ලේ දුම අතරින් මහලු දඩයක්කාරයාට පෙනුණා මොනවාදෝ බිම වැතිරිලා ඉන්නා සැටි ඔහු ඉක්මණට එතැනට ගියා. දුවන ගමන් ඔහු දෙවරක්ම බිම වැටුණා. ළඟට ගියාමයි ඔහුට පෙනුණේ හිවලා එතැන නැති බව. යම්තම් ඉතිරි වෙලා තිබුණ ජලය උඩ අළු කිරිල්ලිය හිටියා. බොහොම බය වෙලා.

"ඔන්න මදෑ පුදුමෙක හැටි! හිවලා සේරාවියකට පෙරළී හිටිය පළමුවැනි වාරය මෙය වෙන්ට ඕන. හිවලා බොහොම ලොකු කපටි සතෙක්." දඩයක්කාරයා කල්පනා කළා.

"අනේ සීයේ හිවලා පැනලා ගියා!" අළු කිරිල්ලිය කියාපි.

"පැනලා ගියාද? ගෙදර උන්දෑගේ හිම කබායේ කර පටියට හිවල් ලොම් ගෙනියන්නේ කොහොමද? මදෑ කරුමෙක හැටි! මෝඩ සේරාවියේ නුඹ මොකද මෙතැනට වෙලා?"

"අනේ සීයේ මට ඉගිලෙන්ට බැහැ නොවැ. මගේ එක පියාපතක් හිවලා හැපුවා."

"අනේ මෝඩියේ, නුඹ මෙතැන හිටියොත් මැරිලා යාවි, හිම හීතලට අහුවෙලා. හිවලා නුඹව කාලා දමාවි... ඔවු, ඔවු."

දඩයක්කාරයා කල්පනා කරලා හිස වනලා මෙහෙම තීරණය කළාඃ

"අපි මෙහෙම කරමු. මම නුඹව ගෙනියන්නම් මගේ මිනිපිරියන් ළඟට. ඒගොල්ලෝ සතුටු වේවි. ඔන්න ලබන වසන්තය වන විට නුඹ බිත්තර දමාවි. අපේ ගෙදර උන්දෑට එයින් පල ප්‍රයෝජන ලැබේවි. නුඹ බිත්තර රකලා පැටවු ඇති කාරාවි. ඉතින් මම මේවා සියල්ල කියන්නෙ නුඹට නේද? ඔවු, ඔවු මෝඩියේ..."

මහලු දඩයක්කාරයා අළු කිරිල්ලියව අල්ලාගෙන එයාගේ කමිසයට යටින් තියෙන කුහරයට දමාගත්තා.

"අපේ ගෙදර උන්දෑට මම කිසි දෙයක් කියන්නේ නැහැ. එයාගේ හිම කබායට ඕනෑ කරන හාවුන් සහ හිවලා දූනට කැලෑවේ හිටපුවාවේ. දූන් ලොකුම දේ තමා, මේ අළු කිරිල්ලිය හන්දා මගේ මිනිපිරියෝ ටික සතුටු වීම..." දඩයක්කාර මහල්ලා තනියම කතා කළා.

කැලෑවේ හැංගිලා බලා හිටිය හාවෝ සියාගේ වැඩ දූකලා බොහොම සතුටු වෙලා හිනාවුණා. ගෙදර උන්දෑට හිම කබායක් ඕන නැහැ. එයාට හීතලට ලිප ළඟට වෙලා උණුහුම් වෙන්ට පුළුවනි.

නිකොලායි ගාරින්

කොටි දඩයක්කාරයෝ

(කොරියානු කතාවකි)

කොරියාවේ හක් සොන්දේ පෙදෙසේ කිල්චු නගරයේ මීට අවුරුදු බොහෝ ගණනකට ඉස්සෙල්ලා කොටි දඩයම් කරන පොහොසතුන්ගේ සංගමයක් තිබුණා. එක දුප්පත් තරුණයෙක් මේ සංගමයේ සාමාජිකත්වය ලබාගන්ට බොහොම උත්සාහ ගත්තා.

"නුඹ කොහාට රිංගන්ට හදනවද? නුඹම දන්නවා නුඹ දුප්පත් මිනිහකු බව. දුප්පතා මිනිහෙක් මිනිහකු නොවෙයි. යන දිහාවෙක පලයන්'' ඒ සංගමයේ සභාපති තරණයාව පන්නා ගත්තා.

ඒ වුණාට ඒ තරුණයා කොටි දඩයමට කියාපු වානේ හෙල්ලක් සූදානම් කැරැ ගත්තා. ඒ වානේ හෙල්ල අනික් දඩයම් කරුවන්ගේ

හෙල්ල වලට වඩා අගෙයි කියලා කියන්ට පුළුවනි.

ඔන්න ඉතින් දවසක් දා කොටි දඩයමට සංගමයේ සාමාජිකයෝ පිටත් වුණා. මේ තරුණයත් කොටි දඩයමට ගියා.

පොහොසත් දඩයක්කාරයෝ කාලා, බීලා ප්‍රීති වුණා. දුප්පතා දිහා බැලුවේවත් නැහැ. ඔහු ආයෙමත් ඔවුන් ළඟට ආපු හැටියේම ඔවුන් එයාව එලවා දැම්මේ අපහාස කරලා.

"එහෙනම් නුඹලා මෙතැන බීගෙන නටාපල්ලා. මම තනියම යනවා කොටි දඩයමට" තරුණයා කිව්වා.

"නුඹට ඕන නම් කොටියෝ නුඹව මරලා කාලා දමන්න, නුඹ පලයන් පිස්සා" එහෙම කිව්වේ අර පොහොසත් දඩයක්කාරයින් ය.

"කොටියෙකුගෙන් මැරුම් කන එක හොඳා. නුඹලාගේ අපහාස විඳිනවාට වැඩිය."

එහෙම කියලා ඔහු කැලෑවේ මැදට ගියා. ඔන්න එතන හිටියා මහා විශාල කොටියෙක්. කොටියා පූසකු වගේ මේ තරුණයාත් සමග සෙල්ලම් කරන්ට පටන් ගත්තා. කොටියා වරෙක ඔහු ළඟටත් තවත් වරෙක ඔහුගෙන් ඈතටත් පැනලා සෙල්ලම් කලා. ඊට පසේසෙ කොටියා හතර ගාතෙන් බිම වැතිර දුප්පත් තරුණයා දෙස බලමින් වලිගය වනන්ට පටන් ගත්තා.

කොටියා මේ විදියට සෙල්ලම් කළේ තරුණ දඩයක්කාරයා නින්දා කරමින් කොටියාට කෑ ගහන තුරු විතරයි.

"ඔන්න තොපට මගෙන් හෙල්ල පහරක්!" කියලා දඩයක්කාරයා හෙල්ල කොටියා දෙසට වීසි කළේ ඌව මරා දමන්ටයි.

එවිට වහාම කොටියා දඩයක්කාරයා දෙසට පැනලා හෙල්ලය දත් වලින් අල්ලා ගත්තා. දඩයක්කාරයා බෙහොම ලොකු ශක්තියකින් ඒ හෙල්ලය දිගු කොට උගේ උරට ඇන්නා. කොටියා මැරිලා බිම වැටුණා.

ඒ කොටියා නොවෙයි, කොටි දෙන. ඇගේ මහ හඬ අහලා, ඇයට උදව් කිරීමට පිරිමි කොටියා ආවා.

කොටියා මාරයකු වගේ එක පිම්මට දඩයක්කාරයා දෙසට කඩා පැන්නා.

ඒ වනවිට කොටි දෙනගේ උගුරට ඇනපු හෙල්ලය අරගෙන දඩයක්කාරයා කොටියාගේ උගුරටත් ඇනලා ඌවත් මරා දැම්මා.

මැරිච්ච කොටියන්ගේ මළ කුණු ඔහු පඳුරු අස්සට ගෙන ගොස් හැංගුවා උන්ගේ වලිග විතරක් පාරේ දැම්මා.

ඔන්න ඉතින් ඉන් පසු තරුණ දඩයක්කාරයා ගියා කාලා බීලා සතුටු වෙවී ඉන්න පොහොසත් දඩයක්කාරයින් ළඟට.

"ආ මොකද මහ ගොඩක් කොටින්ව දඩයම් කළාද?"

"මට කොටියන් දෙදෙනෙකුව හමුවුණා. උන්ව දඩයම් කිරීමට බැරිවුණු හන්දා මම ඔහේලාගෙන් උදව් ඉල්ලන්ට ආවා." තරුණයා කියාපි.

"ආ ඒක වෙනම කාරණයක්. හොඳයි අපට පාර පෙන්නාපිය".

පොහොසත් දඩයක්කාරයෝ තරුණයාට විහිලු කළා, උපහාස කළා.

"නුඹ මොකද තනියම මැරෙන්ට බය වුණාද, අපව හොයාගෙන ආවා..."

"නිහඬව යමු. කොටියෝ මේ ළඟ." තරුණයා කිව්වා.

පොහොසත්තු නිහඬ වුණා. දැන් ඉතින් නඩේ ලොක්කා දුප්පත් තරුණයා.

"ඔන්න කොටියෝ !" කියලා තරුණයා කොටි වලිග පෙන්නුවා.

එවිට පොහොසත් දඩයක්කාරයන් එකවර කෑගැහුවේ මහ හඬින්:

"මෙන්න මගේ හෙල්ල පහර!"

නමුත් මැරිච්ච සතුන් හෙළවුණේ නැත.

දුප්පත් තරුණයා එතකොට මෙහෙම කියාපි:

"මේ කොටියන් දෙදෙනා මගේ හෙල්ල පහරින් මැරිලා, ඉතින් නුඹලාට තියෙන්නෙ උන්ව නගරයට ඇදගෙන යන එක විතරයි."

අලෙක්සන්දාර් කුප්රින්

කිස්මට්

හෙවත් ඉරණම

මීට බොහෝ කලකට ඉස්සෙල්ලා කුඩා නමුදු පොහොසත් නගරයක වාසය කළා. එක වෙළෙන්දෙක්. පලස්, ඇත් දත්, කුළු බඩු, රෝසමල් වලින් ගන්නා තෙල් ආදිය ඔහු වෙළඳාම් කළා. එයා බොහොම දක්ෂ, කරුණාවන්ත, දෙවියන් විශ්වාස කරන, අවංක මිනිහෙක්. එයා බොහොම හොඳට වෙළඳ කටයුතු කළ හන්දා එයා ගැන හැම කෙනෙක්ම විශ්වාසය තැබුවා, හැම කෙනෙක්ම එයාට ගරු කළා.

ඔන්න එක දවසක් දා එයාට හොඳ අවස්ථාවක් ලැබුණා, රන් කුඩු බොහොම ලාබෙට අරගෙන ලොකු ලාබයක් තියාගෙන ඒවා විකුණා දැමීමට. ඒ වෙළඳ ගනුදෙනුව නිසා ඔහුගේ පොහොසත්කම

තුන් ගුණයකින් වැඩි විමට ඉඩකඩ තිබුණා. මේ ගනුදෙනුව සඳහා ඔහු අත තිබුණු මුදල් විතරක් නොවෙයි, ඔහු ණයට දීපු මුදල් සියල්ල එකතු කැරගෙන, රන් කුඩු මිලදී අරගෙන ඒවා වහාම විකුණා දමන්නට ඕන. මේ වෙළඳ ගනුදෙනුවේ වාසි අවාසි ගැන හොඳට කල්පනා කරලා, එය බොහොම ලොකු ලාබ ගෙන දෙන වැඩක් බව ස්ථිර ලෙසම දැනගෙන, එය අවාසි වන්නේ ඉරණම අවාසනාවත් වුණොත් විතරක් කියලා හොඳ හැටි දැනගෙන, මේ ලොකු වෙළඳ ගනුදෙනුව සාර්ථක කිරීමට වෙළන්දා ඉදිරිපත් වුණා.

ඉතින් මෙම ගනුදෙනුවට සතියක් ඕනෑ කියලා එයා තීරණය කළා. ඒ ගැන ගෙදර කිසිවකුට වත් දැන්නුවේ නැහැ. වාසනාවත් වෙළඳ කටයුතු වලට සුබ දිනය වන ගුරු දිනයේ උදෑසන වෙළෙන්දා ලොකු පුතාට මෙහෙම කිවුවා:

"පුතා රතු වෙළඹියව ගමනට ලෑස්ති කරගන්න. මට කොටලුවාව ගමනට ලෑස්ති කරලා උගේ පිටට මලු දමන්න.

පුතා තාත්තාගේ අණට එකවරම කීකරු වන කෙනෙක්. තාත්තා අණ කළ පරිදිම පුතා වැඩ කළේ එක වචනයක්වත් අහන්නේ නැතුවයි. පුතා වෙළඹියගේ පිටට සැදෑලය දාලා, තාත්තා දීපු මලු දෙක දෙපැත්තට දැම්මා. තාත්තයි, පුතයි උදේ පාන්දර දෙවියන්ට පින්දීලා හිමිදිරි පාන්දර ගමන ආරම්භ කලා. තාත්තා ඉස්සරහට පුතා තරමක් පිටුපසින්, එක පැත්තකින් ගමන් කළා.

වාසනාවේ තරුව තිබෙන දිසාව අනුව ඔවුන් ගමන් කළා. මේ වෙළෙන්දාගේ සියලු ගනුදෙනු කොතරම් ලෙහෙසියෙන් සහ ලාබ සහිතව සිදුවුනාදැයි කියුවොත්, නිතරම ඇති වන වාසනාව නිසා එයා බය වෙන්නට පටන් ගත්තා. "දේව කැමැත්ත අනුව", "දෙවියන්ගේ නියමය අනුව" කිය කියා දෙවියන් යදින්නට වුණා. ඉරණමට ඉඩ දුන්නා.

ප්‍රංශයේ රාජ කුමාරයා ස්පාඤ්ඤ රජ කුමරිය සමග විවාහ විම නිසා සුඛෝපභෝගී ද්‍රව්‍යවල වටිනාකම බොහොම ඉහළ ගිය බව දැනගත් වෙළෙන්දා තමා සතු බඩු වර්ග ණයට දුන්නෙ ඉහළ මිලකටය. එයා කලින් සිතුවාට වඩා ලොකු මුදලකට, ණයකාරයෝ පොහොසත් මිනිස්සු හන්දා ණය සියල්ල ගෙවා දැම්මා. යන මගදි කිසිම පමාවීමක් අවහිරයක් තිබුණේ නැහැ.

මේ වෙළඳ ගනුදෙනු වලින් හොඳ ලාබ ලබාගෙන ඔහු මුහුදු බඩ නගරයට ගියා. එහි තමා ඔහු රන් කුඩු මිලදී ගැනීමට යන්නේ. වෙළෙන්දා

බොහොම සතුටින් හිටියාට, ඉඳ හිටලා යටි රැවුල අත ගාලා මෙහෙම කියනවාඃ

"අල්ලාට කීර්තිය ලැබේවා!"

මුහුදු බඩ නගරයට යාමට ඉසසෙල්ලා තාත්තයි පුතයි රෑ කෑම අරගෙන නවාතැන් ගැනීමට නැවතුම් පොළකට ගියා. තාත්තා මුදල් සහිත මල්ලු ඇරගෙන කෝපි කඩයට ගියා, පුතා අශ්වයාවයි, කොටළුවාවයි, ඉස්තාලෙට ගෙන ගිහිල්ලා, උන්ට කෑම දුන්නා. දෙදෙනාම අත් සෝදලා දෙවියන්ට පින් දීලා, රාත්‍රී ආහාරය ගැනීමට වාඩි වුණා.

කෑම කාලා ඉවර වෙන්ටත් ඉස්සෙල්ලා කඩේට කඩා වැදුණා, සැක කටයුතු මිනිසුන් කණ්ඩායමක්. ඒගොල්ල වැරහිලි හැඳගෙන කෑ කෝ ගාන්ට පටන් ගත්තා. ඒගොල්ල වයින් බීලා, සින්දු කියලා ආයෙමත් වයින් බිව්වා. ඔන්න ඉක්මණට ඒ ගොල්ල බහින් බස් වෙලා කෑ කෝ ගහන්ටත්, බැණ ගන්ටත්, ගහ ගන්ටත්, පටන් ඇරගෙන පිහි එළියට ඇදගත්තා.

"යමු අපි ඉක්මණට, මෙතැනින්, මෙතැන තත්ත්වය නරකයි. මම පුතාට සැදෑලය ලෑස්ති කරන්නම්" තාත්තා හෙවත් වෙළෙන්දා පැවසුවා.

රෑ කළුවරේම දෙදෙනා අස්පයාවයි කොටළුවාවයි ගමනට සූදානම් කැරගෙන පිටත් වුණා.

දෙදෙනාම හනිකට පිටත් වුණ අතර ඒ දෙදෙනා පසු පසින් කෑ කෝ ගැසීම් සහ ගුටි බැට හුවමාරු කරගන්නා සැටි ඇසිණි. ඒ බියකරු හඬ ඇසීම් නැවතුණායින් පසුව, තාත්තා කොටළුවාගේ බඩ පෙදෙස අත ගා බැලුවම, මල්ලු එහි තිබුණේ නැහැ. ඔහු පුතාට මෙසේ අණ කළාඃ

"නැවතියන් ආපහු යමු!"

එයා කොටළුවාව හරවාගෙන හැකි තරම් වේගයෙන් ඌව එළවාගෙන ගියේ නැවතුම් පොළටයි. පුතාත් තාත්තා පසුපසින් ගියා.

ආයෙමත් කෝපි කඩේ ගෙවත්තට ඇතුලු වෙලා එහි කෙරෙන කතා බහ ගැන කන් යොමාගෙන අහගෙන හිටියා. එතැන සොහොන් පිටියක වගේම නිහඬයි. පහන් දැල්වෙනවා. මිනිසුන් පෙනෙන්ට හිටියේ නැහැ. පසුව හොඳ හැටි බලන විට තමයි පෙනුණේ, හැම තැනම මළ මිනී සහ ලේ ගංගාවල් තිබෙන සැටි. කෝපි කඩේ අයිතිකාරයාට කතා කළා. පිළිතුරක් නැහැ. වැඩකාරයින්ට කතා කළා. පිළිතුරක් නැහැ. ඒගොල්ල මිනීමැරම් නිසා හැංගිලා ඇති. නැතිනම් කැලෑවට දුවලා වෙන්නට ඕන.

තාත්තා කොටලුවාගේ රේන්ස් පටි පුතා අතට දී ඉක්මනට කෝපි කඩයට ඇතුළු වුණා. දෙදෙනා කෑම කමින් හිටිය බංකුව ළඟට ගියා. පහතට නැමිලා

බංකුව උඩ තිබුණ සම් මලු දෙක කරේ දාගත්තා. ඒ දෙකම ලනුවකින් බැඳලයි තිබුණේ. මෙය දුටු පුතාට එවිට තමයි, කාරණය වැටහුණේ, හදිසියේ යන විට මලු දෙක බංකුව උඩ තබා ගිය බව.

එහෙත් ගෙවත්තට ආ තාත්තා ඒ ගැන වචනයක්වත් නොකියා මලු දෙක සැදෑලය දෙපසට බැඳලා කොටලුවා පිට නැංගා.

මේ දෙදෙනා බොහෝ වේලාවක් මහ මග දිගේ ගමන් කළා. දැන් දැන් කෝපි කඩේ ඉඳලා පොලීසිය ඇවිත් ඒ ගොල්ලන්ව හිර බාරයට අරගෙන නඩු දමාවි කියලා බොහොම බය වුණා. ගෙදර තියෙන අන්තිම තඹය වියදම් කරන තුරු නඩුහබ වලින් ගැළවීමට නම් කොහෙත්ම බැහැ.

උදේ හිමිදිරි පාන්දර මේ දෙදෙනා ආවා ගංගාවක් ළඟට. ගංගාව දෙපස ප්‍රණීත පඳුරු වැවිලා. මෙහිදී තාත්තා අණ කළා අශ්වයාව සහ කොටලුවාව ගහක බඳින්ට. දෙදෙනාම උදේ මුහුණ කට සෝදා ගත්තා. තාත්තා පුතාට මෙහෙම කිවුවා:

"මලු දෙකත් ඇරගෙන මා පසුපසින් එන්න."

ඒගොල්ලා පඳුරු වලින් හොඳට වැහිලා තියෙන පිටියකට ඇවිත් වාඩි වුණා. තාත්තා පුතාටත් මෙහෙම කිව්වා:

"පුතාත් වාඩි වෙන්න!"

තාත්තා නිහඬව මලු දෙකේම තිබුණ ඉතා වටිනා මුතු, මැණික් දියමන්ති, රන් කාසි මේ හැම දෙයක්ම හරි හරියට හිටින්ට බෙදුවා. ඒ ගොඩේ වෙළඳ සිටුවරයින්ගේ බැංකුවලට අයත් බැංකු නෝට්ටු පවා තිබුණා. මේ සියලු වස්තුව දෙකට බෙදලා මලු දෙකකට දැම්මා. පුතාට කතා කළා:

"මෙතැන වස්තුව හරි හරියට දෙකට බෙදලා තියෙනවා. එක කොටසක් පුතාට අයිතියි. ඕනෑම කොටසක් තෝරා ගන්න. එසේ තෝරාගන්න මල්ල අශ්වයාගේ සැදෑලයට බඳින්න. අසු පිට නැගලා අප මෙතෙක් ආපු මග දිගේ යන්න. විනාඩි පහක් යනවිට මාර්ගය දෙපැත්තට විහිදී යනවා, පුතාට පෙනේවි. පුතා වමට හැරෙන්න. ඒ පාරෙන් ගෙදරට යාම වඩාත් ළඟයි. දැන් ඉතින් පුතා ගෙදර ඉන්න ලොක්කා. හැකි තරම් හොඳට ජීවිතය ගොඩ නගා ගන්න. මා පුතාට උපදෙස් දෙන්නෙත් නැහැ, ආශිර්වාද කරන්නෙත් නැහැ. යන්න. ගමකට පැමිණෙන තුරු පස්ස හැරිලා බලන්න එපා. මා ගෙදර එන්ට බොහොම පමා වේවි. සමහර විට කවදාවත් නැවිත් ඉන්නට වුවත් සිදුවේවි. යන්න."

පුතා නිහඬව තාත්තාගේ අණ පිළිගත්තා. තාත්තාගේ දෙපාළඟ වැඳ වැටී අසු පිට නැගලා නොපෙනී යන්ට ගියා.

වෙළඳ පියා සහ පුතා ගැන කතාව දැනට අපි නවත්වමු.

මහා රජයක අගනුවර වන බොහොම පොහොසත් නගරයක ලොකු උත්සවයක් පැවැත්වීමට ඔන්න මෙන්න කියා තිබුණා. ඒ නිසා එදින එම නගරයේ මහා බලසම්පන්න රජතුමාගේ සිට ඉතාම පහත් සේවකයා දක්වා උපවාසයක් කරමින් සිටියා. එම නගරයේ සිරිත අනුව හොඳටම කළුවර වැටිලා ඇහැට ඇන්නත් පේන්නේ නැති තරම් කළුවර වුණාට පසුව තමයි, ආහර පාන ගන්ට පුළුවන්. කාහට හරි පිපාසය ඇති වුණොත් වතුරෙන් කට සෝදා ගන්න විතරක් අවසර තිබුණා. හවස කළුවර වැටුණු පසුව ඉතාම රසැති කෑම, පලතුරු වර්ග, සීනි කෑම, වයින් සහ බීම වර්ග ගත හැකියි.

ඒ වගේම ඒ රටේ බොහොම පුරාණ සිරිතක් තිබුණා. එය නම් එදා ගෙදරට දුප්පතකුව, දෙමාපියන් නැති කෙනෙකුව, තනිවම ජීවත් වෙන මහල්ලකුව, නැතිනම් එදින රාත්‍රියෙහි ලැගුම් නොගත් මගියකුට ආරාධනය කරලා ඔහුට සංග්‍රහ කිරීමයි. මේ සිරිත ඉතා පොහොසත් මාලිගාවල වාසය කරන අය මෙන්ම දුප්පත් පැල් වල වාසය කර උදවියද අනුගමනය කළා.

ඔන්න එදින හවස දේව මෙහෙයෙන් පසුව පිටතට ආපු නගරයේ ඉතාම පොහොසත් උසස් පෙළේ ප්‍රභූවරයෙක් අනිත් අයගෙන් මෙහෙම ඉල්ලීමක් කළා:

"මිතුරනි, අද මග තොට නැතිනම් කෝපි කඩ අසලදී මුණ ගැහෙන දුප්පත් මිනිසුන් අපේ ගෙදරට කැඳවා ගෙනැ එන්ටයි මම ඔබ හැමගෙන් ඉල්ලීමක් කරනවා. ඒ ගොල්ලන් දුර්වල වූ තරමට, අසරණ සහ අවාසනාවත් වූ තරමට ඔවුන්ට වඩාත් හොඳට සංග්‍රහ සත්කාර කිරීමට මම සූදානම්."

මෙහෙම කියාපු ඒ මිනිහා මහා විශාල පොහොසත් කෙනෙකි. එයාගේ තවලම් බඩුත් පටවාගෙන රට රටවල් වල යනවා. එයාගේ නැව් බොහෝ මුහුදුවල යාත්‍රා කරනවා. එයාගේ මහා මන්දිරය කිරි ගරුඬින් හදලා, මන්දිරය වටේට ඉතා ලස්සන මල් වතු සහ දිය උල්පත් තිබුණා. ඔහුගේ මහා ධනය නිසා ඔහුට විශාල ගෞරවයක් ලැබුණාක් මෙන්ම, ඔහුගේ සාධාරණත්වය, කරුණා දයාව සහ බුද්ධි මහිමය නිසා ඔහුට විශාල කීර්තියක් ලැබුණා. ඔහු හැමදාම හිගන්නන්ට පිනට දුන්නා. මිතුරන්ගේ දුකේදී සහ අවාසනාවේදී ඔවුනට නිතර උදව් කළා. ඔහුගේ උපදෙස් කොතරම් වටින්නේද යැයි කීවොත් මහා රජතුමා පවා ඔහුගෙන් උපදෙස් ලබා ගැනීමට ඉදිරිපත් වුණා.

එනිසා ඉතා ඉක්මණින් ඔහුගේ ඉල්ලීම සපුරාලීමට ඔහුගේ මිතුරෝ පොරොන්දු වුණා.

එක් මිතුරෙක් මෙහෙම පැවසුවා:

"දයාවේ උල්පත, දුප්පතුන්ගේ ආරක්සකයාණෙනි, මුතු මැණික් අගය කරන්නාණෙනි, අද හැම දෙනෙක්ම නාන ස්ථානයට යන බව ඔබ දන්නවා නොවැ. එහි ගිය මගේ සේවකයෙක් මට කී අපූරු කතාවක් ඔබට කියන්නම්.

"අපේ මේ පොහොසත් නගරයේ බොහෝ හිඟන්නන් හිටියත්, එතැනට නැමට පැමිණි මිනිහා තරම පහත් හිඟන්නෙක් කවදාවත් කිසිවෙක් දැකලා නැහැ. එයා සතුව තිබුණේ ලනු සෙරෙප්පු දෙකකුයි කිලිටි වැරහැළියි, මල්ලකුයි විතරයි.

"ඔන්න ඉතින් ඒ මිනිහා වතුර නාගෙන පිටතට ආවාම දුටුවා, කවුදෝ මිනිහෙක්. හොරකමට නැතිනම්, විහිළුවට එයාගේ මල්ලයි. ලී සෙරෙප්පු දෙකයි ගෙන ගිහිල්ලා තියෙන සැටි. ඉතිරි වෙලා තිබුණේ කිලිටි වැරහැළි විතරයි. මෙය දුටු හැම කෙනෙක්ම බොහොම කනගාටු වටත්, කෝපයටත් පත් වුණා. ඒ වුණාට අර මහල්ලා කනගාටු වුණේවත්, කෝප වුණේවත් නැතිව, එය සතුටු සිතින් විඳගත් සැටි දැකපු අර මිනිස්සු වඩාත් මවිතයට පත් වුණා. ඒ මහල්ලා දෑත් අහසට ඔසවා දෙවියන්ට එයාගේ ඉරණම නිසා කොතරම් ලස්සන වචන වලින් සහ ආවේගයෙන් පින් දුන්නේද යත්, එය අසා සිටි මිනිස්සු ඔහු වෙතින් නිහඬව ඈත් වුණා... ඒ මිනිහා ගැන ඔබතුමාට දැන්වීමට මට සිත් වුනේ, සමහර විට ඒ මහල්ලා පිස්සකු වීමට ඉඩ තිබෙන බව පිළිගනිමිනි.

එවිට මහා ලොකු පොහොසතා හිස වනලා මෙහෙම පැවසුවා:

"ඔහු පිස්සෙක් ද නැතිනම් මුනිවරයෙක් ද කියලා මට කිව නොහැකියි. ඔහුව මගේ ගෙදරට කැඳවා ගෙන එන්න. අද රාත්‍රී භෝජනයේදී ඔහු මගේ ප්‍රථම අමුත්තා ලෙස මම පිළිගන්නම්."

ඔන්න ආහර ගැනීමේ නියමිත වේලාව පැමිණියා. නගරය පුරා අලංකාර ආලෝකයන් ඇති වුණා. ලිප් මොළවා කෑම පිසීම පටන් ගත්තා. කෑම සුවඳින් මුළු නගරයම පිරිලා. මහලු හිඟන්නාව ඉතා ප්‍රසිද්ධ මහා පොහොසතා ගේ මන්දිරයට කැඳවා ගෙන ගියා. මහා පොහොසතා දොරකඩට ඇවිත් මහල්ලාව පිළිගත්තා. ගෙදර අධිපතියා ඔහුගේ අතින් ඉතා ගරු සැලකිලි ඇතිව අල්ලා ගෙන උත්සව ශාලාවට ගෙන ගියා. මහල්ලාට කෑම මේසයේ ප්‍රධාන තැන දීලා මෙහෙකරුවන් ගෙනාපු කෑම පිඟන් වලින් ඉතාම හොඳ ආහාර වර්ග ඔහුට බෙදුවා.

මහල්ලාගේ මුහුණ පුරා ඉතා කරුණාවත්, ආදරයකින් පිරිලා තිබෙන සැටි රැස් වූ අනිකුත් අමුත්තෝ දුටුවෝය. මහල්ලාගේ රිදීවන් හිසකේ සහ කරුණාබර මුහුණ දැකලා ගෙදර අධිපතියා ඔහුගෙන් මෙසේ විමසුවා:

"මගේ පියාණෙනි, ඔබගේ හිතේ ඇති ලොකු හෝ කුඩා හෝ ඉල්ලීමක් ඇත්නම් මට දන්වා සිටින්න. මට හැකි පමණින් මම එය ඉටු කරන්නම්.

මහල්ලා මඳ සිනා පාලා මෙසේ පිළිතුරු දුන්නා:

"ඔබේ සියලු පුතුන් සහ මුණුපුරන් මට පෙන්වන්න. මම ඔවුන්ට ආශිර්වාද කරන්නම්.

ගෙදර අධිපතියාගේ පුතුන් හතර දෙනා ද ඔවුන්ගේ මුණුපුරන් තුන්දෙනා ද පෙනී සිටියා. එවිට මහල්ලා ඔවුන්ගේ හිසට අත තබා ඔවුනට ආශිර්වාද කළා. ආශිර්වාද ලැබූ අය මහල්ලා ඉදිරියේ දණ නමස්කාර කළා.

ඒ පැරණි යහපත් සිරිත අවසන් වුණාම ගෙදර අධිපතියා මහල්ලාගෙන් ආශිර්වාදය ඉල්ලා සිටියා. මහල්ලා ඔහුට ආශිර්වාද කළා පමණක් නොවෙයි, ඔහු බදා වැළඳ ගෙන ඔහුව තුන් වරක්ම සිප ගත්තා.

දණ නමස්කාරයෙන් ආශිර්වාදය ලබාගත් ගෙදර අධිපතියා කැළඹීමෙන් මෙලෙස විස්තර ඇසුවා:

"පියාණෙනි, මට සමාවෙන්න. මම අහන ප්‍රශ්නය ඔබතුමා කුතුහලයට සීමා නොකරනු මැනවි. ඔබ මේ ගෙදරට පැමිණි වේලේ සිට මා ඔබගේ ඉතා කරුණාවන්ත මුහුණ දෙස බලන ගමන් මෙහෙම සිතීම මට නවත්වා ගැනීමට බැහැ. එනම් ඔබත්, මාත් ඉතා කිට්ටු අය බව මට වඩ වඩාත් හැඟෙනවා. පියාණෙනි, මීට පෙර අප දෙදෙන කොහෝ හරි හමු වී තිබෙන බවත් ඔබට මතක තිබේද? සමහර විට බොහෝ කලකට ඉස්සර."

"මගේ පුත, මම එය විස්තර කරන්නම්. එයත් සමගම මම ඔබෙන් ප්‍රශ්නයක් අසන්නම්. ඔබට මතකද කුඩා ගංගාවක් අසල පඳුරු සහිත පිටිය. රතුපාට වෙළඹ සහ කොටලුවා. උන් දෙදෙනාව ගහක බැඳලා, පියෙක් සහ පුතෙක් සමින් කළ මලු වල තිබුණු ඉතා වටිනා මුතු මැණික් සහ රන් කාසි ආදිය හරි හරියට බෙදාගත් සැටි ඔබට මතකද...?"

එවිට ගෙදර අධිපති මහා වෙළන්දා වහාම නැගිටලා පියාගේ දෙපතුළ බදාගෙන සිපගත්තා. පසුව නැගිටලා ඔහු මෙසේ පැවසුවා:

"මගේ ආදරණීය තාත්තේ, ඔබ මගේ ගෙදරට එවීම ගැන දෙවියන්ට ස්තුති වෙනවා. බලන්න මේ ඔබේ ගෙදර, මේ ඔබේ පුතා. මගේ ළමයි ඔබේ මුනුපුරාලා. අපි ඔක්කොම ඔබේ මෙහෙකරුවෝ සහ වහල්ලු.''

ඔන්න එවිට තාත්තයි පුතයි බදාගෙන සිප ගනිමින් සතුටු කඳුළු වැගුරුවා. ටික වේලාවකට පසුව සියලු දෙනාම සන්සුන් වුණාම, ගෙදර අධිපතියා ගරු සරු ඇතිව තාත්තාගෙන් මෙලෙස ඇසුවා.

"තාත්තේ ඔබ එදා උදෑසන ඔබ සතු වස්තුව හරි හරියට බෙදාලා, මට අඩක් දීලා, මට ගෙදර යන ලෙසත්, ඔබ බොහෝ කලකට පසුව ගෙදර එන බවත්, එහෙමත් නැතිනම් යළි කිසිම දාක ගෙදර නොඑන බවත් කියුවේ මන්ද?"

මහලු පියතුමා මෙසේ පිළිතුරු දුන්නාඃ

"අප දෙදෙනා වෙළෙඳ කටයුතු සඳහා ගිය හැටියේම අපට ඉතා විශාල වාසනාවක් ලැබුණා. මතකද මම නිතරම කිවුවා 'දෙවියන්ට කීර්තිය අත් වේවා!' කියලා. මා බයවුණේ ඉරණම කෝප වේවි කියලා. අපි ආපහු නැවතුම් පොළට ආවාම, අපේ මුදල් මලු එහෙමම තිබුණා. එය බංකුව උඩ තිබුණාට කිසිවෙක් එය ගත්තේ නැහැ. මෙය වාසනාවේ මුදුන් පෙත්ත බව මට හැඟුණා. ඔන්න ඉතින් ඉන් පසුව මට දිගටම අවාසනාව තියෙන්ට ඕන, ඒක සාධාරණයි. අවාසනාවත් ඉරණමේ දුර්විපාක මට ලැබෙන්ට ඉඩ හැරලා ඔබ හැමගෙන් වෙන්වීමට මා තීරණය කළේ මේ හේතුව නිසයි. විදුලිය කොටන වේලාවට විදුලිය ඇද ගන්නා ගහක් යට සැඟවෙන්නේ මෝඩයෙක් විතරයි. දැන් මම මේ දීර්ඝ කාලයක් තිස්සේ අවාසනාවත් ඉරණමට ගොදුරු වෙමින් කාලය ගත කළා. ඉතින් මා දූරදර්ශී ලෙස වැඩ කළ බව ඔබට පේනවා නොවේද?"

මේ කතාව අසාගෙන සිටි පිරිස මහල්ලාගේ දූරදර්ශී භාවයටත්, දරු පවුල කෙරෙහි ඔහුගේ ඇති ආදරයටත් ගරු කරලා, ඔහුගේ බුද්ධි මහිමය ගැන මවිතයට පත් වුණා.

එවිට එතැන රැස්වෙලා හිටිය මහලු ගරු කටයුතු කෙනෙක් මෙලෙස ප්‍රශ්න කළාඃ

"මගේ මාමාගේ සහෝදරය, ඔබේ අන්තිම දුගී මල්ල සොරකම් කිරීම ගැන ඔබ අඬා දුක් වනවා වෙනුවට ප්‍රීති සන්තෝස වුණේ මන්ද? ඔබ මගේ ප්‍රශ්නය නිසා කෝප නොවනු මැනවි. කැමති නම් පමණක් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනු මැනවි."

මහල්ලා දයාවත් මඳ සිනාවක් පාලා පිළිතුරු දුන්නාඃ

"මගේ ඉරණම මට අවාසනාව ගෙන දීම එතැනින් ඉවර වුණු බව මට තේරුම් ගියා. ඒ නිසයි. මා සතුටු වුණේ. හිඟන්නකුගේ යාචක මල්ල හොරකම් කළාට පසුව ඔහු තරම් තවත් කාලකණ්ණි අවාසනාවත් මිනිහෙක්

තවත් මේ ලොව ජීවත් වෙනවාද? මෙයටත් වඩා අවාසනාවත් ඉරණමකට මා ගොදුරු වීමට ඉඩක් නැත. එදිනම මා මගේ පුතුවත්, ඔහුගේ පුතුන් සහ මුණුපුරන්වත් හමුවූයේ නැතිද? දැන් ඉතින් අවාසනාවත් ඉරණමට ඔවුන් ගොදුරු වන්නේ නැත. ආදරයෙන්, ප්‍රීතියෙන් හා සාමයෙන් මම මගේ ඉතිරි කාලය ගත කරන්නෙමි."

රැස්වූ හැමදෙනාම එහුට හිස නමා ආචාර කොටැ මෙසේ කියුවෝය:

"කිස්මට්!"

පටුන

අලෙක්සාන්ද්‍ර පුෂ්කින්, ගසකි ඕක්, හරිත වර්ණ 5

සෙර්ගේයි අක්සාකව්. රතු මල හෙවත් පුංචි ආලෝනාගේ කුසුම 7

අන්තෝනි පගරේල්ස්කි. කළු කිකිළිය හෙවත් පාතාල ලෝකයේ මිනිස්සු 33

ව්ලදීමිර් ඔදොයෙව්සික්. දුම් කුඩු හෙප්පුවේ ඇති නගරය 66

මිහයීල් ලෙර්මන්තව්. අෂික්-කරීබ් 74

ව්ලදීමිර් දාල්. බළලා සහ හිවලිය 85

කොන්ස්තන්තීන් උෂීන්ස්කි. අන්ධ අශ්වයා 90

ලෙව් තොලස්තෝයි. නඩුකාරයා 94

ව්සෙවලද් ගාර්ෂින්. පියාඹන ගෙම්බිය 98

ද්මිත්‍රි මාමින්-සිබිර්යාක්. අළු කිරිල්ලී 105

නිකොලායි ගාරින්. කොටි දඩයක්කාරයෝ 115

අලෙක්සාන්ද්‍ර කුප්රින්. කිස්මට් 118

යෙව්ගිනි පෙර්මියාක්
පළමු මාළුවා


තෑග්ග


බරිස් පොලවොයි
සැබෑ මිනිසෙකුගේ කතාවක්
Progressive Publishing


සම්භාව්‍ය රුසියන් සාහිත්‍යය
රුසියන් කෙටි කතා


ලස්සන වසිලිස්සා
රුසියන් සුරඟනා කතා


Progressive Publishing
මක්සිම් ගෝර්කි
තෝරාගත් කෙටි කතා


Progressive Publishing
අන්ධ වාදකයා
වි. කාරලෙන්කො


පීටර් කෙනමන්
තෝරා ගත් කතා සහ ලිපි
සැම් වික්‍රමනායක
Progressive Publishing


Progressive Publishing
මැක්සිම් ගෝර්කි
අම්මා
ПРОЛЕТАРИИ ВСЕХ
СТРАН СОЕДИНЯЙТЕСЬ!


අමාරු රාජකාරිය


වැලන්තීන් කතායෙව්
හත්පෙති මල


ලෙව් තොල්ස්තෝයි
ළමා කතා


වී. සුතේයෙව්
කතන්දර හා පින්තූර


පොඩිත්තන්ට උපදේශ කවි කතා.
අයි. ඒ. ක්‍රිලෝව්
චිත්‍ර: ජී. කුප්රියානොව්
අනුවාදය: රත්නපාල දේවමිත්‍ර සේනාසිංහ


පුදුම නැව්
එස්. සහරනොව්


පින්තූර කතා


වීර කුහුඹියා


පෙරළූ නැවුම් පස

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
අංක 91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ISBN 978-955-1319-16-8
LKR 550.00
9 789551 319168